**05 පිටුව**
මං කියා සිටිනවා අලුත් කළමණාකාරිත්වය....

**06 පිටුව**
මුර සේවා ක්‍රමය හා එහි ඇති විශේෂතා

**08-09 පිටු**
අවුරුදු අතිරේකය

**10 පිටුව**
ආචාරශීලී වන්න.

**பக்கம் 11**
ஒலுவில் துறைமுக நிர்மாணிப்பு பற்றி மக்களை அறிவூட்டும் கருத்தரங்கு

**15 පිටුව**
කැරම් ක්‍රීඩාවෙන් ලොව එකළු කළ..

# තීරුව

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචි කරන ලදි.

දෙවන කණ්ඩය - 5 වන කලාපය | ඵලදායිතාවය හා මුසු වූ වරාය අධිකාරියේ මාසික පුවත් කවුළුව | 2008

# ඉරාන-ලංකා මිත්‍රත්වය වැඩි වේ

## වරාය සේවකයන්ට ඉරානයේ පුහුණු අවස්ථා




**ඉරාන තානාපතිවරයා පසුගිය දා වරාය හා ගුවන් සේවා අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා හමු වි ය.**

මෙහි දී වරාය අධිකාරියේ සේවකයන්ට ඉරානයේ උසස් අධ්‍යාපනය සහ ආයතනවල හා සරසවි වල පුහුණු අවස්ථා ලබා දීමටත්, දෙරට අතර වරාය සේවක හුවමාරු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමටත්, සාකච්ඡා වි ය.

වීරවිල හා හම්බන්තොට ගුවන්තොටුපළ අවට ප්‍රදේශ වල කෘෂි නිෂ්පාදන ආරම්භ කිරීමටත්, ඉරාන ජාතිකයන්ට ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා වැඩි අවස්ථා ලබා දීමටත් සාකච්ඡා කෙරිණි.

නැව් සංස්ථාවේ කටයුතු දියුණු කිරීම සහ නැව් ලබා දීමට ද ඉරානයේ සහාය ලබා දීමට කටයුතු කරන බව ඉරාන තානාපතිවරයා මෙහි දී පැවසී ය.

ඉරාන රජය උමා ඔය සංවර්ධන ව්‍යාපෘතියට සහ වරාය සහ නැව් සංස්ථාවේ කටයුතු වලට ලබා දෙන සහය සහ ආධාර පිළිබඳව වරාය හා ගුවන් සේවා අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා සිය විශේෂ ස්තූතිය තානාපතිවරයා වෙත පල කළේ ය.

මෙම අවස්ථාවට වරාය හා ගුවන් සේ-වා අමාත්‍යංශයේ ලේකම් තිලක් කොල්ලුරේ, අතිරේක ලේකම් (වරාය) රංජිත් සිල්වා, වරාය අධිකාරියේ උප සභාපති ප්‍රියත් බන්දු වික්‍රම, නැව් සංස්ථාවේ සභාපති එම්.එම්. හමීඩ්, අමාත්‍යංශයේ සම්බන්ධීකාරක උදය බොරලැස්ස යන මහත්වරුන් ද සහභාගී වූ හ.

## ඔලුවිල් වරාය ඉදිකිරීම සඳහා අවබෝධතා ගිවිසුම අත්සන් කෙරේ



ඔලුවිල් වරාය ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම පසුගිය දින ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දී සිදුකෙරිණි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් එහි වැඩ බලන සභාපති ප්‍රියත් බන්දු වික්‍රම මහතා හා ඩෙන්මාර්ක් ඉදිකිරීම් සමාගම වන එම්.ටී. හොගාර්ඩ් (MT HOJGARD) සමාගමේ උප සභාපති ඔලේ ස්ටීන් ක්‍රිස්ටන් (Ole Steenchristen) අතර මෙම අවබෝධතා ගිවිසුම අත්සන් තැබිණ. යුරෝ මිලියන 46.1ක වටිනාකමින් යුත් මෙම ව්‍යාපෘතිය මාස 27ක් ඇතුලත ඉදි කිරීමට නියමිත ය.

13 වන පිටුවට...

## 2008 මාර්තු මාසයේ දී කොළඹ වරායේ වාර්තාගත බහලු මෙහෙයුම් ප්‍රමාණයක්

2007 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී කොළඹ වරාය බහලු මෙහෙයුම් හි වාර්තාගත 10%ක වර්ධනයක් අත්කර ගත්තේ ය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජය බහලු පර්යන්තය සහ සී/ස එස්.ඒ.ජී.ටී. පර්යන්ත පුද්ගලික සමාගම එක්ව ගතවූ මූල්‍ය වර්ෂය තුළ පසුගිය මාර්තු මාසයේ දී කොළඹ වරාය වෙනුවෙන් ප්‍රථම වරට වාර්තාගත ලෙසින් මාසික බහලු මෙහෙයුම් ඒකක 300,000ක් ඉක්මවීමට සමත් වි ය.

නව කළමණාකාරීත්වය සිය කටයුතු ආරම්භ කිරීමෙන් පසු වරාය මෙහෙයුම් කටයුතු සඳහා අමතර නව මෙහෙයුම් උපකරණ ස්ථාපනය කිරීමත් සමග කොළඹ වරාය ට මෙම වර්තාගත බහලු මෙහෙයුම් ප්‍රමාණයන් වෙත ළඟා වීමට හැකි වීම ද විශේෂිත කරුණකි. මේ අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් එය සතු මානව සම්පතෙ හි සංවර්ධනය උදෙසා වැදගත් මෙන් ම සුවිශේෂී පියවර රැසක් ගැනීම ද වරාය ක්ෂේත්‍රයේ මෙම ඉහළ මෙහෙයුම් ප්‍රමාණයන් වෙත ප්‍රවිශ්ඨ වීමට හේතු වූ තවත් කරුණක් වෙයි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්මන් කළමණාකාරීත්වය එහි සියළු වෘත්තීය සමිති ද සමගින් වරාය හා ගුවන් සේවා ගරු අමාතය චමල් රාජපක්ෂ මැතිතුමන් ගේ විශිෂ්ට මග පෙන්වීම හා උපදේශනය යටතේ තව දුරටත් ආයතනික අභිවෘද්ධිය උදෙසා කැපවීමෙන් කටයුතු කරයි.

කලාපයේ සාමුද්‍රික ප්‍රවාහනයේ පවතින දැඩි තරගකාරී වාතාවරණයට සාර්ථකව මුහුණ දීමට සමත් විසඳුමක් වශයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ එකමුතුවෙන් වරාය මෙහෙයුම් කටයුතු තව දුරටත් පුළුල් කර තිබේ. මේ වන විට මෙම ඒකාබද්ධ උත්සාහයන් ශ්‍රී ලාංකේය වරාය ක්ෂේත්‍රයට ඉතා ධනාත්මක ප්‍රතිඵල අත්කර දීමෙ හි සමත් ව තිබේ. ඒ අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ පුද්ගලික අංශයේ එස්.ඒ.ජී.ටී. පර්යන්තය එකට එක්ව ඉතා සාර්ථක ඉදිරි ගමනක නිරතව සිටී. මෙය ඇත්ත වශයෙන් ම වර්තමානයේ දී වෙරළ තීරයෙන් පිටත ඉදිකිරීම් කටයුතු දියත් කර ඇති කොළඹ දකුණු වරාය සංවර්ධන ව්‍යපෘතියේ සාර්ථක අභිවෘද්ධිය උදෙසා ද ඉතා වැදගත් සාධකයක් වේ.

2008 මාර්තු මාසය තුළ දී දේශීය බහලු මෙහෙයුම් ද බහලු ඒකක 77,000කට අධික ප්‍රමාණයක් වශයෙන් ඉහළ ගොස් ඇත. මීට ප්‍රථමයෙන් මෙහෙයවන ලද ඉහළ ම දේශීය බහලු මෙහෙයුම් ප්‍රමාණය වූයේ බහලු ඒකක 71,900කි.

කොළඹ වරාය ඉතිහාසයේ ඉහළ ම මාසික බහලු මෙහෙයුම් ප්‍රමාණය 2008 මාර්තු මාසයේ දී වාර්තා වූ අතර, එය බහලු ඒකක 316,967කි. එය 2007 ඔක්තෝබර් මාසයේ දී ලබා ගත් එතෙක් පැවැති වැඩි ම මාසික බහලු මෙහෙයුම් ප්‍රමාණය වූ බහලු ඒකක 312,815ට සාපේක්ෂව බහලු ඒකක 4152ක වර්ධනයකි.

2008 පළමු තෙමස තුළ කොළඹ වරාය බහලු ඒකක 887,278ක් මෙහෙයුම් කිරීමට සමත් වී ඇති අතර, පසුගිය වසරේ අදාල කාල සීමාව හා සසඳන විට එය 8.5%ක වර්ධනයකි. මේ අතර ප්‍රතිඅපනයන ධාරිතාව ද 8.9%කින් ඉහල ගොස් ඇත. මේ අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා එස්.ඒ.ජී.ටී පර්යන්තය සිය ඉහළ ම බහලු ධාරිතාවයන් ද 2008 මාර්තු මාසය තුළ වාර්තා කළ හ. ඒ අනුව ශ්‍රී ලංකා වරාය

13 වන පිටුවට...

## වරායේ හෙට දවස උදෙසා වරාය අමාත්‍යවරයා වෘත්තීය සමිති හමු වේ

කොළඹ වරාය කේන්ද්‍ර කරගත් ශ්‍රී ලාංකීය වරායයන්ගේ සම්පත් කළමණාකරණය කරමින් නිෂ්පාදන ධාරිතාව ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒම අරමුණු කරගනිමින් වරායයන්ගේ කටයුතු සොයා බැලීම වෙනුවෙන් වරාය වෘත්තීය සමිති නියෝජිතයින් හා කළමණාකාරිත්වය සමග ගරු අමාත්‍යතුමන් පවත්වනු ලබන මාසික හමුව දෙවන වරටත් පසුගිය දා අමාත්‍යංශ කාර්යාලයේදී පැවැත් විණි.

මුල් සාකච්ඡා වාරයේ දී අවධානයට යොමු වූ ගැටළු වලින් 60% ක පමණ ප්‍රමාණයක් දෙවන සාකච්ඡා වරාය වනවිට විසදා තිබුණි. ජූනි මාසය වනවිට විවිධ අංශයන්හි ක්‍රියාකාරිත්වය වඩාත් ඵලදායි හා ක්‍රමවත් භාවයකට ගෙනඑන බවත් හම්බන්තොට වරාය ඉදිකිරීම තුළින් කොළඹ වරායේ මූල්‍ය තත්ත්වයට කිසිදු ගැටළුවක් ඇති නොවන බවත් මෙහිදී අවධාරණයට ලක් කෙරිණි.

වරාය අධිකාරියේ විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා විශ්‍රාමලත් රජයේ නිලධාරින්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කරන ලෙස ද ගරු අමාත්‍යතුමන්ගෙන් උපදෙස් ලැබුණි.

මෙම සාකච්ඡා ඔස්සේ සේවක ගැටළු අවශ්‍යතා හා වරාය අක්‍රමිකතා හැදිනගෙන ඒවාට විසදුම් ලබාදීමට සුදුසු පසුබිමක් උදා විය.

## තීර්ථ බිඳක්....

තීර්ථ ඔබගේ පුවත්පතයි. ඔබ සඳහාම වෙන් වූ පුවත්පතයි. ජාතියේ හදවත වූ වරාය නිතැතින්ම එහි කාර්යක්ෂම භාවයත්, ප්‍රාණයත්, සේවයේ අගය වටහා ගැනීමත්, ජාතියට විදහා දැක්වීමේ හැකියාව මත යන ඉදිරි ගමනක් ඇත. එබැවින් වරාය හා නාවික කටයුතු කෙරෙහි ජනතා ප්‍රසාදය වඩාත් හිමි විය යුතු, අගය පැවසිය යුතු ආයතනයක් බව ට පත් කිරීමේ පූර්වාදර්ශයක් වශයෙන් ක්‍රියා කිරීම ද වැදගත් වන්නේ ය.
මහ මුහුදේ කුණාටු, සුළි සුළං නැත්තේ නොවේ. රළු ගල්පර නැත්තේ ද නොවේ. නැවියා ඒ දෙස මැනවින් බලා නැව හසුරු වන්නේ ය. ජයග්‍රහණය ළඟා කර ගන්නේ ''තීර්ථ" වෙත ළඟා වීමෙනි.

දුරකතන - 2421927
3460/ 3600
ෆැක්ස් - 2451917

අලුත් අවුරුද්ද පිළිගැනීමට ලක්වැසියන් සැරසෙන්නේ අප්‍රේල් මාසය හෙවත් බක් මාසය ඇරඹුමේ දී ම ය. ගස්වැල් මලින් ඵලින් බර වන මේ වසන්තයේ මාසය වාසනාවේ සහ සශ්‍රීකත්වයේ මාසය ලෙස ද පිළිගැනේ.

අප බොහෝ දෙනා මෙම ජාතික මහෝත්සවය හඳුන්වන්නේ සිංහල හින්දු අලුත් අවුරුද්ද නමිනි. එහෙත් කාලයක් මුළුල්ලේ පැවති ව්‍යවහාරය නිසා එය සම්මතය බවට පත් වුවත් එම ව්‍යවහාරය නිවැරදි නොවන බව පැහැදිලිවම පෙනේ. එය සිංහල දමිළ අළුත් අවුරුද්ද ලෙසින් විය යුතුය. නොඑසේ නම් බෞද්ධ හින්දු අළුත් අවුරුද්ද විය යුතුය.

සූර්ය මංගල්‍යය යම් විශ්වාස පද්ධතියක් මූලික කරගෙන පවත්වන අතර එකී විශ්වාස යථාර්ථයෙන් තොර හුදු මනෝමය විශ්වාසයන් ලෙසින් බැහැර කිරීම කිසිසේත් කළ නොහැකි ය. මක්නිසාද යත් ඒ විශ්වාසයන් යටින් දිවෙන්නේ සුන්දර මිනිස් හැඟීම් සමුදායක අරුත් ගැන්වීම් වන වාසනාව සතුට සෞභාග්‍ය හා සශ්‍රීකත්වය වන හෙයිනි.

මෙතෙක් තමන් කරගෙන ආ කටයුතු සාර්ථකත්වයෙන් යුතුව ඉදිරියටත් කරගෙ-න යෑම සඳහා සුභ මොහොතින් මුල පිරීම කේන්ද්‍රීය කරගත් වැඩ ඇල්ලීමේ චාරිත්‍රයේ දී තමා සේවය කරන ආයතනයේ දියුණුව ඉත සිතින් පතා සුභ ප්‍රාර්ථනාවක් එක්කර ගනිමින් නවමු හැඟීමෙන් ඔබේ සේවය ලබා දීමට අදිටන් කර ගත යුතු ය. ආයතනයේ සහෝදර සේවක මහත්ම මහත්මීන් සමග හිත් අමනාපකම්, තරහ මරහ, නොහොඳ නෝක්කඩු පැවතියේ නම්, ඒ සියල්ල අමතක කර දමා හිත මිතුරු හුයෙන් එක්සත්ව ආයතනයේ ඵලදායිතාවය නැංවීමට කටයුතු කිරීමට බක් මාසය ඔබට ඇරයුම් කරයි. අවුරුද්දක් තිස්සේ හිසේ එකතු වූ කුණු නානු මිශ්‍ර දෙහි ඇඹුල් ගල්වා සෝදා හැර කයට දැනෙන සැහැල්ලුව හිතට දැනෙන්නට සලස්වා සිංහල අවුරුද්දෙන් පසු අළුත්ම මිනිසෙකු ලෙසින් නිරවුල්ව නිවහල්ව සේවයට පැමිණීමට සහෝදර සේවක කැල සමග කළමණාකාරීත්වය සමග වෘත්තීය සංගම් සහෘදයින් සමග මනා සබැඳියාවෙන් කටයුතු කිරීමට ඔබට හැකි නම් මේ සිංහල අවුරුද්දේ ඔබේ පැතුමන් එලෙසින් ම ඉටු වීමට එය ම හේතුවක් වනු ඇත.

යහ පැවැත්ම හා යහ පාළනය තුළින් අපගේ සේවා ස්ථානය මෙන් ම රට ද දියුණුව කරා ගමන් කරවීම ට ශක්තිය ධෛර්යය ලැබෙන, සූර්ය සංක්‍රාන්තියත් සමග උදාවන නව වසරේ නව මිනිසෙකු ලෙසින් සිතන්න ට, පතන්න ට, සිතේ පවතින සියලු සුභ සිහිනයන් සැබෑ වන අලුත් අවුරුද්දක් ඔබ ට සහ ඔබ ගේ පවුලේ සැමට උදාවේවා යන්න තීර්ථ අප සැමගේ නව අවුරුදු ප්‍රාර්ථනාවයි.



තීර්ථ

## සාමූහිකත්ව ප්‍රවේශය

**උපදේශක හා අධීක්ෂණ මණ්ඩලය**

එම්.ඩබ්.එෆ්. විමලසූරිය
නලින් අපොන්සු
උපාලි සොයිසා
නිමල් ජයතිස්ස
ඒ.බී. දයානන්ද

**නිරීක්ෂණය**
කුමාරි ජයසුන්දර
හර්ෂ උදයකාන්ත පීරිස්

**සංස්කරණය**
උපුල් ගුරුගේ

**පිටු සැකසුම**
උදිත චන්දන

**සහාය පිටු සැකසුම**
දිමුතු තෙන්නකෝන්

**පරිගනක අකුරු ඇමුණුම**
රේණුකා ආරියරත්න
සත්‍යා චතුරිකා

**තාක්ෂණික සහාය**
රුක්ෂාන් සමරධීර
අසංක රාජපක්ෂ

**ඡායාරූප**
ආලෝක අයි ද සිල්වා
ඩී.කේ. වැලිකල
මහින්ද තෙන්නකෝන්

**සම්බන්ධීකරණය**
දිල්රුක් ජයසේකර
සංජීව විජේසේකර
දේවිකා හෙට්ටිආරච්චි

සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ ප්‍රකාශයක්

# සේද මාවත 6

හර්ෂ උදයකාන්ත පීරිස්


අන්තර්ජාලය ඇසුරෙන්

මු සමුද්‍රික සේද මාවත විවර වීම වෙළඳ මාර්ගික සන්නිවේදන හා ප්‍රවාහන කටයුතු සඳහා පමණක් නොව කලාපීය සංස්කෘතිය පුනර්ජීවයට ද එකහෙලා බලපෑවේය. එහි අතුරු ප්‍රතිඵල ලෙස කිතුණු හා මුස්ලිම් ලෝකය අතර හටගත් ගැටුම්කාරී වාතාවරණ, සේද මාවත ඔස්සේ සංවර්ධනය වූ වෙළඳ කටයුතු ද විටෙක තදින්ම අඩාල කළේය. මෙසේ හටගත් ආගමික යුද ගැටුම් නිසාවෙන්, කිතුණු ලෝකය මධ්‍යම ආසියාව ආසන්නයටම ප්‍රවිශ්ට වූවත්, සලාදීන් (Saladin) ගේ නායකත්වය ගත් එක්සත් මුස්ලිම් හමුදාවන්ගේ ප්‍රහාර හමුවේ ක්‍රිස්තියානු ලබ්ධිකයින්ට ආපසු පලායාමට සිදු විය. විටින් විට මතුවෙමින්, යටපත් වෙමින් හා යළි මතුවෙමින් ද මෙම ආගමික ගැටුම් පැවති අතර පෙරදිගින් පැමිණි මොන් -ගෝලියානුවන්ගේ බල පරාක්‍රමයන් හමුවේ මුසල්මානු යුදවාදීන් අවසන පරාජයට පත් විය. යුරෝපය හා බටහිර ආසියාව මෙසේ ආගමික විභේදනයන්ගෙන් ඉරී යන අතර, එහි පැමිණි මොන්ගෝලියානුවන්ට පැවතියේ අපැහැදිලිත ම, ආගමික විශ්වාස හා ඇදහිම් රාශියකි. එහි සිට තුර්කිස්ථානු (Turkestan) ගෝත්‍රිකයින් ඉස්ලාම් දහම වැලඳ ගැනීමට පෙළඹුනු අතර, මධ්‍යම ආසියාව හරහා බොහෝ දුරක් එය පැතිර ගිය ද, එය විසල් මොන්-ගෝලියානු තෘණ බිම් ආශ්‍රිත ජනාවාස තෙක් ගමන් නොකළේය. එහි විසූ මොන්ගෝලියානු ජන පිරිස් දුනු ශිල්පයෙහි හා අසුන් හැසිරවීමෙහි කෙළ පැමිණියෝ වූහ. සිය බල අධිකාරිය තව දුරටත් ව්‍යාප්ත කරගනු වස් එක් රැස් වූ ඔවුහු 1206 දී පමණ සිය එක්සත් හමුදා සේනාංක සඳහා නව නායකයෙකු තෝරා පත්කර ගත්හ. ඔහු මහා ඛාන් (Great Khan) නම් වි ය. ඒ අනුව ගෙන්ඝිස් ඛාන් (Genghis Khan) ගේ නායකත්වයෙන් යුත් හමුදා සේනාංක ආසියාවේ විශාල ප්‍රදේශයක් යටපත් කරගනු පිණිස වහා පෙරමුණට පිටත් කර යැවිණි. ඒ අනුව සිය බටහිරාවතරණ මෙහෙයුම් හිදී මොන්ගෝලියානුවන් විසින් ටර්ෆාන් (Turfan) හි බටහිරට වන්නට පිහිටි හැන් නගරය (Han city of Jiahoe) සුනු විසුණු කර දැමිණි. මොන්ගෝලියානුවන් විසින් එසේ ඉදිකරන්නට යෙදුණු අධිරාජ්‍යය එතැන් සිට චීනයේ සිට පර්සියාව තෙක් සුවිසල් මධ්‍යම ආසියානු කලාපයක් හා එහි සිට මධ්‍යධරණීය තෙක් විහිදුණු විසල් තීරයක් පාලනය කරන්නට විය. ගෙන්ඝිස් ඛාන්ගේ ඇවෑමෙන් පසු ද ඔහුගේ අනු-ගාමික ඛාන් වරුන් යටතේ, ප්‍රධාන ශාඛා ත්‍රිත්වයකින් යුක්තව මොන්ගෝලියානු අධිරාජ්‍යය අඛණ්ඩව පැවතියේ එහි පෙරදිග කොටස තවදුරටත් මහා ඛාන් වරයාගේ අණසකට යටත්ව තබමිණි.

මොන්ගෝලියානු අධිරාජ්‍යය යටතේ, පැවති මෙම පාර්ශ්වීය එක්සත් රාජ්‍යයන් තුළ, වෙනස් කලාපයන්හි සිට සම්ප්‍රාප්තිත සංස්කෘතීන්ගේ සහජීවනයට ද ඉඩ ප්‍රස්තා සලසා තිබිණි. සේද මාවත, අධිරාජ්‍යයේ විවිධ ප්‍රදේශ වෙත ඉතා වැදගත් සන්නිවේදන මාවතක් වූ අතර ඒ හරහා තවදුරටත් වෙළඳ කටයුතු නොකඩවා සිදු කෙරිණි. මොන්ගෝලියානුවෝ මතවාද සම්බන්ධයෙන් වඩා විවෘත ප්‍රතිපත්තියක් අනුග-මනය කළ පිරිසක් වූහ. විශේෂයෙන්ම අධිරා-ජ්‍යයේ නායකයා වූ කුබිලායි ඛාන්, සර්ව ආගමික ප්‍රතිපත්තීන් කෙරෙහි වඩා දයා-නුකම්පාවකින් කටයුතු කළ අතර, විවිධ ජාතීන් හා ජන වර්ග ආසියාව හරහා සිදුකෙරුණු වෙළඳ කටයුතු වලට සම්බන්ධ වෙමින් චීනය වාසභූමි කොට වෙසෙන්නට ද පෙළඹුණහ. දහතුන් වැනි ශත වර්ෂයේ මැද භාගයේ සිට කලාපය තුළ බෞද්ධ දර්ශනයේ බලපෑම වඩාත් තදින් බලපැවැත්වෙන්නට වූ අතර ඒ අතරින් තිබ්බතයේ සිට පෝෂණය වී පැමිණි බෞද්ධාමික ප්‍රතිපත්ති කෙරෙහි බොහෝ පිරිස් නැඹුරු-වන්නට ද වූහ. යුආන් රාජවංශය පැවති කාලය පුරාවට බොහෝ කාලාන්තරයක් තිස්සේ මෙම බෞද්ධාගමික ප්‍රතිපත්තීන් යහමින් පැවති අතර ආගමික සහජීවනය කලාපය පුරා දක්නට ලැබිණි. ඒ අතර 1307 වනවිට චීනයේ බෙයිජිං හි ප්‍රථම රෝමානු කතෝලික දියෝකිසිය පිහි-ටුවනු ලැබිණි. යුදෙව්වන් හා මුස්ලිම්වරු ද මේ අතර චීනයේ ප්‍රධාන නාගරික ප්‍රදේශ රැසක වාසය කරන්නට වූහ.



ගෙන්ඝිස් ඛාන්ගේ බලකොටුවක්


ගෙන්ඝිස් ඛාන්ගේ ප්‍රථිමාව





ගෙන්ඝිස් ඛාන්ගේ සොහොන් ගැබ


ගෙන්ඝිස් ඛාන්ගේ අසිපත

මතු සම්බන්ධයි.....

## කළමණාකාරීත්ව තීරණ MANAGEMENT DECISIONS

* කාර්මික විදුහලක් පිහිටුවීම පිණිස ඔලුවිල් හි පිහිටි ශ්‍රී.ලං.ව.අ. ට අයත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ලබා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශයක් විශේෂ සාකච්ඡාවට බඳුන් වි ය. ඉදිරියේ දී ඉදි කිරීමට යෝජිත ඔලුවිල් වරාය සඳහා අවශ්‍ය මානව සම්පත් පුහුණු කිරීම් සපුරා ගැනීම සඳහා මෙම ඔලුවිල් පුහුණු මධ්‍යස්ථානය භාවිත කිරීමට ශ්‍රී.ලං.ව.අ අපේක්ෂා කරයි. මේ හේතුවෙන් මුදල් අය කිරීමේ ක්‍රමවේදයක් යටතේ අමත්‍ය මණ්ඩල සංදේශයේ ඉල්ලා ඇති පරිදි ඔලුවිල් පුහුණු මධ්‍යස්ථානය මගින් භාහිර පාර්ශවයන් උදෙසා ඇතැම් පාඨමාලා සඳහා අදාල පහසුකම් හා සම්පත් දායකයන් සැපයිය හැකි බවට අමාත්‍යවරයා වෙත දැණුම් දීමට කටයුතු යොදා තිබේ. හේ හේතුවෙන් ඔලුවිල් පුහුණු මධ්‍යස්ථානය භාහිර පාර්ශවයන් වෙත පවරා දීමට කටයුතු නොකරනු ඇත.

* විදේශ විනිමය ඉපැයුම් දිරි ගැන්වීම පිණිස ඇගළුම් හා වෙනත් අපනයන භාණ්ඩ සඳහා වන ගොඩබෑම් හා භාර දීම් ගාස්තු සංශෝධනය කිරීම පිළිබඳව සාකච්ඡා කෙරිණ. ඒ අනුව භාණ්ඩා-ගාර ලේකම් මගින් ඇගළුම් හා අනෙකුත් අපනයන තීරු ගාස්තු සහන හා වෙනත් දිරි ගැන්වීම් පිළිබඳව විශේෂ නිර්ණායකයන් ලබා ගැනීඹට නියමිත ය. එහි දී විශේෂයෙන් එවැනි සහන ලබා දෙන්නේ අන්තරායකර භාණ්ඩ, රීෆර් කාර්ගෝ හා මත්පැන් අපනයන ඇතුළු අනෙකුත් සාමාන්‍ය භාණ්ඩ වලින් බැහැරව ඇගළුම් හා අපනයන නිෂ්පාදන සඳහා පමණක් ද යන වග පිළිබඳ විශේෂ නිර්ණායකයන් ලබා ගැනීමට ද අපේක්ෂිත ය.

## අනුවේදනීය කථාවක්

අද දවසේ බෝම්බයක් පුපුරණ එක රතිඤ්ඤයක් පිපිරෙන තරමට සාමාන්‍යකරණය වෙලා.. ඒත් දෙයියනේ... ඔය හැම බෝම්බයකින් ම නැති නාස්ති වෙන්නෙ මිනිස් ජීවිත නේද...?

බොහෝ දෙනෙකුට අද ඒ කාරණාවත් අමතක වෙලා.. මේ සටහන ලියන්නේ මනුස්සකම හඳුනන සැබෑ මිනිසුන් පිරිසක් වෙත තුති මල් පුදකිරීමට බව පළමුවෙන්ම කියන්න ඕනෑ.

එදා දවස ගැන කියනවා නම් හරියටම නුගේගොඩ හන්දියේ රෙදි සාප්පුවක් අසල බෝම්බයක් පුපුරපු දවස. ජයබහලු පර්යන්තයේ ගැන්ට්‍රි දොඹකර නඩත්තු ඉංජිනේරු අංශයේ වසර 15 කට වඩා සේවා කාලයක ඉඳන් කටයුතු කරන සේ.අ. 34099 චිත්‍රලාල් පෙරේරා මහතාගේ දයාබර බිරිඳ හා දියණිය නුගේගොඩ හන්දියට ආවේ අත්‍යවශ්‍ය බඩු කිහිපයකුයි දියණියට ඇඳුම් දෙක තුනකයි මිලදි ගන්න. ඒත්, ඔවුන්ට රෙදි තෝරන්න වේලාවක් ලැබුනේ නැහැ. නොසිතු නොපැතු මොහොතක නුගේගොඩ හන්දියේ සුප්‍රසිද්ධ රෙදි සාප්පුවේ බෝම්බය පුපුරා ගියේ ඔවුන්ගේ ජීවිත ජීවිතයත් මරණයත් අතර ද්වන්ධ සටනක මැදට අතහැර දමමින්.

චිත්‍රලාල් මහතාගේ බිරිඳ තුනටියේ ඇට බිඳීම හා සුසුම්නාවේ ආබාධ නිසා තුනටියෙන් පහළ පණ නොමැතිව ජීවිතේ බලාපොරොත්තු බිඳුනු තත්වයට පත් වුණා. සැත්කම් වලින් පසු වෛද්‍ය උපදෙස් මත කළයුතු ප්‍රතිකාර සඳහා රාගම පුනරුත්ථාපන රෝහලට ඇයව පිටත්කරේ කොහොම හරි සහනයක් ලබාගෙන ආයෙමත් ජීවිතය ගොඩ නගන්නට හැකිවේවි කියන පුංචි බලාපොරොත්තුව හිත් ඉමේ තියාගෙන. දියණිය සති තුනක් පමණ දැඩි සත්කාර ඒකකයේ සිට කොළඹ මහ රෝහලේ බණ්ඩාරනායක වාට්ටුවට අවතීරණ වූයේ කොහොමහරි ජීවිතයට මුහුණ දෙනවා යන හැඟීමෙන්. ඒත් දෙපයින් නැගී හිටපු ජීවිත කඩා වැටුනම මුහුණ පාන්නට වන දුක් ගැහැට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැනේ. **මෙන්න මේ වටපිටාව මැද අපේ මිත්‍රයා චිත්‍රලාල් පෙරේරා සහෘදයා දැඩි මානසික හා ආර්ථික පීඩනයකට පත් වුණා. එහෙත් ගැන්ට්‍රි දොඹකර නඩත්තු ඉංජිනේරු අංශයේ කල්‍යාණ මිත්‍ර සම්පත්තිය චිත්‍රලාල් පෙරේරා මහතාට යෝධ හයියක්, යෝධ ශක්තියක් වුනා. ඔහුගේ රෝගී බිරිඳ හා දියණිය වෙනුවෙන් අවශ්‍ය බෙහෙත් උපකරණ, ඇතුළු අවශ්‍ය සෑම දෙයක්ම සපයා දෙමින් සහෝදර සේවක මහතෙකු විපතට පත් වූ මොහොතක එක්සත් ව එක්සිත් ව කටයුතු කල ආකාරයට 'තීර්ථ හක්ති පූර්වක තුතිමල් මෙසේ පුදකර සිටියි.**

සේවා අංක 34099 ජී.එස්. චිත්‍රලාල් පෙරේරා මහතාගේ දියණිය හා බිරිඳ වෙනුවෙන් ප්‍රතිකාර කිරීම සඳහා දායක්තවය සැපයූ අංශ විදුලි අංශය, හිනෝ නඩත්තු අංශය, ප්‍රයිමුවර් ක්‍රියාකරු අංශය I - II - A මුරය, ප්‍රයිමුවර් ක්‍රියාකරු අංශය I - II - B මුරය, ගැ/දො/ ක්‍රියාකරු අංශය I - II , අඩු එසවුම් යන්ත්‍ර නඩත්තු අංශය, ගැන්ට්‍රි දොඹකර නඩත්තු ඉංජිනේරු අංශය.

# නිවැරදි තීරණ තුළින් ඉදිරියට ගිය කෙනෙක්

මිලියන ගණනක් වටිනාකමකින් යුත් ග්‍රැන්ට්‍රියක සේවාව මිළ කළ නොහැක. එමෙන් ම මෙහි වටිනාකම වරාය සේවකයෙකුට විග්‍රහ කිරීම ට යෑම ද විහිළුවකි.

2007.09.03 දින සිදුවීමට ගිය අවාසනාවන්ත සිද්ධියක් තනි සේවකයෙකුගේ නිවැරදි තීරණය ක්‍රියාකාරීත්වය පළපුරුද්ද හා නිර්භීතභාවය තුළින් වලකා ගැනීමට හැකි වි ය.

සැබැවින් ම එය වරායේ පමණක් නොව මුළු ලක්වැසි සැමගේ වාසනාවකි. අප ට එම වාසනාව උරුම කර දුන්නේ ජය බහළු විදුලි 3-4 අංශයේ සේවා අංක 52397 දරණ විදුලි කාර්මික ඩී.ජී.ආර්.එස්. කුමාර මහතායි. ඔහුට උපහාර පිණිස මෙම ලිපිය ඔබ වෙත ඉදිරිපත් කරමි.

ඉහත දින රාත්‍රී 8.40 ට පමණ අංක 10 ග්‍රැන්ට්‍රි දොඹකරයේ යන්ත්‍රාගාරයේ ක්‍රියාකාරීත්වයේ වෙනසක් ඇති බව ක්‍රියාකරු යූ.ඒ. චිත්‍රසේන මහතා මගින් පහළ අංගනයේ සිටි ඩී.ජී.ආර්.එස්. කුමාර ට දැන ගන්නට ලැබිණි. එය යන්ත්‍රාගාරයේ ගින්නක් බව අවබෝධ කරගත් කුමාර විදුලි විසන්ධි වීමක් සිදුවීමට පෙර ඉහළට නැග ගත යුතු බව අවබෝධ කර ගෙන විදුලි සෝපාන මගින් අඩි 110ක් පමණ ඉහළින් ඇති යන්ත්‍රාගාරයට පිවිසීමට කටයුතු කරන ලදී. විදුලි සෝපානය ඉහළට එසවෙන කාල පරාසය තුළ වරාය ගිනි නිවන ඒකකය ට හා තම ඉහළ නිළධාරීන් දැනුවත් කළ කුමාර කළ යුතු දේ පිළිබඳව දළ සැලැස්මක් තම සිතෙ හි සනිටුහන් කර ගන්නා ලදී.

දුමින් පිරී ගිය යන්ත්‍රාගාරය දුටු කුමාර මොහොතකට ගල් ගැසුණි. එම අවස්ථාව සිහිපත් කළ කුමාර අපට පැවසුවේ එම මොහොතේ තම සිතට බියක් දැණුන නමුත් තමාගේ ප්‍රමාදය මහා විපතක ට ආරම්භය වීමට ඉඩ දිය නොහැකි බැවින් එම අවස්ථාවට මුහුණ දුන් බව ය.

ප්‍රථමයෙන් විදුලිය විසන්ධි කළ කුමාර, ඝන අන්ධකාරය හා පිරීගිය දුම්ගුලි තුළින් යන්ත්‍රාග ාරයට පිවිසියේ ඉහළට ගත් හුස්ම පොද පහත හෙළීමට පෙර කළ යුතු දේ පිළිබඳව නිවැරදි අවබෝධයෙනි. අන්ධකාරය තුළින් ගිනි නිවන උපකරණය තම දැතට ගත් කුමාර නිවැරදි ස්ථ ානයට එය එල්ල කරමින් ඊළඟ හුස්ම පොද ගැනීමට යන්ත්‍රාගාරයෙන් එළියට පිවිසියේ වරාය ඉතිහාසය තුළ තවත් නිහඬ වීරයෙක් ලෙසිනි.

තම යුතුකම් කොටස ඉටු කර දිගු හුස්මක් ගත් කුමාරට දක්නට ලැබුණේ ක්ෂණිකව ග්‍රැන්ට්‍රිය ඉහළට නගින නිළධාරීන්, සේවක මහතුන් හා පහළ නවතා ඇති වරාය ගිනි නිවන රථ හා පිරිස ය.

අපගේ කතා වීරයා පිලිබඳ අප නොකී දෙයක් ඇත. එනම් ඝනාන්ධකාරය දැඩි සුළඟ මධ්‍යෙ-ය් දුම් පිරුණු යන්ත්‍රාගාරයේ ගින්න මැඩ පැවැත්වීමට ඉදිරිපත් වූ ඔහු දරුණු හදවත් සැත්කමකට භාජනය වී ඇති සේවක මහතෙකු වීම යි.

අපට ඔහු ගැන පැවසිය හැක්කේ එක් දෙයකි. ඔහු රට ට වරාය ට ණය නොවූ සේවකයෙකි. එබැවින් අපි ඔහුට ණය ගැති වි ය යුතු ය.

**ජී. සිරිසේන**

# ඵලදායිතා සම්මානය සහ පසු විපරම

සේවා සැපයුම් කොට්ඨාශය 2006 ජාතික ඵලදායිතා සම්මාන තරගාවලියේ දී බස්නාහිර පළාත්, මහා පරිමාන සේවා අංශයෙන් තරග කොට විශිෂ්ඨ කුසලතා සම්මානය දිනාගැනීම පිළිබඳ සාඩම්බර පුවත අනිකුත් කොට්ඨාශ වෙත ගලා ගියා ද යන්න සැක සහිත ය. මේ ලිපියෙන් අදහස් කරන්නේ ඒ පිළිබඳ අඩුපාඩුව තරමක් හෝ සපුරාලීමයි.

ප්‍රධාන මාර්ගයේ සිට සේවා සැපයුම් කොට්ඨාශයට ඇතුල් විය යුත්තේ ප්‍රතාපවත් කළු පාට ගේට්ටුවකිනි. දිවා රෑ මනා සේ ක්‍රියාත්මක වන ආරක්ෂක ජාලයක් යටතේ මෙම පිවිසුම ක්‍රියාත්මක වේ. මෙම පිවිසුමෙන් ඇතුල්වූ විගස දිස්වන්නේ විශාල ප්‍රමාණයේ පුවරුවකි. මෙම විශාල පුවරුවේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය දකුණු ආසියාවේ වරායයන් අතුරින් ඉදිරියට පැමිණ ඇති ආකාරයත්, ලබා ඇති තාක්ෂණික දියුණුවත් ඒ දෙස බලන ඕනෑම අයෙකුට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිළිබඳව ගෞරවයක් දැනේ.

ඉදිරියට ඔබට හමුවන 'ඔබ ඇතුල් වන්නෙ-න් දුම් නොබන කාලාපයකටයි' යන පුවරුව කෙසේ වෙතත් මෙම ප්‍රදේශයේ ස්ථාපිත කරන ලද මනා පරිසරය නිසා දුම් බීමට තබා ඒ ගැන සිතන්නේ ද යන්න පවා සැක සහිත ය. ඊළඟට සේවා සැපයුම් කොට්ඨාශ-යේ සැලැස්ම ප්‍රදර්ශනය කර ඇත. අලුතින් ඇතුල්වන පුද්ගලයන්ට මෙම පුවරුවෙන් තමන් යායුතු ස්ථානය මැනවින් හඳුනා-ගැන-මට පුළුවන. එබැවින් යම් පුද්ගලයෙකුට බාධාවකින් තොරව තමන්ගේ කටයුතු ඉතා පහසුවෙන් ඉටු කර ගැනීමට මාර්ගය සලසා ඇත.

දකුණු පසින් ඇති පැරණි බන්ධිත ගුදම පෞරාණිකත්වය ආරක්ෂා වන පරිදි අලුත්වැඩියා කර තීන්ත ආලේප කර ඇත. මෙය අපගේ ඓතිහාසික පෞඪත්වයේ කැඩපතක් වැනි ය. වම් පසින් ක්‍රමාණුකූලව ස්ථාපිත කරන ලද වාහන අංගනය දක්නට ඇත. මෙම අංගනය මගින් වරාය සේවකයන්ගේ මෙන් ම වරාය භාවිත කරන පුද්ගලයන්ගේ වාහන ගාල් කිරීමට අවස්ථාව සලසා ඇත. ආරක්ෂක අංශ මගින් මෙම අංගනයට ආරක්ෂාව සලසා ඇත.

සේවා සැපයුම් කොට්ඨාශයට දිනකට විශාල යතුරු පැදි සංඛ්‍යාවක් පැමිණෙන බැවින් එම යතුරු පැදි ගාල් කිරීම සඳහා ද මෙම අංගනය සැලසුම් කර ඇත. අංගනය දෙපස විසිතුරු පැළෑටි සහ මල් ගස් වලින් පරිසරයේ නැවුම් බවක් ඇති කරන අතර මල් වත්තක අසිරිය මවා පායි. මෙම අංගනයේ පිරිසිදුකම ඉහළින් ම රැක ගෙන ඇත.


මින් පසු අපට හමුවන්නේ සේවා සැපයුම් කොට්ඨාශයේ ප්‍රධාන ගොඩනැගිල්ලයි. අලංකාර ලෙස නිමවා ඇති නාම පුවරුවකින් සමන්විත ව ඇති මෙම පැරණි ගොඩනැ-ගිල්ල නවීන අංගෝපාංගයන්ගෙන් සමන්විත ය. මනා ලෙස වායුසමනය කර ඇති මෙම ගොඩනැගිල්ල වචනයේ පරිසමාප්ත අර්ථ යෙන් ම සේවා සැපයුම සඳහා ම සකස් කර ඇති බව ක්‍රියාවෙන් ඔප්පු කර පෙන්වයි. මෙහි ඇති සියලු ම කාර්යාල වල නාම පුවරුවක් සවි කර ඇත. අවශ්‍ය කාර්යාලය සොයා ගැනීම සඳහා අංක යොදා ඊතල මගින් පෙන්වා ඇත. සියලුම සේවක සේවිකාවෝ තමන්ගේ රාජකාරියේ යෙදී සිටින අතර, නිකරුනේ කාලය ගත කරන හෝ ඇවිදින කෙනෙක් සොයා ගැනීමට නැති තරම් ය.

ඉහළ මාලයේ බාරදීම් අංශය ස්ථාපිත කර ඇති අතර නවීන පරිගණක ජාලයක් මගින් නිශ්කාෂණ කටයුතු සිදු කෙරේ. බාර දීම් අංශයට අනුයුක්තව බිල්පත් සැකසීම් අංශය, ශ්‍රී ලංකා රේගුව, මහජන බැංකුව ආදී නිශ්කාෂණ ක්‍රියාවලිය ට දායක වන සියලු අංශයන් එක ගොඩනැගිල්ලක් තුළ ක්‍රියාත්මක වන බැවින් නිශ්කාෂණ ක්‍රියාවලිය වේගවත් වන අතර, වංචනික ක්‍රියා අවම වී ඇත. සේවා සැපයුම් කොට්ඨාශයට රාජකාරි කටයුතු සඳහා පැමිණෙන ප්‍රේෂණලාභීන් සඳහා ද පහසුකම් සලසා ඇත. පානය සඳහා උණු හා සිසිල් ජලය සඳහා ජලය සපයන පෙරණ සවිකර ඇත. වාප්පු ලිපිකරු මහතුන්ගේ පහසුව සලසනු වස් ගොඩනැගිල්ල තුළ වෙන ම ඉඩකඩ වෙන් කොට ඉඳ ගැනීම සඳහා ආසන ද පනවා ඇත.

මෙම සේවා සැපයුම් ගොඩනැගිල්ලේ පිරිසිදු භාවය ඉතා ඉහලින් රැකගෙන ඇත. ඉවතලන කඩදාසි බහාලීම පිණිස වෙන ම භාජන ස්ථානගතකර ඇත. වැසිකිලි හා කැසිකිලි කාර්යාල හා අවට පරිසරය පිරිසිදු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහාය ලබාගෙන ඇත. එහෙයින් මෙම ගොඩනැ-ගිල්ල සහ අවට පරිසරය ඉතා අලංකාර දර්ශනයකි.

පෙ.ව. 8.30 ට වාදනය වන ජාතික ගීය හේතු කොට ගෙන සේවකයින් ප්‍රබෝධයට පත්වන බැවින් රාජකාරියේ කාර්යක්ෂතාවය ද ඉහළ මට්ටමකට පැමිණෙනවා ඇත. ආයතනය තුළ දක්නට ලැබෙන මනා කළමණාකාරීත්වය සහ සේවක මහත්ම මහත්මීන්ගේ කාර්යක්ෂමතාව ය මෙම ඵලදායිතා සම්මානය ලබා ගැනීමට ඉවහල් වී ඇත.

**ආර්.ඒ. සරත්**
සේවා සැපයුම් කොට්ඨාශය



කොළඹ නැව්තොට කොළොම් පුරයෙ හි ප්‍රධාන නැව් තොටක් බවට පත් වන්නට වූයේ 10 වන සියවසේ මැද භාගයේ දී හා පළමුවන පරාක්‍රමභාහු (ක්‍රි.ව. 1153-1186) රජ සමයේ දී ය. නිකාය සංග්‍රහය නම් පැරණි පොතෙ හි සඳහන් පරිදි 14 වන සියවසෙ හි මැද භාගයේ දී යාපනය පාලනය කළ ආර්ය චක්‍රවර්තී නම් පාලකයා යටතෙ හි කොළඹ, වත්තල, මීගමුව හා හලාවත කඳවුරු පිහිටුවා තිබිණි. ඉන්දියාව හා යේමනය සමඟ වෙළඳ කටයුතු සඳහා මෙම පාලකයා සතුව සියයකට ආසන්න කුඩා හා විශාල නැව් සංඛ්‍යාවක් තිබුණු බව ඉබන් බතූතා ගේ සංචාරක සටහන් වල සඳහන් වන අතර, ආර්ය චක්‍රවර්තීගේ උපකාරයෙන් ශ්‍රී පාද කන්ද නැගීමට ඔහුට හැකියවක් ලැබුණු බව ද ඉබන් බතූතා වැඩි දුරටත් වාර්තා කර ඇත.

කොළඹ නැව් තොට මුල් කර ගෙන අරාබි ජාතිකයන් කරගෙන ආ වෙළඳම දියුණු වන්න ට වූ නිසාම යාපනය පාළනය කළ ආර්ය චක්‍රවර්තීන් කොළොම්තොට අල්ලා ගැනීමට ප්‍රහාරයක් එල්ල කළේ ය. මෙහි දී රයිගම් රාජධානියේ ප්‍රධානියා වූ වීර අලකේෂ්වර කොළඹ අවට වූ ආර්ය චක්‍රවර්තී ගේ බලකොටු විනාශ කර දැමී ය. කොළඹ හා යාපනය අතර වූ පළමු ගැටුම ලෙස ඉතිහාසයේ සඳහන් වේ.

ඉන්දියාවේ පිහිටි ගෝවේ සිට නැව් නවයක් (09) එහි පාළකයාගේ පුත්‍රයා වූ පෘතුගීසි ජාතික ලොරෙන්සෝ ද අල්මේදා ගේ නායකත්වයෙන් 1505 දී කොළඹ නැව් තොට ට ළඟ වි ය. ඔවුන්ගේ මුල් අරමුණ වූයේ රතු මුහුද වෙත ගමන් කරන මුස්ලිම් ජාතිකයන් ට අයත් කුළු බඩු රැගත් නැව් කණ්ඩායම යටත් කර ගැනීම ය. ඇති වූ චණ්ඩ මාරුතය නිසා පළමුව ගාල්ල ටත් පසුව කොළොම් තොටටත් නැව් කණ්ඩායම මෙහෙයවනු ලැබිණ. එවි ට ද කොළොම්පුරයෙ හි මුස්ලිම් ජනාවාසයක් පැවැතිණ. ඔවුන්ගේ මෙහි පැමිණීම පෘතුගීසි ලාංඡනය සහිතව ගල් කුළක සනිටුහන් කළ මෙම පිරිස (මෙය සභාපති කාර්යාලය අසල සථාපිත කර ඇත) කෝට්ටේ රජතුමාගේ අවසරය මත කොළඹ නැව්තොට අසල වෙළඳ ගබඩාවක් හා දේව මන්දිරයක් තනා ගන්නා ලදී. ශාන්ත ලෝරන්ස් තුඩුව නමින් එම ප්‍රදේශය නම් කළ පෘතුගීසීන් ක්‍රමයෙන් තම බලකොටුව ද එම ස්ථානයේ ම පිහිටුවා ගත් හ.

1658 වර්ෂයේ දී පැමිණි ඕලන්ද ජාතිකයන් විසින් ලක්දිව මුහුදු බඩ තීරය පාලනය කළ පෘතුගීසීන් පළවා හැර කොළඹ නගරය හා වරාය තම අතට පත් කර ගත්තේ ලංකාවේ අපනයන වෙළඳම තම යටතට ගැනීමට ය. පෘතුගීසීන් හා ඕලන්ද ජාතිකයන්ට අනතුරුව බලවත් වූ යුරෝපා ජාතීන් වූයේ ප්‍රංශ ජාතිකයන් ය. ඔවුන් ද පළමුව ත්‍රිකුණාමලය වරාය අල්ලා ගෙන මුළු රට ම යටත් කර ගැනීමට තැත් කළේ ද අපනයන වෙළඳම ඔවුන්ගේ යටතට ගැනීමට බව නොරහසකි.

වර්ෂ 1796 දී ඕලන්ද ජාතිකයින් හා ප්‍රංශ ජාතිකයින් ලක් පොළවෙන් පලවාහැරි බ්‍රිතාන්‍ය ජාතිකයෝ වර්ෂ 1815 දී අප මුළු දිවයින ම තම රාජ්‍යය යටතට ගනු ලැබූ හ. කොළඹ නැව් තොට ද ඒ අනුව බ්‍රිතාන්‍ය රජයට නතු වි ය.

## සිවුළුව

# වරායේ ආරක්ෂාවට මුල්තැන

වරායේ ආරක්ෂාව පිළිබඳව ගෙන ඇති පියවර මොනවා ද? දනට ක්‍රියාත්මක වන ආරක්ෂක වැඩපිළිවෙළ පිළිබඳව සෑහීමකට පත්වන්නේ දැයි ජාතික පුවත්පතක මාධ්‍යවේදියෙක් වරාය හා ගුවන් සේවා අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාගෙන් විමසී ය.

වරාය කියන්නේ රටක හදවත. හදවත ආරක්ෂා කර ගැනීමේ වගකීම සියළු දෙනාට ම පැවරෙනවා. එය වරාය අධිකාරියේ ආරක්ෂක අංශයට හෝ නාවික හමුදාවට පමණක් පැවරෙන වගකීමක් නෙවෙයි. එය වරාය ආරක්ෂක අංශය මෙන් ම නාවික හමුදාවේ නිළධාරීන්ගේ රාජකාරියක් වුවත් එය අප සියළු දෙනාගේ ම වගකීමක්.

මේ වගකීම අප හැම දෙනා ම ඉටු කළ යුතුයි. අපේ වගකීම අපි ඉටු කරනවානම් ආරක්ෂාව පිළිබඳව හැම දෙනාට ම සෑහීමකට පත් වන්න පුළුවන්. වරාය ආරක්ෂාවනවා කියන්නේ - තමන්ගේ රැකියාව ආරක්ෂාවනවා කියන එක. තමන්ගේ අනාගතය සුරක්ෂිත වනවා කියන එක. වරායේ සාමාන්‍ය සේවකයාගේ සිට ප්‍රධාන නිළධාරීන් දක්වා සෑම අයෙක් ම ඒ වගකීම ඉටුකරනවා නම් ආරක්ෂාව පිළිබඳව අප සියළු දෙනාට ම ආරක්ෂාව පිළිබඳව සෑහීමකට පත්විය හැකියි.

ඇමතිතුමාගේ මේ පැහැදිලි කිරීම මාධ්‍යවේදියා බලාපොරොත්තු වූ පිළිතුර නෙවෙයි. වරාය අධිකාරියේ ආරක්ෂාවට කොපමණ ප්‍රමාණයක් යොදවා තිබෙනවා ද, ආරක්ෂක විධි විධාන පිළිබඳ විස්තර ලබා ගැනීම මාධ්‍යවේදියාගේ අපේක්ෂාව වුණා.

ඇමතිතුමාගේ පිළිතුර මාධ්‍යවේදියා බලාපොරොත්තු නොවුන එකක් වුණත්, එම පිළිතුරින් මාධ්‍යවේදියාට තම ලිපිය නව ප්‍රවේශයකට යොමු කරන්නට හැකිවීම ගැන සතුටක් තිබුණා.

ආරක්ෂාව පිළිබඳව කතා කරන විට පසුගිය කාලයේ පුද්ගලික බස් රථ වලත්, ඇතැම් සාප්පු වලත් සිදුවූ බෝම්බ පිපිරීම් බොහෝමයක් අපේ වගකීම් ඉටු නොකිරී ම හෝ නොසලකා හැරී ම නිසා සිදුවූ ඒවා බවත්, අපේ වගකීම් හරියට ඉටු කළා නම් හුග ාක් විනාශකාරී සිදුවීම් වලක්වා ගැනීම කළ හැකි බව පැහැදිලියි.

අපි හැමෝගෙම වගකීම පැය අටේ සේවාවට පමණක් සීමා නොවන බවයි ඇමතිතුමා පෙන්වා දුන්නේ. බස් එකේ, දුම්රියේ යන එන විටත්, කඩ පළට රෝහලට යන විටත් අවධානයෙන්, අවදියෙන්, සෝදිසියෙන් ඉන්න එක අපි හැමෝගේ ම වගකීමක්. ඒකෙන් අපේ ආරක්ෂාව ශක්තිමත් වනවා.

වරායේ ආරක්ෂාව ගැන ඇමතිතුමා මතක් කළ විදියට වරායේ සේවකයන් විදියට අපි අපේ වගකීම ආරක්ෂා කරනවා ද කියන කාරණය අපි අපෙන් ම අහමු.

එල්ටීටීඊ ත්‍රස්තවාදය ට විරුද්ධව රජය ගෙන යන මෙහෙයුම් ඉතා ම සාර්ථක වෙලා තියෙන මොහොතක, රටේ ආර්ථික මර්මස්-ථ ාන විනාශ කරන්නට විවිධ සැලසුම් සකස් කරනවා. ඒ සැළසුම් ක්‍රියාත්මක කරන්න විවිධ උපක්‍රම යොදා ගන්නවා. දැනුවත් ව හෝ නොදැනුවත් ව අපේ ම ඇතැම් අය මේ උපක්‍රම වලට අහු වෙනවා. ආරක්ෂක අංශ වල ඉතා ම සුළු පිරිසකුත් සාමාන්‍ය වැසියන් මෙන් ම විවිධ තනතුරු දරන අයත් කොටි උපක්‍රම වලට අහු වෙනවා. එහෙම අහු වෙලා බොහොම දරුණු පාවා දීම් කරනවා.

වරායේ ආරක්ෂාව තියන්නේ සම්පූර්ණයෙන් ම එහි සේවකයන්ගේ අතේ. ගරු ඇමතිතුමා විශ්වාස කරන්නේ වරායේ සෑම සේවකයෙක් ම වරායට ආදරෙයි. ඒවාගේ ම තමන්ගේ රට ට ආදරෙයි කියලයි.

තමන්ගේ රස්සාවට, දෙමව්පියන්ට, අඹු දරුවන්ට ආදරයක් තියෙන අය රස්සාව කරන තැනට ආදරෙයි. ඒ නිසා අපි හැමෝ ම හැම මොහොතක ම අවදියෙන් සිටිය යුතු වෙනවා.

මේ මාධ්‍යවේදියා ආරක්ෂාව පිළිබඳව මතු කරපු කරුණාවට අදාලව තවත් පැත්තක් චමල් රාජපක්ෂ ඇමතිතුමා පැහැදිලි කළා.

වරාය එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගෙන් ආරක්ෂා කර ගන්න එක තමයි අපේ ප්‍රධාන වගකීම. ඒවාගේ ම වරාය දියුණු කරන්න ට බාධාවක් තියෙනවා නම් ඒවාත් හඳුනාගෙන අපේ ප්‍රධාන සතුරන් විදියට සලකලා කටයුතු කළ යුතුයි. මේ හැම සතුරෙක් ම පරාජය කරන්න පුළුවන්. ඔවුන්ගේ උපක්‍රම හඳුනා ගන්න පුළුවන් වෙන්නේ වරායේ සෑම සේවකයෙක් ම තමන්ගේ ආයතනය ආරක්ෂා කරගන්න කටයුතු කළොත් පමණයි.

**කුමාරදාස ගිරිබාව**
ගරු අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්

# සුඛෝපභෝගී 'ඇස්ටෝරියා' මගී නෞකාව කොළඹ වරායට



විදෙස් සංචාරක මගී පිරිසක් රැගත් සුඛෝපභෝගී 'ඇස්ටෝරියා' නෞකාව පසුගිය දා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මගී පර්යන්තයට සම්ප්‍රාප්ත වි ය. විශේෂයෙන් ම, සුඛෝපභෝගී මගී නෞකා සඳහා අවැසි පහසුකම් සලසමින්, දේශීය සංචාරක ව්‍යාපාරයේ අභිවෘද්ධිය පිණිස ද විසල් කාර්ය භාරයක් කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු හැකියාව මෙවැනි සුඛෝපභෝගී මගී නෞකා සිය ගමනාන්තර වරායක් ලෙස කොළඹ වරාය තෝරා ගැනීම තුළින් තහවුරු කර ඇත.

වරාය හා ගුවන් සේවා ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමන්-ගේ අධීක්ෂණයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ දියත් කර ඇති සංවර්ධන වැඩපිළිවෙළ හා ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සලසා දීමේ කාර්යක්ෂම පියවර හමුවේ ඉදිරියේ දී, සුවිසල් බහලු නෞකා සඳහා පමණක් නොව සුපිරි මගී නෞකා සඳහා ද වැඩි දියුණු කළ සේවා හා පහසුකම් ඉදිකෙරෙනු ඇත. මෙමගින්, සුපිරි හා සුඛෝපභෝගී මගී ප්‍රවාහන නෞකා වැඩි වශයෙන් කොළඹ වරාය වෙත ආකර්ෂණය කර ගැනීමේ වැඩි ඉඩ ප්‍රස්ථා උදාවන අතර, ශ්‍රී ලංකාව තුළ සංචාරක ක්ෂේත්‍රයේ උන්නතිය පිණිස එය ප්‍රබල පිටුවහලක් ද වනු ඇත.

## තොටමුණ

ඔබේ කොට්ඨාශයේ, අංශයේ ඔබ විසින් සංවිධානය කරනු ලබන ක්‍රියාකරකම් හෝ ප්‍රජා සත්කාරයන් පිළිබඳව අපට ලියන්න. 'තොටමුණ' ඒ සඳහා වෙන් වූ පිටුවයි. ඔබේ ප්‍රවෘත්තිය සඳහා ඉඩක් වෙන් කිරීමට අප නිරතුරුව සූදානම්.

සංස්කාරක
තීර්ථ
සන්නිවේදන හා මහජන
සම්බන්ධතා කොට්ඨාශය
කැනල් අංගනය
දුරකථනය: 3460

# වරාය අධිකාරියේ ප්‍රවාහන අංශයෙන් ලේ දන් දීමේ පුණ්‍ය ක්‍රියාවක්





උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින රණ විරුවන් උදෙසා ලේ දන්දීමේ පුණ්‍ය කටයුත්තක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රවාහන අංශයේ සංවිධායකත්වයෙන් පසුගිය දා ප්‍රවාහන අංශ පරිශ්‍රයේ දී පැවැත්විණි.

මේ අවස්ථාවට සහභාගී වූ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපති ප්‍රියත් බන්දු වික්‍රම මහතා සභාව අමතමින්, ප්‍රවාහන අංශයේ සේවක මහතුන් විසින් සංවිධානය කළ මෙම කටයුත්ත සමස්ථ වරාය අධිකාරියේ ම ආකල්පමය වෙනසක් ඇති කිරීමට හේතුවක් බවත්, සෑම සේවක මහත්ම මහත්මියක විසින් ම ස්වකීය රාජකාරියේ ස්වභාවය හැඳින ගෙන ආයතනය වෙත මනා කැපවීමකින්, කාර්යක්ෂමව, කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කරන්නේ නම් සමුද්‍රික කලාපයේ අභියෝග ඉලක්ක ජය ගැනීමට හැකි වන බවත් පැවසී ය.

ප්‍රවාහන අංශයේ ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරී එස්.එම්.කේ ඉඳුරුගොල්ල, පරිපාලක ප්‍රසන්න විතානගේ මහත්වරුන්ගේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ රියදුරු සංගමය විසින් සංවිධානය කළ මෙම ලේ දන්දීමේ අවස්ථාවට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ ප්‍රසන්න කළුතරගේ, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශ සම්බන්ධීකරණ ලේකම් උපාලි විජේසිංහ යන මහත්වරුන් මෙන් ම, වරාය අධිකාරියේ විවිධ කොට්ඨාශයන් හි සේවක මහත්ම මහත්මීන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූ හ.

# ටග් යාත්‍රා අංශය ගරු අමාත්‍යතුමාගේ විශේෂ නිරීක්ෂණයට ලක් වේ



ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවා කටයුතු පිළිබඳව වරාය හා ගුවන් සේවා ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගිය දා විශේෂ නිරීක්ෂණ චාරිකාවක් සිදු කෙරිණ.

ටග් යාත්‍රා අංශය විශේෂ නිරීක්ෂණයට බඳුන් කෙරුණු මෙම චාරිකාවේ දී එම අංශ-යේ ක්‍රියාකාරීත්වය පිළිබඳව හා අවශ්‍ය සේවා පහසුකම් සම්බන්ධව එහි සේවක මහතුන් සමග ගරු අමාත්‍යතුමා සාකච්ඡා පැවැත්වී ය. ඉන් අනතුරුව වරාය මුළුතැන්ගෙය ද ඇමතිතුමාගේ නිරීක්ෂණයට ලක් වි ය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ එක් එක් අංශ ප්‍රවර්ධනය තුළින් සමස්ථ වරාය අධිකාරියේ ප්‍රවර්ධනය උදෙසා ගරු අමාත්‍යතුමන් විසින් දියත් කර ඇති විශේෂ වැඩපිළිවෙළ යටතේ මෙම හදිසි නිරීක්ෂණ චාරිකාව සිදු කරන ලදී.

මෙම විශේෂ නිරීක්ෂණ චාරිකාවට වරාය අධිකාරියේ උප සභාපති ප්‍රියත් බන්දු වික්‍රම, අධ්‍යක්ෂ ප්‍රසන්න කළුතරගේ, හාබර් මාස්ටර් කපිතාන් රවි ජයවික්‍රම, වරාය හා ගුවන්සේවා අමාත්‍යාංශයේ උදය බොරලැස්ස මහතා ඇතුළු පිරිසක් සහභාගී වූ හ.

# ඔලුවිල් වරාය ඉදිකිරීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට සම්මන්ත්‍රණ මාලාවක්





1994 වසරේ සිට කතා බහට පමණක් සීමාවෙමින් පැවැති ඔලුවිල් වරාය ඉදිකිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සියළු කටයුතු සූදානම් කර ඇත. ඒ පිළිබඳ ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමේ විශේෂ සම්මන්ත්‍රණ මාලාවක්ඉකුත් මස ඔලුවිල් ප්‍රදේශයේ පාසල් සිසුන් ඉලක්ක කර ගනිමින් පැවැත්විණි.

විශේෂයෙන් ම වරාය හා ගුවන් සේවා ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රදේශවාසී ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව පූර්ව දැනුමක් ලබා දීමේ අරමුණින් මෙම සම්මන්ත්‍රණ මාලාව සකස් කෙරිණි.

සමුද්‍රිය කලාපයේ තරගකාරීත්වය හා උරෙනුර ගැටී කටයුතු කිරීමට සමගාමීව මේ වසර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ප්‍රාදේශීය වරායයන් සංවර්ධනය කිරීම ට ද කළමණාකාරීත්වය පියවර ගෙන ඇත.

තව ද කලාපයේ සේවා නියුක්ති හා සේවා වියුක්ති පරතරය වෙනස් කළ හැකි තීරකයක් ලෙස 2010 වන විට සෘජු හා වක්‍ර ලෙසින් රැකියා අවස්ථා 1000ක් පමණ හා 2015 වන විට රැකියා අවස්ථා 10000ක් පමණ බිහි වේ. වරාය ආශ්‍රිතව සිමෙන්ති, පොහොර, සීනි ආදී කර්මාන්තයන් ඔලුවිල් ප්‍රදේශයට හඳුන්වාදීම, ප්‍රදේශයේ ධීවර කර්මාන්තයට නව ජීවයක් සැලසීම, සම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම් ව්‍යාප්ත කිරීම තුළින් ප්‍රදේශයේ වී ගොවිතැන, කිරි නිෂ්පාදනය ඇතුළු දේශීය නිෂ්පාදනයන් ට ඉහළ වෙළඳපලක් ලබා ගැනීම ආදී වාසි රැසක් ඔලුවිල් වරාය ඇරඹීමත් සමඟ ප්‍රදේශවාසීන්ට අත් වේ.

අදියර දෙකකින් සමන්විත ඔලුවිල් වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර තුළ මීටර් 475ක හා මීටර් 740ක දිගින් යුත් දියකඩනය ඉදිකිරීම, හෙක්ටයාර 16ක වපසරියකින් යුත් ජලතටාකයක් ඉදිකිරීම, වාණිජ වරාය ක්‍රියාකාරකම් හා ධීවර කටයුතු සඳහා හෙක්ටයාර 10ක ජල ප්‍රදේශයක් යොදා ගැනීම. ටොන් 5000ක් බරැති නෞකාවන් හසුරුවාලීමට හැකිවන පරිදි මීටර් 8ක ගැඹුරකින් ජල තටාකය ඉදිකිරීම, ධීවර පහසුකම් සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය, ධීවර යාත්‍රා වෙත අවශ්‍ය ජලය, ඉන්ධන ආදිය සම්පාදනය කිරීමට අපේක්ෂිත අතර, දෙවන අදියර තුළ ටොන් 16000ක බරකින් යුත් නෞකාවන් හසුරුවාලීමට හැකිවන පරිදි තටාකයේ ගැඹුර මීටර් 11 දක්වා වර්ධනය කිරීම නෞකා තටාකය,හෙක්ටයාර 24 දක්වා පුළුල් කිරීමට අපේක්ෂිත ය.

නින්දවූර් අල් අෂ්රක් ජාතික පාසල, අඩ්ඩාලච්චේනෙයි මධ්‍ය මහා විදුහල, සමන්තුරෙයි මුස්ලිම් මධ්‍ය මහා විදුහල, සයින්තමරුදු වෙළඳ සංගමය කේන්ද්‍රස්ථව මෙම සම්මන්ත්‍රණ මාලාව පැවැත්විණි.

ඔලුවිල් වරාය ඉදිකිරීමේ වැදගත්කම පිළිබඳ මෙම සම්මන්ත්‍රණ මාලාවට ඔලුවිල් වරාය ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ ඉංජිනේරු ඒ.එල්. මොහොමඩ් නවුෆර්, ව්‍යාපෘති නිලධාරී එම්.එම්. නගූර් තම්ලි, පුහුණු නිළධාරී එම්.වී. තාහිර්, සමන්තුරේ මුස්ලිම් මධ්‍ය මහා විදුහලේ විදුහල්පති එම්.එම්. ෆාරුක් මහතා ඇතුළු විද්වතුන් රැසක් සම්පත් දායකත්වය සැපයූ හ.

# මං කියා සිටිනවා අලුත් කළමණාකාරීත්වය යටතේ දූෂණ බෙහෝ ම අවම මට්ටමක පවතින බව....

**ප්‍රධාන අභ්‍යන්තර විගණක - එල්. ප්‍රේමසිරි ද සිල්වා (ඒ.සී.ඒ.)**



ශ්‍රී ලංකාවරලත්ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වූ ද, වසර පහළොවකට වඩා රජයේ හා පෞද්ගලික ක්ෂේත්‍රයේ ආනයන අපනයන, ඇඟළුම්, කලා, ඉංජිනේරු හා මූල්‍ය සමාගම් වල මුදල් කළමණාකරුවෙකු හා වරලත් ගණකාධිකරණ කථිකාචාර්යවරයෙකු ලෙසින් කටයුතු කළ ඔහු අද දවසේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙසින් කටයුතු කරයි. මේ ප්‍රේමසිරි ද සිල්වා නම් වූ ඔහු සමඟ කළ සංවාදයකි.

**රජයේ විගණන අංශයත් සමග කොහොමද අභ්‍යන්තර විගණන කොට්ඨාශය සම්බන්ධ වෙන්නේ..?**

අභ්‍යන්තර විගණන අංශය කියන්නේ සෑම ආයතනයක ම මූල්‍ය කටයුතු පරීක්ෂා කිරීමට වර්ෂය පුරාම රැඳී සිටින ස්ථානයක් හැටියට හඳුන්වන්න පුළුවන්. වර්ෂ අවසාන විගණනයක් වශයෙන් හා තෝරාගත් සාම්පල විගණනයක් වශයෙන් සිදුවෙන්නේ බාහිර විගණනයයි. පෞද්ගලික අංශයේදී Audit firm ලෙසින් ද රජයේ ආයතන වලදී රජයේ විගනන අංශය ද මැදිහත් වෙනවා.

රජයේ විගනන අංශය විසින් රජයේ සෑම දෙපාර්තමේන්තුවක්ම සංස්ථාවක් ම අධිකාරියක්ම ආවරණය වන පරිදි ඔවුන්ගේ අංශ පිහිටුවා තිබෙනවා. මෙම විගනනය වග කියන්නේ පාර්ලිමේන්තුවටයි. නමුත් අභ්‍යන්තර විගනන අංශය වග කියන්නේ සභාපතිතුමා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලයටයි.

රජය විසින් මුදල් යොදවා වෙළඳ ව්‍යාපාර ආරම්භ කළ අධිකාරියන් ගේ මූල්‍ය කටයුතු නිසි අයුරින් සිදුවෙනවා ද යන්න රජය විසින් පාර්ලිමේන්තුවට සනාථ කර ගන්නේ බාහිර විගණනය ඔස්සේයි. ඒ වගේ ම කළමණාකරණයට අවශ්‍ය තොරතුරු සම්පාදන කටයුතු වලට ඉවහල් වන්නේ අභ්‍යන්තර විගණන අංශයයි. අපි වගකියන්නේ සභාපතිතුමා ප්‍රමුඛ කළමණාකාරිත්වයටයි. අපි වැටුප් ලබන්නේ අයතනය මගින්. නමුත් රජයේ විගණන දෙපාර්තමේන්තුව රජයේ අයවැය මගින් වෙන්කරන ලද මුදලින් පරිපාලනය වෙලා වැටුප් ලබනවා. අභ්‍යන්තර හා රජයේ විගණන අංශ ක්‍රියාකාරිත්වය වෙනස් වෙන්නේ පැවරී ඇති වගකීම් සම්භාරය මතයි. දෙපක්ෂයටම පරීක්ෂා කිරිමට, කටයුතු කිරීමට තිබෙන රාජකාරි කටයුතු එකවගේමයි.

**වරායේ විගණන කටයුතු කිරීමේදී පවතින අභියෝග/ ගැටළු පිළිබඳ කථා කළොත්...**

රජයේ විගණනය හරිම නිදහස්.. ඒ අය විගණනයට ලක් කරන ආයතනයෙන් වැටුප් ලබන්නේ නැහැ. ඒ වගේ ම ඔවුන් එම ආයතනයේ සේවක සේවිකාවනුත් නොවේ. මේ නිසා ඔවුන්ට බලපෑම් කිරීමට අපහසුයි. නමුත් අභ්‍යන්තර විගණකයා කියන්නේ වෙන කවුරුත් නොවෙයි. ඔබේ ම අපේ ම සේවකයෙක්. එතකොට මොකද වෙන්නේ. මේ කොට්ඨාශයේ අද වැඩ කරන අය හෙට තවත් කොට්ඨාශයක සේවය කරනවා. එතකොට අපිට මොකද සිද්ධ වෙන්නේ. මෙහිදී සේවකයෙක් ලෙසින් තවත් සේවකයකු දෙස විගණක ඇසින් බැලීමේදී ඔහුට නිදහසේ ක්‍රියාකිරීමේ නිදහස යම් ප්‍රමාණයකට සීමා වෙන බව මං විශ්වාස කරනවා.

**බොහෝ සේවක පිරිස් දරණ අදහසක් තමයි විගණන අංශයේ ප්‍රධාන කාර්යභාරය සේවකයන් සේවයේ යෙදෙනවාද එසේත් නැතිනම් රාජකාරියෙන් බැහැර වී ඇද්ද යන්න සොයා බැලීම පමණක් බව... කුමක්ද මෙහි සත්‍යතාවය...?**

බොහෝ දෙනෙක් පටලවා ගත්තු දෙයක් තියෙනවා. මම එය පැහැදිලිව කියන්නම්. අපේ විගණන අංශය කොටස් 8 කට බෙදා තිබෙනවා. ඒ කොටස් 8 න් හතකටම අංශ ප්‍රධානීන් පවා පත් කරලා තියෙනවා. හැබැයි මෙම අංශ ප්‍රධානීන් පත්කර ඇති කොටස් විසින් ආදායම් විගණනය, වියදම් විගණනය වැටුප් අතිකාල, අවසාන ගිණුම් යනාදි වශයෙන් ප්‍රභේද කර තිබෙනවා.

නමුත් ඔය කියන පිරිස් විගණනය යැයි දන්නා අංශයට අංශ ප්‍රධානියෙක් වත් නැහැ. එය අනෙක් අංශ 7න් තාවකාලිකව දිනපතා එකතු කර ගන්නා සේවක කණ්ඩායමක් යොදලා දිනපතා කරන කාර්යයක් පමණයි. එසේනම් අඩුම තරමින් අංශ ප්‍රධානියෙක් වත් නැති මගේ කුඩා ම අංශය ගැන පමණයි සේවකයන් කතා කරන්නේ. සේවකයන් දන සිටින්නේ. එය විගණන කොට්ඨාශයේ ප්‍රධාන කාර්යයක් නොවෙයි. එය අප කරන්නේ වරායේ සුභ සිද්ධිය සඳහා. අනෙක් කාරණය තමයි සභාපතිතුමා යටතේ පවත්නා කොට්ඨාශයක් නිසා එම කාර්ය ඇති කරලා, එය අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර තිබෙනවා. එම කටයුත්ත අපේ කොට්ඨාශයෙන් හෝ ආරක්ෂක කොට්ඨාශයෙන් හෝ එසේත් නොමැති නම් ඒ ඒ කොට්ඨාශවලින් ම කිරීමටත් පිලිවන්. එය අභ්‍යන්තර විගණන කොට්ඨාශයෙන් ම කළ යුතු නැහැ. **එම ක්‍රියාව අභ්‍යන්තර විගණන කොට්ඨාශය විසින් අනෙකුත් කොට්ඨාශ වල සහාය සඳහා කරණු ලබන්නක්.** හේතුව මුදල් කොට්ඨාශය විසින් ගණකාධිකාරීවරුන්ගෙන් පවත්වාගෙන යන ලිපි ලේඛන සහ වාර්තා නැවත පරීක්ෂාවට බඳුන් කළ හැක්කේ තවත් ගණකාධිකාරිවරයකුට පමණයි. එසේනම් ගණකාධිකාරිවරුන්ගෙන් ම කොටසක් අභ්‍යන්තර විගණන අංශයට බඳවාගෙන ඒ පිරිස් කරන දේ ඒ අයගේම සහෝදර නිලධාරින් ලවා පරීක්ෂා කිරීම තමයි අපි මෙහිදී සිදු කරන්නේ. වෙනත් අයවලුන් යොදාගෙන මෙම කටයුත්ත සිදු කිරීමට අපහසුයි. කරන වැරදි සොයන්න පුළුවන් ඒ ලෙසින් පමණයි.

**විගණන කොට්ටාශයේ සේවක මහතෙක් විසින් යම් අක්‍රමිකතාවයක් සිදු කළොත් එතැනදී කෙසේද ඔහු විගණන ක්‍රියාවලියට ලක්වෙන්නේ...?**

එතැන දී වෙන්නේ මෙන්න මෙහෙම දෙයක්. වරායේ සෙසු සේවක මහතෙකු සම්බන්ධයෙන් අපි පැය භාගයක කාල සීමාවක් මානුෂික ලෙස ලබා දී තිබෙනවා. නමුත් අක්‍රමිකතාවය සිදුකර ඇත්තේ අපේ ම අංශයේ අයෙකු නම් ඔහු වෙනුවෙන් අපි විනාඩියක්වත් ගත කරන්නේ නෑ. රාජකාරිය අකුරට ම ඉටු කරනවා. වැරදි හොයන්න ඉන්න කෙනා වැරදි කළොත් අපි එවෙලේ ම දඩුවම් දෙනවා. පසුගිය කාලෙ අපි එහෙම කරලා තිබෙනවා. මොකද ඒ වගේ අයට අර වගේ සමාවක් දෙන්න බැහැ. විගණකයා යනු මුර බල්ලෙක් මිස දඩයම් බල්ලෙක් නෙවෙයි. මුර බල්ලෙක් තම ස්වාමියා අවදි කොට අනතුරු වලක්වා ගන්නවා.

**වරායේ හෙට දවස ගැන විගණන ඇසකින් බැලුවොත් මොකද හිතෙන්නේ....**

ඔබ පුද්ගලයෙක් ලෙසින් අසනීප අවස්ථාවක දී රෝහලකට යනවා. එතකොට වෛද්‍යවරයා විසින් ඔබට විවිධ වෛද්‍ය උපදෙස් රැසක් ලබාදෙනවා. ආයතනය පුද්ගලයකු ලෙසින් ගත්කල ආයතනය විෂයේද යම් යම් රෝගී තත්වයන් ඇතිවීමට පිළිවන්. පුද්ගලයකු ලෙසින් වෛද්‍යවරයකු උපදෙස් දුන් කල ඔබ කෝප නොවෙතත් විගණන කොට්ඨාශය ලෙසින් ආයතනය නම් ඒකකයට රෝගාබාධයක් පෙන්වා දුන් කළ කේන්තියාමට පුලුවන්.

ආයතනය වැඩිපුර ණය ලබා ගන්නේ නම් ණයගැතියන්ගේ අයිතිවාසිකම් වැඩිවෙනවා. ආයතනය තුළ හොරකම් වංචා දූෂණ අක්‍රමිකතා වැඩි වන්නේ නම් ආයතනයක් ලෙසින් අප ලබා ගන්නා ලාභය අපෙන් ගිලිහී කාලයක දී සමස්ත ආයතනයම දැඩි අපහසුතාවයකට ලක්වන්නට පිලිවන්. ආයතනයක අභ්‍යන්තර විගණන කොට්ඨාශය කියන්නේ හරියට ආයතනයේ වෛද්‍යවරයා වාගෙයි කියන්නේ ඒ නිසයි.

**අද සේවකයන් බහුතරයක් අතිකාල රාජකාරියට රපෝර්තු කර සේවා ස්ථානයෙන් බැහැරව යනවා. කුමක්ද මේ සඳහා යොදා ඇති පිළියම්...**

විටින් විට පරීක්ෂා කිරීමේ කටයුතු කිරීම අපි සිදු කරනවා. පරිපාලකවරුන්ගෙන්, පරිපාලන නිලධාරින්ගෙන් අපි ඉල්ලා සිටිනවා මේ කටයුත්තට උපරිම දායකත්වය ලබා දෙන්න කියා. මොකද මේ කටයුත්ත අපට තනිවම කිරීම අපහසුයි. මේ විදියට හැමදෙනාම සහයෝගයෙන් නීතිගරුකව ස්වයං විනයක් පවත්වාගෙන කටයුතු කරනවා නම් අපේ කටයුතු නිසි ලෙසින් ඉෂ්ඨ සිද්ධ කරගන්න පුලුවන්. එතකොට රජයේ විගණකට අතපොවන්න තිබෙන ඉඩකඩ අඩුයි. අපි විසින් ම අපේ ගැටළු විසදා ගනිමු. එතකොට අපේ ගැටළු විසදා ලීමට පිටස්තර පාර්ශවයක් අවශ්‍ය වෙන්නේ නැහැ. එවිට අපිට කෝප් (COPE) එක ගැන අනිසි බියක් ඇති කර ගත යුතු නැහැ.

**මේ වනවිට වරායේ සංවර්ධන ව්‍යාපෘති රැසක් ආරම්භ වෙලා.. ඒ සමගින් වංචා දූෂණයට පැවති ඉඩකඩ වැඩි වී ඇති බව ට චෝදනා තිබෙනවා...**

මෙතැන ඇත්තටම වෙලා තියෙන්නේ අතීතයේ සිදු වූ සිදුවීම් ගොන්නක් තවමත් නිරවුල් නොවී පැවතීම. මේ ගොඩට අළුතෙන් තව එකක් එකතු වෙන්න පුලුවන්. එතකොට වෙන්නේ අපි හැමදාම ගොඩාක් ලෙසින් දකිනවා. මං කියා සිටිනවා වරායේ අලුත් කළමණාකරීත්වය යටතේ දූෂණ අව ම මට්ටමක පවතින බව. ඒත් සේවක මහත්ම මහත්මීන් තුළ මුල් බැසගත් මතවාදයක් දුරු කිරීම ඉතාමත් අපහසුයි. ඔවුන් තවමත් සිතා සිටින්නේ අතීතයේ ලෙසින්ම එම අක්‍රමිකතා සිදුවන බවටයි.





ආයතනය වැඩිපුර ණය ලබා ගන්නේ නම් ණයගැතියන්ගේ අයිතිවාසිකම් වැඩිවෙනවා. ආයතනය තුළ හොරකම් වංචා දූෂණ අක්‍රමිකතා වැඩි වන්නේ නම් ආයතනයක් ලෙසින් අප ලබා ගන්නා ලාභය අපෙන් ගිලිහී කාලයක දී සමස්ත ආයතනයම දැඩි අපහසුතාවයකට ලක්වන්නට පිලිවන්

**සංවාද සටහන - උපුල් ගුරුගේ**

### වරාය ආරක්ෂාවට සතුරු නොවීමට නම්

පසුගිය දා පාර්ලිමේන්තුවේ විශාල ආන්දෝලනයකට තුඩු දුන් සිද්ධියක් වූයේ වරාය ආරක්ෂාවට බල්ලන් හතර දෙනෙක් අධික මිලකට ලබා ගැනීමට යන බවයි. මේ පිලිබඳව සමහර වෘත්තීය සංගම් පවා නොයෙකුත් ප්‍රශ්න නැගූ අතර මේ පිළිබඳව සේවකයින් තුළ ද විශාල කුකුසක් ඇතිව තිබේ. එහි මිල ගණන් හෝ ටෙන්ඩරය හෝ යන කාරණා පසෙක තැබූ කළ පුහුණු සුනඛයින් ගේ සහාය වරාය ආරක්ෂාව වෙනුවෙන් යොදා ගැනීම ඉතාමත් ම කාලෝචිත ක්‍රියාවකැයි අපට තේරෙන ආරක්ෂාව අනුව සිතා ගත හැක.

එසේ වුව ද වරාය අභ්‍යන්තර ආරක්ෂක වැඩපිළිවෙළ පිළිබඳව නිරන්තරව නැගෙන චෝදනා පිළිබඳව දැනට උද්ගතව ඇති කතිකාව යටපත් කළ නොහැකි තරමට ම වේදිකාවට පිවිස තිබී ම, වරායේ හෙට දවසේ ආරක්ෂාව සැලසුම් කිරීමේ දී වැදගත් වනු ඇත.

ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් දීමට තරම් ආරක්ෂක විශේෂඥයෙකු නොවූව ද, සිවිල් යුද්ධයක් පවතින රටක සක්‍රිය පුරවැසියෙකු ලෙස නිරන්තරව ලැබෙන අත්දැකීම් සමග යම් අදහසක්, යෝජනාවක් ඉදිරිපත් කිරීම කාලෝචිත යැයි සිතේ.

වරාය ආරක්ෂා කරන්නෝ ශ්‍රී ලංකා නාවික හමුදාව ද එසේත් නැති නම් වරාය ආරක්ෂක අංශය දැයි බාහිරින් පැමිණෙන පුද්ගලයෙකුට අවබෝධ නොවීමට තරම් ම වරාය ප්‍රවේශයන් හමුදාකරණය වී තිබීම ම වාණිජ මධ්‍යස්ථානයක තිබිය යුතු පෙනුමට බාධාකාරී ය.

වරාය සේවකයින් වශයෙන් රට තුළ හා වරාය තුළ ශ්‍රී ලංකා නාවික හමුදාවේ වීරෝධාර රණවිරුවන් විසින් කරන කාර්ය භාරය උසස් කොට සලකන අතර, වරාය තුළ ක්‍රියාත්මක ආරක්ෂක සැලැස්ම පිළිබඳව නැවතත් සිතිය යුතු යැයි වරාය හා වරාය පරිහරණය කරන්නන්ගේ අදහසයි.

වරාය යනු වාණිජ ආයතනයකි. කොළඹ වරාය එම තත්ත්වය ද ඉක්මවා ජාත්‍යන්තර වාණිජ මධ්‍යස්ථානයක් බවට ද පත්ව තිබේ. එසේ වුව ද නාවික හමුදා ආරක්ෂක සැලසුම් තුළ වාණිජ අරමුණු සඳහා සිදුවන බාධාවන් මග හරවා ගැනීමට සුදුසු ප්‍රති උපායයන් නොතිබීම වරාය සමස්ථ කටයුතු චක්‍රයේ පැවැත්මට බාධා ඇති කරමින් සිටී. උදාහරණයක් ලෙස වරාය ප්‍රවාහන වෘත්තිකයන්ගේ සංගමය පෙන්වා දෙන පීඩාකාරී (සමහර) පරීක්ෂාවන් ද අතලොස්සක් සාමාජිකයන්ගේ 'මුදලට පමණයි' න්‍යාය ද බරපතල තත්ත්වයක් සේ සැලකිය යුතු ය.

වරාය අභ්‍යන්තර භූමිය පවා සැලසුමකින් තොරව හට කාණ්ඩ ස්ථානගත වී ම ද (වරායට අනුව) කොළඹ වරාය හමුදා කඳවුරක ස්වභාවයට පත් කිරීමට මුල් වී තිබේ. අභ්‍යන්තර සේවකයින් ද, බාහිරෙන් පැමිණෙන්නන් ද දැඩි භීතියකට පත් වන ලෙස ගිනි අවි අමෝරාගත් යුධ භටයන් වරාය තුළ ඔබමොබ සැරිසැරීමේ දර්ශන ය වරාය වෙනුවෙන් විශාල අහිතකර තත්ත්වයක් ඇති කිරීමට දක්වන සමත්කම අවතක්සේරු කළ නොහැක.

ලෝකයේ දියුණු වරායයන් සතු ආරක්ෂක උපක්‍රම අප හඳුන්වාදිය යුත්තේ මෙවන් වටපිටාවක ය. ආරක්ෂාවට බල්ලන් යොදා ගැනීම, ආරක්ෂාව බල්ල ට යැමක් නොවන්නේ එවිට ය. එනිසා ම වරාය පාලනය කිරීම නොව වරාය පවත්වාගෙන යාමට සහාය වීම පිණිස ආරක්ෂක සැලසුම් සකස් කිරීම නාවික හමුදාවෙන් වරාය සේවකයා ඉතා වුවමනාවෙන් බලාපොරොත්තු වේ. වරාය ත්‍රස්තවාදීන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා උත්සුක වන්නේ මහා විනාශයක් වලක්වා ගැනීමටයි. එහෙත් අපගේ ම දුර්වලතා නිසා මහා විනාශයක දී තක්සේරු වන අලාභයන්ට සමාන අලාභයක් ඇති වන්නේ නම් සාපේක්ෂ වශයෙන් අපි පරාජිත වන්නෙමු. අද දවසේ අවශ්‍යතාව ය එම පරාජය වලක්වා ගැනීම හැර එකිනෙකාට ඇඟිල්ල දිගු කිරීම නොවේ.



**ප්‍රසන්න කළුතරගේ**
**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

# මුරසේවා ක්‍රමය හා එහි ඇති විශේෂතා

මුරසේවා ක්‍රමය නැතහොත් සේවා මුර ක්‍රමය ආයතන වල කටයුතු කාර්යක්ෂමව හා නිසි පරිදි ඉටුකර ගැනීම සඳහා කළමණාකාරීත්වය විසින් සේවකයන් සේවයේ යොදවා ගනු ලබන ක්‍රියාවලියක් ලෙස හඳුන්වා දිය හැක. ආයතනයක සේවකයන් ඵලදායී ලෙස සේවයේ යොදවා ගනු ලබන්නේ කෙසේද යන්න තීරණය කරනු ලබන්නේ කළමණාකාර පක්ෂය විසිනි. ඔවුන් ආයතනයේ ඇති කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකර ගැනීමේ ක්‍රමෝපායයන් සැලසුම් කිරීම සිදුකරනු ලබන අතර එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා කොපමණ සේවක සංඛ්‍යාවක් කවර ආකාරයෙන් සේවයේ යොදවා ගත යුතුද යන්න තීරණය කරනු ලබයි. එම තීරණයන්ට එළඹෙනු ලබන්නේ ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යයන් වල ස්වභාවය හා සේවාවන් සැපයිය යුතු ප්‍රමාණය යනාදිය ගැන පරීක්ෂා කොට බැලීමෙන් පසුවය. එසේ කරුණු මනාව පරීක්ෂා කිරීම, වැඩ අධ්‍යයනය කිරීමේ වැදගත් අංගයක් ලෙස කළමණාකාරන ක්‍රියාවලියේදී හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විධිමත් සේවාමුර ක්‍රමයක් ඇති කළ යුතු බවට පසුගිය කාලයේ දී වරාය අධිකාරියේ කටයුතු පිළිබඳව විමර්ෂණය කරන ලද ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ වාර්තාවෙන් පෙන්වා දී ඇත. එසේම පසුගිය වැටුප් වැඩි කිරීමත් සමගම පත්කරන ලද කමිටුවට වරාය අධිකාරියේ විධිමත් සේවා මුර ක්‍රමයක් ඇති කිරීම සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීමට ද දන්වා ඇත. මෙනයින් සලකා බැලීමේදී වරාය අධිකාරිය තුළ විධිමත් කාර්යක්ෂම හා ඵලදායී සේවා මුර ක්‍රම ඉක්මනින් ඇති කළ යුතු බවට පොදු පිළිගැනීමක් ඇති වී තිබෙන බැව් පෙනී යයි.

### විවිධ සේවා මුර ක්‍රම

බොහෝ ආයතනවල විවිධ ක්‍රමයේ සේවා මුර ක්‍රම පවත්වා ගෙන යනු ලබන බව ඒවා ගැන පරීක්ෂා කිරීමේදී පැහැදිලිවේ. දිනකට ඇති පැය 24ක කාලයෙන් එක් සේවා මුරයක් සඳහා පැය 08ක කාලයක් යොදා ගැනීම බහුලව දකින්නට ඇති ක්‍රමයකි. එවැනි එක් සේවා මුරයක් ඇති ආයතන වල සේවකයෙකු පැය 09ක කාලයක් සේවයේ රැඳී සිටිය යුතුය. මින් පැය 08ක කාලයක් සේවය සඳහා ද ඉතිරි පැයක කාලය ආහාර හා විවේකය සඳහා ද වෙන් වී ඇත. මෙවැනි සේවා ක්‍රමයන් බහුල වශයෙන් කාර්යාල සේවයේ යෙදෙන්නන් සඳහා යොදා ගනු ලබයි.

දෙමුර සේවා ක්‍රමයේදී දිනක කාලය වන පැය 24 දෙකකට බෙදා සේවාවන් ලබා ගැනීම සිදුවේ. මෙම ක්‍රමය යටතේ සේවකයෙක් පැය 12ක සේවා මුරයක් සේවයේ යෙදිය යුතුය. මෙය දිවා මුරය හා රාත්‍රී මුරය වශයෙන් හඳුන්වා ඇත. වරාය අධිකාරියේ ද මෙම දෙමුර සේවා ක්‍රමය ආරම්භයේ සිටම පවත්වා ගෙන යනු ලබන බැව් පෙනේ. අඛණ්ඩව සේවාවන් සැපයිය යුතු ආයතනයක් වශයෙන් වරාය අධිකාරියේ මෙවැනි සේවාමුර ක්‍රම පවත්වා ගැනීම සිදුකළ යුතු වේ.

මේ හැරුණු විට තවත් සමහර ආයතන වල තෙමුර සේවා ක්‍රමය පවත්වා ගෙන යනු ලබයි. දවසේ පැය 24ක කාලය පැය 08 මුර තුනකට බෙදා ගැනීමෙන් පසු එක් මුරයක් උදය 6 සිට සවස 2 දක්වා ද දෙවන මුරය සවස 2 සිට රාත්‍රී 10 දක්වා ද තෙවන මුරය රාත්‍රී 10 සිට අලුයම 6 දක්වා ද පවත්වා ගෙන යයි. මෙම සේවා මුරක්‍රමයේදී ඔවුන්ට පැය 1/2ක විවේක කාලයක් හිමි වේ. ඉතිරි පැය 7 1/2 කාලය සේවා කාලය වශයෙන් වෙන් වේ. මෙවැනි සේවා මුරයන් විශේෂයෙන් අඛණ්ඩව නිෂ්පාදන සේවාවන් යෙදෙන ආයතන වල ක්‍රියාත්මක කරනු ලබයි. උදාහරණයක් වශයෙන් ඇඟලුම් නිෂ්පාදන ආයතන වල හා ඉලෙක්ට්‍රොනික භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයන්හි මෙවැනි තෙමුර සේවා ක්‍රමය භාවිත කරනු ලබයි. මෙම සේවා මුර ක්‍රමයේදී සෑම සේවකයෙකුම පැය 8 සේවා කාලයකට සීමා වී වැඩ කළ යුතුය.

තවත් සමහර ආයතන වල පැය 24ක සේවාමුර ක්‍රමයක් අනුගමනය කරන බව පෙනේ. වරාය අධිකාරියේ ආරක්ෂක අංශයේ සේවකයන්ට පැය 24ක සේවා මුරයක් ඇත. සේවා අවශ්‍යතාවයන් අනුව පැය 24ක කාලය ඔවුන් සේවයේ රැඳිය සිටිය යුතුය. එහෙත් ඔවුන් පැය 24 පුරාම සේවයේ යෙදිය යුතු යැයි ඉන් අදහස් කරන්නේ නැත. මේ අයුරින් ඉහත දක්වූ විවිධ සේවා මුර ක්‍රමයන්ගෙන් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන්නේ ආයතනවල අඛණ්ඩ කාර්යක්ෂම සේවාවන් පවත්වා ගෙන යාමය.

### වරාය අධිකාරියේ නව සේවා මුර ක්‍රම

වරාය අධිකාරියේ සේවා අංශ අතුරින් සමගි බහලු පර්යන්තයේ දෙමුර සේවා ක්‍රමයක් හඳුන්වා දී ඇත. ඒ අනුව සේවකයන් කණ්ඩායම් තුනකට ඒ,බී,සී වශයෙන් බෙදා ඇති අතර කණ්ඩායම් දෙකක් දවසේ සේවයේ යෙදේ. එක් කණ්ඩායමක් සේවයෙන් බැහැරව නිවාඩු ලබාග නී. මෙසේ සෑම දිනකම කණ්ඩායම් දෙකක් සේවයේ යෙදෙන අතර එක් කණ්ඩායමකට නිවාඩු ලැබේ. මෙම ක්‍රමය හඳුන්වා දී ඇත්තේ විධිමත් සේවා මුර ක්‍රමයක් ඇති කිරීමේ මූලික

> සේවා මුර ක්‍රමයන් යටතේ සේවය කිරීම සේවක යහපතට හා ආයතනයේ දියුණුව හා ඵලදායීතාවය වැඩිකර ගැනීමට ඉවහල් වන බැව් පිළිගැනීමට සිදු වේ. සේවා මුර ක්‍රමයක් ඇති කිරීමේදී සේවකයන් සමග සාකච්ඡා කොට සේවා මුර ක්‍රම සකස් කර ගැනීම සේවකයන්ගේ සහයෝග ය ලබා ගැනීමට හේතු වන බැව් ද සඳහන් කළ යුතුය.

පියවරක් වශයෙනි. මෙම නව සේවා මුර ක්‍රමය ක්‍රියාත්මක කොට එහි සාර්ථක අසාර්ථකභාවය ගැන සොයා බලා පසුව අනෙකුත් අංශ වලට ද එම ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සුදුසුවේදැයි අධ්‍යයනය කිරීම කළ යුතුව ඇත. දැනට ලැබෙන තොරතුරු අනුව එම ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක වන බැව් පෙනේ.

### සේවා මුර ක්‍රමයේ ඇති විශේෂතා

සේවා මුර ක්‍රම අනුගමනය කරනු ලබන ආයතනයන්හි සෑම දිනයක්ම වැඩ කරන දිනයක් ලෙස සලකනු ලබන අතර ඒ අනුව සේවකයන්ට සේවය සඳහා නියමිත දිනයක් හා වේලාවක් කලින් දන්වීම සිදුකරනු ලබයි. සමහර සේවායතනයන්හි වර්ෂයක කාලයක් තුළ සේවකයන් සේවය සඳහා පැමිණිය යුතු දින හා වේලාවන් සකස්කොට සේවකයන්-ගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබයි. මුලු වර්ෂයක කාලයක් එවැනි වැඩ වාරයන් දක්විය නොහැකි වූ විට හය මසක හෝ මාසයක කාලයක් සඳහා වැඩ වාර ලේඛනයක් සකස් කොට සේවකයන්ගේ දැන ගැනීම සඳහා ලබාදිය යුතු වේ. මෙසේ වැඩ කරන දිනයන් කලින් දැනගත් පසුව අනිවාර්යයෙන්ම තමන් සේවයට පැමිණිය යුතු දින කවරේද යන්න දැනගත්විට ඔවුන්ගේ පෞද්ගලික කටයුතු සඳහා නිවාඩු දිනයන් යොදා ගැනීමටත් සේවයේ යෙදිය යුතු දිනයන්හි නොවරදවා සේවයට පැමිණීමත් අනිවාර්යයෙන් සිදු වේ. මෙය ආයතනයට මෙන්ම සේවකයන්ට ද පහසුවකි. සේවකයන් වැඩට නොපැමිණීම නිසා ඇතිවන පාඩු මගහරවා ගැනීමට මහත් උපකාරයක් මෙමගින් සිදු වේ.

මෙම ක්‍රමය යටතේ පෙන්වා දිය හැකි තවත් වැදගත් ලක්ෂණයක් වන්නේ සේවය සඳහා අවශ්‍ය ප්‍රමාණයේ සේවකයන් පමණක් සේවය සඳහා යොදා ගැනීමට හැකිවීමයි. සියලුම සේවකයන් වැඩෙහි යොදා ගැනීමට අවශ්‍යතාවයක් නොමැති හෙයින් සේවකයන් කණ්ඩායම් ගතකොට සේවාවන් ලබා ගැනීම සිදු කිරීමෙන් කාර්යක්ෂම සේවා ක්‍රමයක් ඇතිකර ගැනීමට හැකි වේ. සේවකයන් කණ්ඩායම් ගතකොට ඇති හෙයින් අනවශ්‍ය ලෙස සේවකයන් සේවයේ යෙදවීමට අවශ්‍යතාවයක් ඇති වන්නේ නැත.

මේ හැරෙන්නට සේවකයන්ට අතිරේකව නිවාඩු භුක්ති විඳීමට ද හැකියාවක් ඇත. සේවය අනවශ්‍ය දිනවල සේවය සඳහා වාර්තා කිරීමට අවශ්‍ය නොවේ. එසේම සේවයේ යෙදෙන දිනයේදී තමන්ට සේවය කිරීමට සිදුවන්නේ ද නියමිත සේවා කාලය තුලදී පමණි. සමහර දිනවල එය දිවා කාලය වන අතර සමහර දිනයන්හි එය රාත්‍රී කාලය වෙයි. එයින් ද තමන්ගේ පෞද්ගලික වැඩකටයුතු සඳහා වේලාවක් වෙන්කර ගැනීමට අවස්ථාව සලසා ගත හැක. සේවකයන් නොකඩවා සේවයේ යෙදීම වෙනුවට අවශ්‍ය විවේකය ලබා සේවයේ යෙදීම ඔවුන්ගේ මානසික හා කායික ශක්තිය වර්ධනය කිරීමට ද හේතු වේ.

මෙසේ ඉහත දක්වූ කරුණු අනුව සේවා මුර ක්‍රමයන් යටතේ සේවය කිරීම සේවක යහපතට හා ආයතනයේ දියුණුව හා ඵලදායීතාවය වැඩිකර ගැනීමට ඉවහල් වන බැව් පිළිගැනීමට සිදු වේ. සේවා මුර ක්‍රමයක් ඇති කිරීමේදී සේවකයන් සමග සාකච්ඡා කොට සේවා මුර ක්‍රම සකස් කර ගැනීම සේවකයන්ගේ සහයෝග ය ලබා ගැනීමට හේතු වන බැව් ද සඳහන් කළ යුතුය.

### සේවා මුර ක්‍රමය ගැන ඇති විරෝධතා

මේ දක්වා ඉදිරිපත් කරන ලද කරුණු අනුව සේවා මුර ක්‍රමයේ ඇති වැදගත්කම පෙන්වා දීමට උත්සහ ගන්නා ලද අතර එම ක්‍රමය සම්බන්ධව ඇති වී ඇති විරෝධතාවයන් මොනවාද යන්න ගැන සොයා බැලීම මෙම ලිපිය අවසන් කිරීමට ප්‍රථම සිදු කළ යුතු කාර්යයකි. මෙම ක්‍රමය සම්බන්ධව ඇති විරෝධතාවයන් වශයෙන් ඉදිරිපත් වී ඇත්තේ කරුණු කිහිපයකි. සේවා මුර ක්‍රමය ඇති කිරීමෙන් මේ දක්වා භුක්ති විඳි වරප්‍රසාදයන් අහිමි වන බවට මතුවී ඇති ගැටළුවකි. එම වරප්‍රසාද වශයෙන් දක්වා ඇත්තේ අතිකාල අහිමි වීම සහ රජයේ සහ පොහොය නිවාඩු දිනයන්හි සේවකයන්ට සේවයේ යෙදීමට සිදුවීමය. මුර සේවා ක්‍රමයක් ඇතිකළ විට යම් ප්‍රමාණයක අතිකාල අඩුවීමක් සිදුවිය හැක. එහෙත් එය සම්පූර්ණයෙන් අඩු නොවේ. අනෙක් අතට අතිකාල සේවය අවශ්‍ය වන්නේදැයි තීරණය කරනු ලබන්නේ කළමණාකරණ පක්ෂයයි. සේවකයන් අතිකාල සේවයේ යොදා ගනු ලබන්නේ අවශ්‍යයෙන්ම අතිකාල සේවයේ යෙදිය යුතු අවස්ථාවලදී පමණි. සේවකයන්ට අවශ්‍ය වන පරිදි අතිකාල සේවයේ යෙදීමට හැකියාවක් නැත.

මුරසේවා ක්‍රමයට විරුද්ධව දක්වන අනෙක් කරුණ නම් නිවාඩු දිනවල සේවයේ යෙදීමට සිදු වීමයි. සති නිවාඩු දින, රජයේ නිවාඩු දින හා පොහොය නිවාඩු දිනයන්හි සේවා අවශ්‍යතාවය අනුව ඕනෑම සේවකයෙකු සේවයේ යොදාගැනීමට නීත්‍යානුකූල අයිතියක් පාලක පක්ෂයට ඇත. එවැනි දිනක සේවය කිරීමට සේවකයා නීතියෙන් බැඳී ඇත. එම දිනවල කරන ලද සේවයට විශේෂ දීමනා ගෙවීම හෝ වෙනත් දිනක නිවාඩු ලබා දීමට කටයුතු කිරීමට පාලක පක්ෂයට අයිතියක් ඇත. එසේ කිරීම නීති විරෝධී හෝ සේවක අයිතිවාසිකම් කප්පාදු කිරීමක් ලෙස සැලකිය නොහැක. මේ අනුව පැහැදිලි වන්නේ සේවා මුර ක්‍රමය යටතේ අතිකාල අඩුවීම හා නිවාඩු දිනවල සේවයේ යෙදීමට සිදුවීම සේවක අයිතීන් වලට පටහැනි වීමක් නොවන බවයි. එහෙයින් සේවාමුර ක්‍රමයට විරෝධය දැක්වීම යුක්ති සහගත ක්‍රියාවක් ලෙස හඳුන්වා දිය හැකි නොවේ.

ආයතනයක සේවක හා සේව්‍ය දෙපක්ෂයේ මූලික වගකීම වන්නේ ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් පවත්වා ගෙන යාමය. ඒ සඳහා සේවා මුර ක්‍රමයක් යටතේ කාර්යයන් ඉටු කිරීම කළයුතු බව පිළිගැනීමට සිදු වේ.

**ඒ.සී. වීරසූරිය**
උපදේශක/කාර්මික සම්බන්ධතා

යහළුවන් ඇයට විරුද්ධව කතා කළ විට මා ඔවුන් හා එකටෙක කීමට නොගියේ සමහර අවස්ථා වලදී මා පරාජය වන බැවිනි. මා ගෙදර ගොස් සිටි දවස් වල ඇය ඇගේ යෙහෙළිය ඉවෝනුත්, ඇගේ පෙම්වතාත්, ඇයත් තවත් යහළුවන් කිහිප දෙනෙකුත් සමග විනෝද චාරිකා කිහිපයක් ම ගොස් ඇත. මේ තාක් ඇය මා සමග මේ බවක් පවසා නැත. සමහරවිට ඇය මා ඒ ගැන නොදන්නවා යැයි සිතා සිටිනවා විය හැක. මා ඒ පිළිබඳව දැන ගත්තත් ඇගෙන් අසන්නට ගියේ නැත. කවදා වෙනකන් මෙවැනි දේවල් ඇය විසින් කරනු ඇත්දැයි මම බලා සිටියා. අවසාන පරීක්ෂණයෙන් පස්සෙ ඇය විවාහ කරගන්නටයි මම හිතුවෙ. ඒ වෙනකොටත් මං මේ ගැන මගේ අම්මා සමග ද කතා බහකොට තිබුණා. ඇය ශාදි ට දක්වන ආදරය නිසා ඇය ඇගේ ලේලිය ඉක්මනින් ම තම නිවසට පැමිණෙනවාට එක පයින් කැමති ය. මේ ගැන ශාදි සමගත් කතා කළ යුතුය. මේ වගේ සිතුවිලි වල තනි වී සිටි මා ශාදි බැලීමට ඇති වූ සිතුවිල්ලෙන් හොස්ටල් එකෙන් එලියට බැස්සේ කඩිමුඩියේ අතට අසු වූ ඇඳුමක් ඇඳ ගනිමින්. සංඝමිත්තා හොස්ටල් එක අසල අභ්‍යන්තර දුරකථන කුටියෙන් ශදි ට ඇමතුමක් දුන් මම ඇය එන තුරු මොහොතක් රැඳී උන්නා. ශාදි දුවගෙන ඇවිත් මගේ අතේ එල්ලුනා. ඒක දැකපු දුරකථන කුටියේ හිටපු සිකියුරිටි අංකල් ටත් හිනා. අත්වැල් පටලාගත් අප දෙදෙනා වදනකුඩු නොදොඩා වේවැල්දූව පාරේ ඉදිරියට ඇවිද ගෙන ගියා.

''ඇයි ආලෝක ඔයා කථා කරන්නැත්තේ?''

''ඔයා දන්නවද දැන් මම මොනවා ගැන ද කල්පනා කරන්නේ කියලා?''

''මම කොහොමද දන්නේ ඔයා කල්පනා කරන දේවල්''

''මම කල්පනා කළේ මේ එක්සෑම් එකෙන් පස්සේ අපේ වෙඩින් එක ගන්න හැටි''

''අපේ වෙඩින් එක මෙච්චර ඉක්මනට''

'' ඇයි ඔයා ආස නැද්ද ඉක්මනට මගේ ළඟට එන්න''

''ආසයි. ඒත් ආලෝක අපට තව වයස තියෙනවා. අනික ජොබ් එකක් හොයාගන්න ඕන. මම මගේ අම්ම ට තාත්ත ට නංගි ට මල්ලි ට සලකන්න ඕන. එයාලගේ වියදම් දරන්න ඕන. ඉතින් මෙච්චර ඉක්මනට බැන්දහ ම මම කොහොමද ඒවා කරන්නේ?''

''මම ඔයාට ආදරය කරපු මුල්ම දවසෙම කිව්වා නේද ඔයාගේ පවුලේ අය ගැනත් මම බලනවා කියලා. අනික ඔයා ජොබ් එකක් කරන්න ඕන නැහැ. මම කැමති මගේ වයිෆ් ගෙදර ඉන්නවට. මගේ පැටව් ටිකත් බලාගෙන.''

''පිස්සා, මොනව කියනවද මන්දා. පැටව් හදලත් ඉවරයි '' කියමින් ශාදි ඇගේ කථා කරන දැස් කරකවමින් සිනාසුනා.

මා කවදත් ඇගේ සිනාවට කැමති යි. මට ඇය සිප ගන්නට පවා සිතුණා. ඒත් මේ පාර මැද්දෙ කොහොම ද එහෙම දෙයක් කරන්නේ.

''ශාදි දැන් එක්සෑම් එක ෆිට් ද?''

''ඔයා තරම් මම දක්ෂ නෑනේ බබා. යන්තම් කොහොම හරි පාස්වෙන්න ඕන. නැත්නම් මට තව අවුරුද්දක් මේකෙ ඉන්න වේවි.''

''මම කියන විදිහට ඔයා පාඩම් කරන්නකෝ. එතකොට ඔයාට පාස්වෙන්න ලේසියි. විභාගෙ කරල ඉවර වෙලාම අපි අපේ මැරේජ් එක ගැන කතා කරමු. දැන් ඕක ගැන කතා කරන්න ගිහින් හිත රිදවගන්න වුණොත් ළඟ එන එක්සෑම් එකවත් කරගන්න බැරිවේවි.''

''ඔයා මට ද ඔය හින්ට් එක පාස් කළේ? මම ඔයාව මැරි කරන්න අකමැති නැහැ ආලෝක. මම කිව්වේ මට තියෙන ප්‍රශ්න ගැන. මගේ පවුලේ බර ඔක්කොම ඔයාට පටවන්න මම කැමති නැහැ. ඒකයි මම ජොබ් එකක් කරන්න ඕනෙ කිව්වේ.

'' හරි හරි ඔක්කොටම කලින් අපි ෆයිනල් එක්සෑම් එක හරියට කරගමු. මම හෙට උදේ ගෙදර යනවා ශාදි. අම්මා මට එන්න කියලා පණිවිඩයක් එවලා තියෙනවා. මම හෙට ගිහින් අනිද්දා එනවා බබා. ඔයා පරිස්සමින් ඉන්න. ඔයා බ්‍රහස්පතින්දා උදේ 9.00 වෙනකොට පුස්තකාලේ ලඟට එන්න. අපි එදාට අමාරු පාඩම් සාකච්ඡා කරමු. අමාරු පාඩම් ඔක්කොම අරන් එන්න.''

'' හෙට මට පාළුවෙන් තමයි ඉන්න වෙන්නෙ. මට ඔයාට එක දවසක් හරි දැක්කෙ නැති වුණොත් පුදුම පාළුවක් දැනෙනවා. කමක් නැහැ. ඔයා අනිද්දා එනවනේ. පරිස්සමින් යන්න හොඳේ. අම්මට කියන්න එක්සෑම් එක ඉවර වුණ ගමන්ම මම අම්මව බලන්න එනවා කියලා''

''හරි මම කියන්නම්. ඔයා පරිස්සමින් ඉන්න'' ශාදිව හොස්ටල් එක ළඟට ඇරල වූ මා මගේ හොස්ටල් එකට එන්න හදනකොට ම, ''බුදු සරණයි ආලෝක, පරිස්සමින් ගිහින් එන්න'' යැයි කියමින් ශාදි මා අත සිප ගත්තා. හෙට මං නැතිව පාළුයි කියලා ශාදි කිව්වේ ඇත්තටම ද? මම ඒ ගැන හිතමින් හොස්ටල් එකට ආවා.

අද බ්‍රහස්පතින්දා ය. දවස් දෙකකින් මං ශාදි දැක්කේ නෑ. ඒ මම ගෙදර ගොස් සිටි බැවිනි. උදේ 9.00 ට පුස්තකාලය ලඟදී මුණගැසීමට කතා කරගත් බැවින් 9 ට ප්‍රථම මා පුස්තකාලය වෙත ගොස් පාඩම් කිරීම සඳහා පුටු දෙකක් වෙන්කර තබා, පුස්තකාලයෙන් එලියට විත් ඒ අසලම වූ බංකුවක වාඩි ගත්තා. නිදහස් සිතුවිලි වලින් යුතුව දෑස් පියාගෙන මා බොහෝ සතුටින් යුතුව මගේ ආදරය එනතුරු බලා සිටියා. කාලය බොහෝ වේගයෙන් ගෙවී යයි. දැන් උදේ 10 ත් පහු වෙලා. ශාදි තවමත් නැහැ. අපරාදේ මම එයාට මෙතැනට එන්න කිව්වේ. මම එයාව ගන්න අද උදේ හොස්ටල් එකට එනවා කිව්ව නම් හරි. සනීප නැතිවද දන්නෙ නැහැ. හොස්ටල් එකට ගිහිල්ලම බලන්න ඕනෑ...

පුස්තකාලය තුලට ගොස් මගේ පොත් ටිකත් ගෙන ශාදිගේ හොස්ටල් එකට යෑම සඳහා මං පුස්තකාලයෙන් එලියට බහිනකොට ම ශාදි දුවගෙන ආවා.

''අනේ සොරි ආලෝක. මම හොඳටම පරක්කු වුණා නේද?'' අනේ මට ඇහැරුනේ දවල් වෙලා. ඒකයි එන්න පරක්කු වුණේ.''

මා බොහෝ විමසිලිමත්ව ඇය දෙස බලා සිටියා. වෙනදා මෙන් නොව ඇයගේ මුහුණ රතු වී, හිසකෙස් අවුල් වී බියපත් බවක් ද පළ වුණා. වෙනදා වගේ මගේ මුහුණ දිහා කෙළින් බැලුවෙත් නෑ. ඇය කතා කළෙත් බිම බලාගෙන. ඇයගේ ඇඳුම ද බොහෝ සේ පොඩි වෙලා.

''ඇයි ඔයා බයවෙලා වගේ ශාදි? මූණත් හොඳටම රතුවෙලා. කොණ්ඩෙත් අවුල් වෙලා. ඇඳුමත් හොඳටම පොඩිවෙලා. වෙනදා ඔයා ඔහොම එන්නේ නැහැනේ''

''පරක්කු වෙච්ච නිසා අතට අහුවෙච්ච ඇඳුමක් ඇඳගෙන දුවගෙන ආවා. හරියට ඔළුව පීරන්නවත් බැරිවුණා, ආලෝක. දැන් ඉතින් පාඩම් කරමු. මම ආවනේ.''

එදා තමයි ප්‍රථම වතාවට මගේ සිත තුළ ඇය පිළිබඳව සියුම් සැකයක් ඇතිවුණේ. ඇය මා හට නොපෙන්වුවත් බොහෝ සේ බියපත් වී සිටියා. මේ පිළිබඳව දිගින් දිගට හගිස්සමින් ගියහොත් අප දෙදෙනාගේම සිත් රිදෙනු නොඅනුමාන යි. එබැවින් අකමැත්තෙන් වුව ද මේ සිදුවීම අමතක කොට දමා පාඩම් කිරීමට හිත හදා ගත්තා.

''යමු පාඩම් කරමු'' මං පුස්තකාලය පිටිපස්සෙ මැයි මාර ගහ යට බංකුවක වාඩි වුණා. ශාදි ත් මගේ පිටුපසින් ඇවිත් මගේ ලඟ ම වාඩි වුණා.

''අමාරු පාඩම් ටික ගන්න බලන්න''

ඇය ජනසන්නිවේදනය පිළිබඳ ප්‍රශ්න කිහිපයක් රැගෙන විත් තිබුණා. ඒ පිළිබඳව ඇයට පැහැදිලි කරද්දී ඇගේ හිත තිබුණෙ වෙනත් තැනක. පාඩම නවතා විනාඩි කිහිපයක් ගත වුවත් ඇය පාඩම නැවැත්වූ බවවත් දැන සිටියේ නැහැ. ඒ තරම් ගැඹුරු කල්පනාවක යි ඇය සිටියේ.

''ශාදි'' තරමක් වේගවත් හඬකින් මම ඇයට කථා කළා. එහෙත් කිසිඳු ප්‍රතිචාරයක් නැහැ.

''ශාදි මොකද ඔයාට වෙලා තියෙන්නේ?''

''ඇයි..... ඇයි ආලෝක''

'' ඔයා මේ ලෝකේ නෙවෙයිද ඉන්නේ? ඔයා ආපු වෙලාවේ ඉඳන්ම මම ඔයා දිහා හොඳ සැලකිල්ලෙන් බලන් හිටියේ. ඔයා අද මට හරියට මූණ දීලවත් කතා කරන්නේ නැහැ. මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවා නම් කියන්න. අපි විසඳගමු''

''කිසි ප්‍රශ්නයක් නැහැ ආලෝක. මගේ ඔළුව ටිකක් කකියනවා''

''එහෙම නම් අපි අද පාඩම් නොකර ඉමු. ඔයාව මම උපරිමෙයෙන් ම විශ්වාස කරනවා ශාදි. ඔයා මට බොරුවක් කරන්න නම් හදන්න එපා.''

'' ඇයි මම ඔයාට බොරු කරන්නේ''

''ඔව් ඔයාට මට බොරුවක් කරන්න කොහොමත් අවශ්‍ය නැහැනේ. අපි යමු.'' පොත් ටික ගත් මා අඩියට දෙකටඑතනින් ආවා. ශාදිත් මගේ පස්සෙන් ම ආවා.

'' ඔයා තරහින්ද ඉන්නේ ආලෝක?''

''නැහැ ශාදි. ඒත් මටවත් නොතේරෙන දෙයක් සිද්ධ වෙනවා කියලා මට හිතෙනවා. කමක් නැහැ. විභාගෙට තව තියෙන්නේ පොඩි කාලයයි. හොඳට පාඩම් කරලා විභගේ කොහොම හරි පාස්වෙන්න බලන්න.''

'' ඔව් ඉතින් ඔයා තරම් මම දක්ෂ නෑනේ. ඔයා පාඩම් නොකරත් විභාගෙ පාස්වේවි''

''ඔයත් අදක්ෂ නැහැ ශාදි. ඔයාට දැන් ඉස්සර වගේ උවමනා නැහැනේ පාඩම් කරන්න, ඒකයි''

'' උවමනා නැතිව නෙවෙයි. මට මතක හිටින්නේ නැහැ''

''ඔළුවෙ එක එක විකාර තියෙන නිසා තමයි පාඩම් මතක තියෙන්නේ නැත්තේ. ඔයාට මම කියන්නමයි හිටියේ ඔයා ඔය ඉවෝන් එක්ක යන ගමන් බිමන් ටිකක් නතර කරොත් හොඳයි''

''කව්ද කිව්වේ මම ඉවෝන් එක්ක ගමන් බිමන් යනවා කියලා....?'' ශාදි මගෙන් ඇසුවේ බියපත් දෑසින්.

'' ඔයා හිතන්න එපා මම කිසිම දෙයක් දන්නේ නැතිව ඉන්නවා කියලා. එහෙම ඉන්න නිසා ඔයා හිතනවා ඇති මම මෝඩයෙක් කියලා. හැබැයි අවස්ථාව ආපු වෙලාවට මම හැමදෙයක් ගැනම බලාගන්නම්. දැන් ඔයා ගිහින් ටිකක් රෙස්ට් කරන්න. එතකොට ඔය ඔළුවෙ කැක්කුම අඩුවෙලා යාවි''

ශාදි හොඳටම බය වී ඇති බව ඇය දෙස බැලූ විට මට හොඳින්ම දැනුණා.

''ඇයි ඔයා බයවෙලා. ඔයා වැරැද්දක් කරන්නෙන් නැත්නම් බයවෙන්න ඕනෙ නැහැනේ''

'' මම මොකටද බයවෙන්නේ? ඔයාට පිස්සු. මම යනවා ''කියමින් ශාදි හොස්ටල් එක දෙසට දිව ගියා.

අද අපගේ විභාගයේ අවසන් දිනයයි. මට නම් ඉතා සාර්ථක අයුරින් පිළිතුරු ලියූ බව විශ්වාස යි. ශාදිත් විභාගය කෙසේ හෝ කරගනු ඇත. අවසන් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලියූ මා එය අවසන් වත්ම බොහෝ සැහැල්ලු හුස්මක් හැර විභාගයට ආයුබෝවන් කිව්වා. අදින් පසු අප නිදහස් ය යන හැඟම සිතට සැහැල්ලුවක් ගෙනාවා. තව දින කිහිපයකින් අප අප ගේ සුන්දර මතක සටහන් ඇති මෙම භූමිය හැර දමා යා යුතුය යන සිතුවිල්ල හදට වේදනාවක් ද ගෙනාවා.

''දැන් අපි නිදහස් නේද?'' යි කියමින් ශාදි මා වෙත ආවා.

''අපි දැන් නිදහස්. ඔයා ගමේ යන්නේ කවදද ශාදි?''

''මම තව සුමානයක් විතර ඉන්නවා ආලෝක''

'' මාත් තව සුමානයක් විතර ඉන්නයි හිතාගෙන ඉන්නේ. කොහොමත් ඔයා යනකන් මටත් යන්න බැහැනේ''

''ඔව්,ඔව් ඔයා මාව දාලා යන්න එපා.''

''මම නම් ඔයා දාලා යන්නේ නැහැ. ඔයා ගියොත් මිසක්''

''ඔයා මොනව කියනවද මන්දා? හෙට මම ඉවෝන් එක්ක ගමනක් යනවා ආලෝක''

''කොහෙද යන්නේ?''

''ඉවෝන් මට මුකුත් කිව්වෙ නෑ. එනව ද ඇහුවා, මම හා කිව්වා.....''

''යන තැනවත් දන්නෙ නැතුව ද හා කිව්වේ''

''එයා ඉතින් මගේ යාළුවානේ..... මට බෑ කියන්න බෑනේ ආලෝක.....''

''ඔයා හැම දාම, හැමදේම කළාට පස්සෙනෙ මට කියන්නෙ. කොහේ උනත් කමක් නෑ පරිස්සමින් යන්න. මම ඔයාට උපරිම නිදහස දීලා තියෙනවා. මම හිතනවා ඔයා ඒ නිදහස අයුතු විදියට ප්‍රයෝජනයට නොගනීවි කියලා.''

''මම ඔයාගේ ඒ විශ්වාසෙ හැමදාම ඒ විදියට රකිනවා ආලෝක.''

''මටත් ඕනෙ එච්චරයි.....''

---

මං හොස්ටල් එකේ බැල්කනියට වෙලා ඈතින් පෙනෙන කැළණි ටයර් කර්මාන්ත ශාලාවේ චිමිනි දිහා බලන් හිටියා. සිතුවිලි වැලක පැටලී කිසිවක් ලිහා ගත නොහැකිව සිටි මං ළඟ ට රංග එන බව මට දැණුනෙ නෑ.

''ඒයි උඹ මොකද කල්පනා ලොව මල් වනේ?

''හරි පාළුයි මචං.''

''ඇයි උඹේ ප්‍රියම්භිකාව එක්ක කොහේ හරි යන්න තිබුණනේ. කොහෙ ද උඹත් එක්ක යන්න වඩා ඒකිට දැන් ගමන් යන්න එවුන් ඉන්නවනේ...''

''මොකක් ද බං ඒ කථාව?''

## නැවත හමුවෙමු




කොට ගවුමක් ඇඳි කෙල්ලකට ඉස්සර වෙමින් බසයට නගින පිරිමි සිටිත් ද? - මෙල් ෆෙරර්

මේ ගැනත් හිතන්න

# BE Polite
# ආචාරශීලී වෙන්න



"නූතනයේ අපි එකිනෙකා හා කතා බහ වෙනුවට ළඟින් වාඩිගෙන එකිනෙකාට කෙටි පණිවුඩ යවන සමාජයකට පා තබමු. මෙයින් අපි එකිනෙකාට ළං වනවා වෙනුවට මනුෂ්‍ය ඇසුරෙන් තවත් ඈත් වෙමු. වදනින් කෙරෙන කතාවත් මුහුණෙන් දකින ඉරියව්වත් කෙටි කෙටි පණිවුඩයකින් බෙදා ගනු නොහැකිය."

**සටහන - අරුණි ෂිෆාරෝ**

ආචාර සමාචාර ඉගෙන ගන්නට කියා සුදුසු වයසක් නැත. අවුරුදු තුනක් වයසැති දරුවෙකු සමාජ චාරිත්‍ර දැන ගැනීම හා භාවිතය පටන් ගත යුතු ය.

කෙනෙකු හා කතාබහ කරද්දී වට පිට නොබලා තමා කතාබහ කරන්නා හා දෑසුනෙන් බැඳී සිටීම වැදගත් ය. සමහර අයෙක් කතා බහේදී වටපිට බලයි. ඔහු ඇත්ත මග හරින අයෙක් ලෙසින් ඔහු ඉදිරියෙන් සිටින අයට දැනේ. කලබලයෙන් දුවන්නට ගමනක් තිබේ නම් එය තමා හමු වූ අයට කියා ගමනේ යන්න. තමා හා කතා බහ කරන අයට ගෞරවයක් ලෙසින් කතා බහේදී අසන්නාගේ කියන්නාගේ මුහුණ දෙස බලන්න හුරු කර ගන්න.

පෙර අතීතයේදී තමාට වඩා වැදගත් අයෙකුගේ මුහුණ දෙස කෙලින් බැලීම මරණීය දණ්ඩනයට හේතු වූ කාරණයකි. අද තත්වය එසේ නොවෙයි. ඔබට වඩා කෙතරම් පූජනීය වුවත් ඔබට වඩා කෙතරම් ධනවත් වුවත් ගරු ගාම්භීර වුවත් ඔළුව උස්සා ඇස් මුණ ගැසී කතා බහ එකිනෙකාගේ සුචරිතවත් බව පෙන්වයි.

හොඳ සිරිත් පටන් ගන්නේ තමා වාසය කරන නිවසෙනි. ගෙදර දොරේ චාරිත්‍ර වාරිත්‍ර නැති කළ පිට තැනකදී කෙනෙක් හොඳින් හැසිරෙනු ඇතැයි සිතනු නොහැකි ය.

සාම්ප්‍රදායික වතාවත් ඉතා තදින් අනුගමනය කරන පරිසරයක තම නිවසේදී ලිහිල් පිළිවෙත් හි නියැළීම කමක් නැත. එහෙත් රජ මාලිගාවල සාදයන් සඳහා පය නොතැබුව ද අප එදිනෙදා ගත කළ යුත්තේ ද සිරිතෙන් අගය හැකි අන්දමටයි. කුඩා දරුවන් ගෙදර දොර දී එදිනෙදා ජීවිතයෙන් ඉගෙන ගන්නා ආකාරයෙන් පිටත ගිය විට ද හැසිරෙති. ඔවුන්ගේ හැසිරීම ගැන කලබල නොවන්නට නම් ලැජ්ජා නොවන්නට නම් නිසි හුරු පුරුදු ඔවුන් හා දවසේ කාලය ගත කරන්නට එක් කර ගත යුතුය.

**දවස ආරම්භයේදී දෙමාපියෝ හා එක්වෙන දරුවා හා දවසට සුබ පතා ගන්නට අමතක නොකරන්න. එසේම රාත්‍රියේ නින්දට යෑමට පෙර ද දරුවාට සුබ රාත්‍රියක් පතන්න. මෙය දිනපතා කරන පවුලක් පිටතදී නිතැතින්ම තමා හමුවන්නන්ට සුබ පතන්න නොපැකිළෙති. සම්මුඛ සාකච්ඡාවකට පා තබනා අවස්ථාවක දී ඔවුන් ඉදිරියේ ආචාර කිරීමට අදිමදි නොවෙති. මන්ද එය දැන් පුද්ගලයාගේ එදිනෙදා දවසේ අංගයක් බවට පත්ව ඇති හෙයිනි.**

දිනපතා උදෑසනත් නින්දට යෑමට පෙරත් එකට එක්ව ආචාර සමාචාර කරනා පවුලේ සබඳතාවය එසේ නොකරන පවුලකට වඩා ස්ථාවර වෙයි.

මුහුණ සහ අත් නිතර පිරිසිදුව තබා ගන්න. ඕනෑම කෑමක් ආහාරයකට පෙර හා ආහාරයෙන් පසුව අතකට මුහුණ සෝදා ගන්න. මෙය සෞඛ්‍යයට හිතකර වනවා පමණක් නොව ඔබ හා ඇසුරු කරන අන්‍යන්ගේ ගෞරවයට පාත්‍ර වන්නට හේතු සාධක වෙයි.

පිරිසිදු අත් ඇත්තා හා අතට අත දී කතා බහ කරන්නට කෙනෙකු මැළි නොවෙයි. එසේම හඳුනා ගන්නා කෙනෙකුගේ අත් කිළිටි නම් ආගන්තුකයාගේ අවධානය යොමු වන්නේ ඔහු කියන්නට නොව අර කිළිටි අත් දෙස ය. කුලී වැඩ කරන, දැළි වළන් සූරා හෝදන අයෙකු හෝ මජං ගා ගත් යාන වාහන අළුත් වැඩියා කරන්නෝ ද කෙනෙකු හමු වන්නට මත්තෙන් අත් සෝදා ගත යුතු ය.

මුහුණ දහදියෙන් පිරුණු අයෙක් හා එක්ව කතා බහට වඩා සෝදා ගත් මුහුණක් ඇති අයෙකු සමඟ කතා බහ ප්‍රියදායක ය.

බසයක ගමන් කර ඇති ඔබ කොන්දොස්තර තැන "**කරුණාකරල ඉස්සරහට යන්න**" කියනු අසා ඇත්ද? කරුණාකර යන වචනය තරහෙන් පමණක් කියන්නක් යැයි සිතන්නෝ සිටිති. ඔවුන්ගේ මුවෙන් කරුණාකර යන්න පිට වන්නේ කර කියා ගත නොහැකි අවස්ථාවකදී හෝ තරහින් පුපුරද්දී ය. කුඩා දරුවාගේ පටන් වැඩිහිටියා දක්වා සෑම සියළු දෙනාම එකිනෙකාගෙන් යමක් බලාපොරොත්තු වන්නේ ද ඉල්ලන්නේ ද කරුණාකර, යන වචනය පාවිච්චියට හුරු කර ගන්න.

"කරුණාකරල වතුර වීදුරුවක් ගේන්න දුවේ" යැයි තාත්තා දියණියට කීම තාත්තාට මදි කමක් නොවෙයි. සිංහල භාෂාවේ හුරුවට අනුව අප කරුණාකර යන්න ලොප් කර වචන උච්චාරණයේදී "වතුර වීදුරුවක් ගේන්න" යන්න සුමුදු හඬින් පවසමු. බැගෑපත් බවෙන් කියමු. එයම තදින් උච්ච ස්වරයෙන් ද කියමු. උච්චාරණය අනුව අපගේ මානසික තත්වය පෙන්වන්නෙමු.

"කරුණාකාර යන වචනය භාවිතයට ගැනීම නිසා වැඩිහිටියන් හා දූ දරුවන් අතර තත්ත්වය හෝ උසස් නිලධාරීන් හා යටහත් පහත් සේවකයන් අතර තත්ත්වය සමානාත්මතාවයකට එන්නේ නැත. එයින් හට ගන්නේ මනුෂ්‍යත්වයට කරන ගෞරවයකි. එමෙන්ම හොඳ සිරිත් වැඩීමකි. දරුවන් හට කියා දීමෙන් හා පිළිපැදීමෙන් එය ඔවුන් සමාජයට පිටත් කර යවන්නට පෙර දෙන පෙරහුරුවක් වෙයි.

කෙනෙකුට අවමන් කර හෝ පහත් ලෙසින් සලකා තමන් බලවතෙකු වන්නට තැත් දැරීම මනුෂ්‍යත්වයට නිග්‍රහයකි. හොඳ සිරිත් වඩවන්නෝ ලෙසින් අප නිතරම උත්සුක විය යුත්තේ අනිකාට වඩා මහත්මා ගතිගුණ පෙන්වන්නට ය.

## දුරකතන චාරිත්‍ර

අද දුරකතනය නැතිවම බැරි උපකරණයකි. හැමගේ අත ගැවසෙන මෙය හා සමගින් ඇති සිරිත් කිහිපයකි.

තමාට ඇමතුමක් ලැබුණු විට ඊට සන්ධි විය යුත්තේ "හලෝ" නැතිනම් "ආයුබෝවන්" කියා ය. ඊට නොසරිලන වචන අතර ඇත්තේ "කවුද කතා කරන්නේ? කවුද කියන්න, ඔව්, කතා කරන්න යන වදන්ය. තමාගේ කාර්යාලය වෙනුවෙන් දුරකතනයට පිළිතුරු දෙන අයෙක් සිය ආයතනයේ නම සඳහන් කිරීම වැදගත් ය. එයින් අමතන්නා වැරදි අංකයක් කරකවා ඇතිනම් වටිනා කාලය නාස්ති නොකර අංකයෙන් විසන්ධි වනු හැකි ය.

කෙනෙකු අමතා තමා කවුද යැයි නොදන්වන්නා සිරිත් නොදන්නෙකි. "අයියෝ අපිව දැන් අඳුර ගන්නත් බැහැ නේද?" යැයි එවන් අයෙක් තමා ඇමතූ අයට වදේ ගසති. කෙනෙකු නම් ක්ෂණයෙන් පිළිතුරු දෙති.

වැසිකිළියේ ඉන්නා ගමන් මෙසේ ආමන්ත්‍රණයට පිළිතුරු දෙන අය ඇත. එපමණක් නොව ඔවුන් තමන් ඉන්නේ වැසිකිළියේ බව තමා හා කතා කරන්නාට ද කියයි. නිවසේ හඬ වැදෙන දුරකතනය ඔසවන දරුවෙක් "ආ තාත්තා ලැට් එකේ" කියා පවසයි. ගෙදරකට ආ ඇමතුමකට පිළිතුරු දෙන දරුවන්ට ඒ අමතන අයට තමාට දුරකතනයට එනු නොහැකි බව පමණක් කියන්න යැයි කියා දෙන්න. එසේ කෙනෙක් කියන්නේ නම් ඇයි එන්න බැරි යැයි අහන්න එපා. පසුව කතා කරන්න සුදුසු වේලාව කුමක්දැයි පමණක් අසන්න.

අමතන්නා දෙන අංකයක් හෝ පණිවිඩයක් ලියා ගැනීමට නිතරම දුරකතනය අසලින් කොලයක් හා පැන්සලක් තබන්න. ගෙදර ඉන්නා අයට අනිත් අයට එන පණිවුඩ ලියා තබන්න පුරුදු කරවන්න.

අමතා කතා කළ ඔබ ඊට පිළිතුරු දෙන අයව අපහසුතාවයට පත් කිරීම හැදියාව නොවේ. ඇමතීම කළ තැනැත්තා තමා කවරෙක්දැයි මුලින්ම කියා සිටි ය. යුතුය. කෙතරම් දන්නා හඳුනන නිතර කතා බහ කරන අය අතර වුව ද එය පිළිපැදිය යුතු සිරිතකි. බොහෝ දුරකතනයන්හි දැන් අමතන්නාගේ අංකය සඳහන් වෙයි. ඒ පමණින් එම උපකරණය භාවිතා කරන්නේ එය අයිති අය යැයි සැලකීම නිසා පසුව පැන නගින අපහසුතාවයන් එසේ එම තමන් හඳුන්වා ගැනීමෙන් මග හරවා ගැනීමට හැකි ය.

දුරකතනයෙන් ඇමතුමක් ආ පලියට එයට කතා කරන්න යැයි නීතියක් ලොව නැත. ඔබ ඉන්නා ස්ථානය හා යෙදෙන කාර්යය අනුව ඊට පිළිතුරු දීම පසුවට කල් දමන්න හුරු වන්න. දුරකතනයට වහල්ව ඉන්නා අය එන්න එන්නම අධික වෙති. තම භාර්යාව, පුරුෂයා හෝ දෙමව්පියන් පස් හය වතාවක් අහන ප්‍රශ්නයත් නොඇසුනා සේ ඉන්නා අය ද දුරකතනයට

**දුරකථනය නිහඬ කර තැබිය යුතු ස්ථාන මෙසේ ය.**

ආපනශාලා, සිනමා, නාට්‍ය, සංගීත සංදර්ශන පැවැත්වෙන ස්ථානයන්හි, ආගමික වතාවත්වල යෙදෙන විට, මංගල අවමංගල උත්සව වලදී, දේශන හෝ පංති කාමරයන්හි, වැසිකිළිය

පිටින් එන ඇමතුම් වලට දිගින් දිගට කතා කරන අය තමන් දෙන ඇමතුම් ඉතා කෙටියෙන් නිම කරති. තමා සේම දුරකතන ඇමතුම් ගාස්තු අනෙකාත් ගෙවන බව මෙවන් අය අමතක කර ඇත. පිටරට ට ද ලංකාවේ සිට කතා කළ හැකි වුව ද තවමත් ලංකාවේ වැඩිදෙනා බලා ඉන්නේ පිටරට ඉන්නා යහළු මිත්‍රාදීන් හෝ ඥාතීන් තමනට කතා කරන තෙක් ය. පිටරට වාසය කරන්නා ඔබට වඩා යහමින් මුදල් හොයන බව හැබෑය. එසේම ඔහු ඔබට වඩා වැඩියෙන් දුරකතන පහසුකම් සඳහා ද ගෙවනවා වන්නට ඇත.

කතාබහෙන් පසු සමුගන්නා ඔබට එය සමුගැන්ම බව කියා කතාව නතර කරන්නට මග පෑදීමක් අවශ්‍යය. "දැන් බිල හොඳට නැගල ඇති නේද?" යන්න මෙහිදී නිතර කියැවෙන්නකි. ඊට වඩා සුදුසු කතා බහෙන් පසු නැවතත් කතා කරන්නම් යන පොරොන්දුවක් හෝ තමන් කතිකා කර ගත් යමක ප්‍රගතිය අනාගතයේ දැන ගැනීමට පාදා ගන්නා මාර්ගයකි. ඒ සමගම කතාව නතර කරන්නට සරිලන සුභාශිංසනයක් කීම කතා බහේ යෙදෙන දෙදෙනාටම කතාවේ අවසානය බව පැහැදිලි වෙයි.

කණ්ඩායමක් හා එක්වන ඔබ පැත්තකට වී තම දුරකතනය කණේ රඳවා ගෙන සිටීම අශීලාචාරය. පිරිසක් හා එක්වන්නේ නම් එහි නැති අය හා කතා බහ තමා තනිව ඉන්නා විටෙක දී කරන්න. පිරිසක් හමුවට යන ඔබ අවධානය දිය යුත්තේ තමා අබියස ඉන්නා අයටයි. හදිසියේ නොදැන අමතන්නාට පසුව කතා කරන්නට වේලාවක් දෙන්න. බොහෝ අවස්ථාවල කාණ්ඩයක් හා එක්වන ඔබ අතේ ඇති දුරකථනය නිහඬ කර තැබීම වඩා ශීලාචාර ය.

නූතනයේ අපි එකිනෙකා හා කතා බහ වෙනුවට ළඟින් වාඩිගෙන එකිනෙකාට කෙටි පණිවුඩ යවන සමාජයකට පා තබමු. මෙයින් අපි එකිනෙකාට ළං වනවා වෙනුවට මනුෂ්‍ය ඇසුරෙන් තවත් ඈත් වෙමු. වදනින් කෙරෙන කතාවත් මුහුණෙන් දකින ඉරියව්වත් කෙටි පණිවුඩයකින් බෙදා ගනු නොහැකිය. තාක්ෂණයේ දියුණුව සබඳතා තහවුරු කරනු පිණිස තමා පරක්කු වෙනවා යැයි කියන්නට යොදා ගත්ත ද හිතවතා ළඟින් ඉන්නා කළ එය නිහඬ කළ යුතු ය.

## කෙනෙකු හඳුන්වා දීමේ චාරිත්‍ර

මගතොට දී හමුවන අය තමන් හා ගමනේ යෙදෙනා අයට හඳුන්වා දීම හොඳ සිරිතකි. පාරේ නැවතී කතා බහේදී තමා අසල ඉන්නා අය සහමුලින්ම අමතක කරන අය අප අතර ඇත. හමු වූ අය හා ආ ගිය තොරතුරු කතා බහෙන් පසු ඔහු නැවතත් ගමන යන අය සමග එක්වන්නේ ඒ අහවලානේ කියා ය.

කෙනෙක් ඔබට ඔහු හා ඉන්නා අය හඳුන්වා දී නැත්නම් මෙයා කවුද යැයි තමා දන්නා අය-ගෙන් අහන්න. හඳුන්වා දීම කළයුතු බව එවිට ඔහුට මතක් වනු ඇත.

වයස අනුව, තනතුරු අනුව අපි කෙනෙකු හඳුන්වා දිය යුතුය. ඔවුන් හමුවට යා යුතු ය. බාල වයසේ තැනැත්තා වැඩිමහල්ලා වෙත යා යුතු ය. උසස් තනතුරක් දරන්නා වෙත ඔහු යටතේ ඉන්නා යා යුතුය. ස්ත්‍රිය වෙත පුරුෂයා යා යුතුය. (ලෝක සමාජය පිළිගන්නේ එසේ ය) ගිහියා පූජ්‍ය පක්ෂය වෙතට ගොස් කතා බහ කළ යුතු ය.

**වාඩිගත් ඕනෑම කෙනෙකු තමා අසලට කිසිවෙකු එන විට නැගිටීම සිරිතකි. ඊට බාල මහළු ස්ත්‍රී පුරුෂ භේදයක් නැත.** පූජ්‍ය පක්ෂය අසලට යන්නා පමණක් ඔවුන්ගේ නැගිටීම බලාපොරොත්තු නොවෙති. ලොව මනුෂ්‍යයෝ සියල්ලෝම එක හා සමාන තත්වයෙන් සලකන බැවින් මෙසේ හිට ගැනීම චාරිත්‍රානුකූල සේ සැලකේ. තමා යටතේ සේවය කරන්නා හමුවේ නැගිට සිටීම ලොව බලවතුන් ඉටු කරන්නේ නිසි හැදියාව පෙන්වීමට ය.

ලොව සම්මතය නම් වඩා වැදගත් තැනැත්තාගේ නම මුලින් පවසා ඔහුට අනිකාව හඳුන්වා දීමයි.

**"ගුණවත් ගුණදාස මහත්මයා, මෙයා තමයි අපේ සභායට ඉන්න ගුණවතී ගුණසේන මහත්මිය. ගුණවතී ගුණසේන මහත්මිය, මේ තමයි අපේ සභාපති ගුණවත් ගුණදාස මහත්මයා".**

13 වන පිටුවට..

හික්මීම පදනම් කොටගත් සංස්කෘතින් බිහි වූයේ කෘෂිකාර්මික සමාජයෙනි. - ස්වාමි විවේකානන්ද

# நாளைய தினம், மலர்ந்த ஆண்டை விட வளமானது

(தொடர்ச்சி...)

இலங்கை துறைமுக அதிகாரசபையினுள் நடபெறும் ஊழல், மோசடிகளை நிறுத்துவதற்கு முகாமைத்துவம் நடவடிக்கைகள் மேற்கொள்வதில்லை என சென்ற ஆண்டினுள் தொழிற்சங்கங்களினால் பல தடவைகள் சுட்டிக் காட்டப்பட்டுள்ளது. ஆனாலும் இங்கு நிகழும், முறைகேடுகள் 100% முழுமையாக ஒரே தடவையில் நிறுத்தக்கூடிய செயற்பாடுகள் அல்ல. அவை நீண்ட வரலாறொன்றில் திட்டமிடப்பட்டு செய்யப்படும் நடவடிக்கைகளாகும். இந் நடவடிக்கைளை தவிர்த்துக் கொள்வதற்கு தொழிற்சங்கங்கள், முகாமைத்துவம், ஊழியர்கள் ஒன்றிணைந்து சேவையாற்ற வேண்டும். கடந்த வருடங்கள் பலவற்றில் நடைபெற்ற முறைகேடுகள் பற்றி கண்டறிந்து அதற்கு உடந்தையானவர்களுக்கு ஒழுக்காற்று நடவடிக்கை மேற்கொண்டமை முகாமைத்துவத்தின் வெற்றிகரமான செயற்பாடாகும். 2007 ஆம் வருடத்தினுள் பண்டாரநாயக்கா பாலம் பரீட்சிக்கப்பட்டு துறைமுகத்தை உபயோகிப்பவர்களால் துறைமுக விடயத்தில் செய்யப்பட்ட தவறுகள் கண்டறியப்பட்டுள்ளன. அது தொடர்பாக எடுக்கப்படவேண்டிய வழிவகைகள் குறித்து தெளிவான நிலைப்பாடொன்றுக்கு வந்துள்ளனர். இந்த நடவடிக்கைகளுக்கென ஆரம்பிக்கப்பட்ட விஷேட புலனாய்வுப் பிரிவு, உள்ளக கணக்காய்வுப் பிரிவு என்பவற்றை வலுப்படுத்தி இக் குறைபாடுகளை முடிந்தளவு தீர்ப்பதற்கான நடவடிக்கைகள் திட்டமிடப்பட்டுள்ளன. அதேபோல் எதிர்வரும் காலங்களில் கொள்வனவுப் பகுதியின் நிதி நிர்வாகம் தொடர்பாக கூடியளவு சட்டதிட்டங்களை வகுத்து தற்போது அத்துறையில் காணப்படும் குறைபாடுகளை குறைத்துக் கொள்ளவும் எதிர்பார்த்துள்ளோம்.

துறைமுக அகதிகார சபையின் இரும்பும் அதனுடன் தொடர்பான பொருட்களும் துறைமுக முகாமைத்துவம் மற்றும் சேவைகள் வழங்கும் நிறுவனத்தினூடாக விற்பனை செய்வதில் பலவித முறைகேடுகள் நடைபெறுவதாக தொழிற்சங்கங்களால் பல சந்தர்ப்பங்களில் குற்றஞ் சுமத்தப்பட்டுள்ளது. ஆனால் 2004 ஆம் வருடத்திற்கு முன்பு துறைமுக அதிகாரசபையில் இரும்பு ஓரிரு ரூபாய்களுக்கு விற்பனை செய்யப்பட்ட காலம் ஒன்றும் இருந்தது என்பதை அனைவரும் ஞாபகத்தில் வைத்துக் கொள்ளல் வேண்டும். தற்போது நடைமுறையிலிருக்கும் டென்டர் முறையும், விற்பனை நடவடிக்கைகள் நடைபெறும்போது காணப்பட்ட பிரச்சினைகளை இனங்கண்டு முகாமைத்துவ சேவை நிறுவனத்தின் ஒத்துழைப்புடன் துறைமுக அதிகார சபைக்கு உரிய விலை நிர்ணயிக்கப்பட்டு இதுவரை காலம் இலங்கை துறைமுக அதிகாரசபைக்கு கிடைக்கப்பெறாத பணத்தொகையினை மீண்டும் பெற்றுக்கொடுப்பதற்கு கடந்த காலத்தினுள் சந்தர்ப்பம் உருவாக்கப்பட்டது. முகாமைத்துவமானது இலங்கைத் துறைமுக அதிகாரசபைக்கு சேவையை வழங்குவதுடன் நட்டம் ஏற்படும் விதத்தில் எச்சந்தர்ப்பத்திலும் நடவடிக்கைகள் மேற்கொள்ளப்படமாட்டாது என்பதையும் தெரிவித்துக் கொள்கின்றேன்.

ஒப்பந்த அடிப்படையில் ஊழியர்களை உட்படுத்தும்போது துறைமுக ஊழியர்கள் உட்படுத்த முடியாமை மற்றும் விரும்பாத சேவைகள் என்பவற்றிற்கு மட்டும் முன்னுரிமை அளிப்பதோடு தனியார் மயப்படுத்தப்படும் எவ்வித எண்ணங்களும் தற்கால அரசிற்கோ, விடயப் பொறுப்பு அமைச்சரிடமோ, முகாமைத்துவத்திடமோ இல்லை என்பதை குறிப்பிட விரும்புகின்றேன். துறைமுக வரலாற்றினை உற்று நோக்கும்போது எமக்கு இவ்வாறான சந்தர்ப்பங்கள் ஏற்பட்டாலும் தற்போதைய முகாமைத்துவத்தினுள் அதற்கான எவ்வித கருத்துகளும் இல்லை என்பதை மீண்டும் மீண்டும் தெரிவித்துக்கொள்கிறேன். 2007 ஆம் ஆண்டு கழிந்து புதுவருடம் உருவாகியுள்ள இச் சந்தர்ப்பத்தில் இலங்கை துறைமுக அதிகாரசபை பெற்றுக்கொண்ட முன்னேற்றங்களும் ஊழியர்களுக்கு பெற்றுக்கொடுக்கப்பட்டுள்ள வரப்பிரசாதங்களின் முன்னேற்றம் எக்காலங்களுடனும் ஒப்பிட முடியாது. ஆயினும் சில தொழிற்சங்கங்களும் ஊழியர்களும் முகாமைத்துவத்தால் பெற்றுக் கொடுக்கப்பட்டுள்ள வரப்பிரசாதங்களை சந்தேகக் கண்கொண்டு பார்ப்பதற்கு ஊழியர்களை உட்படுத்தி அவர்களை தவறான வழிக்கு இட்டுச்செல்வதற்கு கையாண்ட முயற்சிகள் சென்ற வருடத்தினுள் காணப்பட்டது. தாம் கடமையாற்றும் நிறுவனத்திற்கு எந்தவித கரிசனையும் இன்றி தனிப்பட்ட நோக்கங்களை நிறைவேற்றிக் கொள்வதற்கு தயாராகும் இவ்வாறான நபர்கள் குறித்து பிறந்துள்ள புத்தாண்டில் ஊழியர்களாகிய நீங்கள் மிகு விழிப்புணர்வுடன் இருக்க வேண்டும். துறைமுக ஊழியர்களாகிய உங்களை எச்சந்தர்ப்பத்திலும் இடர்களுக்குள்ளாக்கும் எந்த நடவடிக்கைகளையும் எப்போதும் முகாமைத்துவம் மேற்கொள்ளாது என்பதை நம்பிக்கையுடன் தெரிவித்துக் கொள்கிறேன். ஆதலால் ஊழியகர்களாகிய உங்களதும் தொழிற்சங்கங்களினதும் நேரான நடவடிக்கைகள் பிறந்துள்ள 2008 ஆம் வருடத்தினுள் துறைமுக அதிகாரசபையின் எதிர்கால முன்னேற்றத்திற்கு வழிவகைகளை வித்திடும் வகையில் தெளிவுபடுத்திக்கொள்ள வேண்டும். என்பதை சகலரும் உணர்ந்துகொள்ள வேண்டும். ஆதலால் சகல நடவடிக்கைகளின்போதும் தெளிவுடன் செயற்படுவது முக்கியமாகும். முகாமைத்துவத்தினால் சென்ற ஆண்டினுள் ஊழியர்களின் கோரிக்கையை விட கூடியளவு வரப்பிரசாதங்கள் வழங்கப்பட்டுள்ளன. ஆயினும் அவர்களின் கடமைகள் சரிவர நிறைவேற்றப்படவில்லை என்பதைக் காணக்கூடியதாக உள்ளது. பல பகுதிகளில் பெரும்பாலான ஊழியர்கள் எந்தவித கடமையையும் செய்யாது சம்பளமும், மேலதிக நேரக் கொடுப்பனவும் பெற்றுக் கொள்ளும் நிலை காணக் கிடைக்கின்றன.

இன்னும் சிலர் பழைய சம்பிரதாய முறைகளையே கையாண்டு வருகின்றனர். நவீன தொழில்நுட்பம், புது உத்திகள் என்பவற்றை கையாள்வதில் ஆர்வம் காட்டுவதில்லை. இவ் எண்ணக்கருக்கள் விரைவில் மாற்றப்பட வேண்டும். அவ்வாறு செய்ய இயலாவிடின் எதிர்காலத்தில் உருவாகும் சவால்களுக்கு முகங்கொடுக்கக்கூடிய சிறந்த சூழலினை துறைமுக அதிகார சபையினுள் கட்டியெழுப்ப முடியாமல் போகும். ஆதலால் சகல சந்தர்ப்பங்களிலும் சரியான முடிவுகளை எடுப்பது மிக அவசியமாகும்.

தற்போது காணப்படும் முறை மாற்று வேலை முறையினை மாற்றியமைத்து வலயத்தில் செயற்திறன் மிக்க போட்டித் தன்மையிலான முனையமொன்றாக ஜயா கொல்கலன் முனையம் மாற்றியமைப்பதற்கும் ஊழியர்களாகிய நீங்கள் தேவையான ஒத்துழைப்பினை நல்க வேண்டும் துறைமுக செயற்பாடுகளை போற்றத்தக்க அளவில் கொண்டு செல்லும் பொறியியல் பகுதி உட்பட துமைமுகத்தின் ஏனைய பகுதிகளிலும் செயற்திறன் மிகு சேவையொன்றினைப் பெற்றுக்கொள்ளும் பொருட்டு நிறைவேற்றுத்தர உத்தியோகத்தர்களின் ஒத்துழைப்பினையும் முகாமைத்துவம் எதிர்பார்த்துள்ளமையை இங்கு குறிப்பிடுகின்றேன்.

துறைமுக ஊழியர்களுக்குக் கிடைக்கப்பெற்றுள்ள எந்தவித வரப்பிரசாதங்களை நீக்குவதற்கு முகாமைத்துவத்தினுள் எவ்வித எதிர்பார்ப்புகளுமில்லை. கடமைகள் புரியாது சம்பளம் பெற்றுக்கொள்பவர்கள் துறைமுகத்தை அபகீர்த்திக்கு உள்ளாக்குவோர்களுக்கு எதிராக கடும் நடவடிக்கைகள் மேற்கொள்வதற்கு தயங்கமாட்டோம் என்பதையும் தெரிவித்துக் கொள்கின்றேன்.

உப தலைவர் பிரியத் பந்து விக்கிரம
இலங்கை துறைமுக அதிகாரசபை
(நேர்காணல் - உப்புல் குருகே)

**Prepared by:
Farzana Makshood**

## ஒலுவில் துறைமுக நிர்மாணிப்புப் பணிகளுக்கான புரிந்துணர்வு ஒப்பந்தம் கைச்சாத்திடல்



ஒலுவில் துறைமுக நிர்மாணிப்புக்கான புரிந்துணர்வு ஒப்பந்தம் துறைமுக அதிகாரசபை-நிர்மாணிப்பு ஒப்பந்தக்காரர்களுக்கிடையே 13.03.2008 ஆந் திகதி இலங்கைத் துறைமுக அதிகாரசபையில் கைச்சாத்திடப்பட்டது. இந்தப் புரிந்துணர்வு ஒப்பந்தத்தில் இலங்கைத் துறைமுக அதிகாரசபை சார்பாக பதில் கடமைபுரியும் தலைவர் பிரியத் பந்து விக்கிரம அவர்களும் டென்மார்க் நிர்மாணிப்புக் கம்பனியான M.T. HOJGARD கம்பனியின் உப தலைவர் ஓலே ஸ்டீன் கிறிஸ்டன் அவர்களும் கைச்சாத்திட்டனர். 46.1 யூரோ மில்லியன் பெறுமதியுள்ள இத் திட்டம் 27 மாத காலத்திற்குள் நிர்மாணிப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளது.

அம்பாறை, மட்டக்களப்பு, மொனராகலை ஆகிய மாவட்டங்களும் உரித்தாகும் இலங்கையின் தென்கிழக்குப் பிரதேசம் ஏனைய பிரதேசங்களுடன் ஒப்பிடும்போது அபிவிருத்தியில் பின்தங்கியுள்ள பிரதேசமாகக் கருதப்படும். அபிவிருத்திக்குத் தடையாகவுள்ள பிரதான காரணிகள் பெருந்தெருக்கள் மற்றும் புகையிரதப் பாதை இன்மையே ஆகும்.

இலங்கை அரசு சகல விடயங்களையும் கருத்திற்கொண்டு பிரதேச பொருளாதார அபிவிருத்திக்கு உதவும்முகமாக ஒலுவில் துறைமுக அபிவிருத்தித் திட்டத்தினைச் செயற்படுத்துவதற்குத் திட்டமிடப்பட்டுள்ளது. ஒலுவில் துறைமுக அபிவிருத்தித் திட்டத்தின்கீழ் வணிகத் துறைமுகமொன்றாகவும் மீனவக் கலங்களின் வசதிக்கு ஏற்றவகையிலும் நிர்மாணிக்கப்படும்.

இவ்வொப்பந்தம் கைச்சாத்திடும் நிகழ்வில் இலங்கைத் துறைமுக அதிகாரசபையின் முகாமைப் பணிப்பாளர் W.G. சமரதுங்க, பணிப்பாளர் (தொழில்நுட்பம்) R.P. அபயகோன், துறைமுக விமான சேவைகள் அமைச்சின் மேலதிக செயலாளர் ரஞ்சித் த சில்வா, ஒப்பந்தக் கம்பனியின் திட்ட முகாமையாளர் பர் வின்தர் லாஸன் ஆகியோர்களும் கலந்துகொண்டனர்.

## ஒலுவில் துறைமுக நிர்மாணிப்பு பற்றி மக்களை அறிவூட்டும் கருத்தரங்கு



1994 ஆம் ஆண்டிலிருந்து பேச்சளவில் மட்டும் மட்டுப்பட்டிருந்த ஒலுவில் துறைமுக நிர்மாணிப்பு பணிகளுக்கான சகல நடவடிக்கைகளையும் இலங்கைத் துறைமுக அதிகாரசபை ஆயத்தமாக்கியுள்ளது. அது பற்றி பிரதேச மக்களை அறிவூட்டுவதற்கான விஷேட கருத்தரங்கு 2008.02.26 ஆந் திகதியிலிருந்து 29 ஆந் திகதிவரை ஒலுவில் பிரதேச பாடசாலை மாணவர்களுக்கு நடாத்தப்பட்டது.

துறைமுக, விமான சேவைகள் அமைச்சர் சமல் ராஜபக்ஷ அவர்களின் அறிவுறுத்தலுக்கமைய, இக் கருத்தரங்கு ஒழுங்கு செய்யப்பட்டதன் நோக்கம் இத் திட்டத்தினால் பிரதேச மக்கள் அடையும் நன்மைகள் பற்றிய அறிவினைப் பெற்றுக்கொள்ளவேயாகும். இவ்வாண்டினுள் இலங்கை துறைமுக அதிகார சபையின் முகாமைத்துவம் கடல்சார் வலயங்களின் போட்டித்தன்மைகளுக்கு ஏற்ற விதத்தில் தோளோடு தோள் நின்று உழைக்கும் பொருட்டு அதன் பிராந்தியத் துறைமுகங்ளை அபிவிருத்தி செய்வதற்கான நடவடிக்கைகளையும் மேற்கொண்டுள்ளது.

தொழில் உள்ள, தொழில் அற்ற ஏற்றத் தாழ்வுகள் மாற்றியமைக்கப்பட்டு 2010 ஆம் ஆண்டளவில் நேரடியானதும் மறைமுகமானதுமான ஆயிரம் தொழில் வாய்ப்புகளும் 2015 ஆம் ஆண்டளவில் பத்தாயிரம் தொழில் வாய்ப்புகளும் உருவா-கும். ஒலுவில் துறைமுக நடவடிக்கைகள் பூர்த்தியாவதோடு, துறைமுகத்தை அண்மித்து சீமெந்து, உரம், சீனி தொழிற்சாலைகளை அறிமுகப்படுத்துதல், பிரதேசத்தின் மீனவத் தொழிலுக்கு புத்துயிரோட்டம் வழங்குதல், சம்பிரதாய கப்பல் சரக்குகள் கையாளலை விரிவுபடுத்தி, பிரதேசத்தின் நெற்பயிர்ச் செய்கை, பால் உற்பத்தி உட்பட உள்ளூர் உற்பத்திகளுக்கு உயர்சந்தை வாய்ப்பொன்றை பெற்றுக் கொள்ளல் போன்ற இன்னோரன்ன நன்மைகள் இப்பிரதேச மக்களுக்குக் கிட்டும்.

துறைமுக நிர்மாணிப்பு வேலைகள் இரு கட்டங்களில் உள்ளடக்கப்பட்டுள்ளது. முதல் கட்டத்தினுள் 475m, 740m நீளங்களையுடைய அலைதாங்கிகளை நிர்மாணித்தல், 16 ஹெக்டயார் அளவினாலான நீர்த்தடாகம் ஒன்றை உருவாக்குதல், வணிகத் துறைமுக செயற்பாடுகள் மற்றும் மீனவ நடவடிக்கைகளுக்கு 10 ஹெக்டயார் அளவினாலான நீர் பரப்பொன்றை உருவாக்குதல், 5000 டொன் பாரமுள்ள கப்பல் செயற்பாடுகளுக்கு ஏற்ற விதத்தில் 8m ஆழத்தினாலான நீர்த்தடாகம் நிர்மாணித்தல், மீனவ வசதிகளுக்குத் தேவையான நடவடிக்கைகளை ஒருங்கினைத்தல், மீனவக் கலங்களுக்குத் தேவைப்படும் நீர், எரிபொருள் ஆகியன வழங்குவதற்கும் எதிர்பார்க்கப்பட்டுள்ளது. இரண்டாம் கட்ட நடவடிக்கைகளின்போது 16000 டொன் பாரமுள்ள கப்பல்களின் செயற்பாடுகளுக்கு ஏற்ற விதத்தில் தடாகத்தினை 11 மீற்றர் வரை ஆழமாக்குதலுடன் கப்பல் தளத்தினை 24 ஹெக்டயார் அளவு வரை விரிவு படுத்துவதற்கும் திட்டமிடப்பட்டுள்ளது.

நிந்தவூர் அல் அஷ்ரக் தேசிய பாடசாலை, அட்டாளைச்சேனை மத்திய மஹா வித்தியாலயம், சம்மாந்துறை முஸ்லிம் மத்திய கல்லூரி, சாய்ந்தமருது வர்த்தக சங்கம் போன்றவற்றில் நடைபெற்ற செயலமர்வுகளின்போது ஒலுவில் துறைமுக நிர்மாணிப்பின் முக்கியத்துவம் பற்றி ஒலுவில் துறைமுக திட்ட இணைப்புப் பொறியியலாளர் A.L.M நவுபர், திட்டமிடல் அதிகாரி M.M. நாகூர் தம்பி, பயிற்சி உத்தியோகத்தர் M.V. தாஹிர், சம்மாந்துறை மத்திய கல்லூரி அதிபர் M.M. பாரூக் போன்றோர் உரையாற்றியுள்ளனர்.



# අපේ සංගමය වරායේ 7 වෙනි තැනට පත්වෙලා

සාකච්ඡා සටහන
**කාව්‍ය ඉන්ද්‍රජිත්**

## සුනිල් රත්නසිරි

### සභාපති - තාක්ෂණික වෘත්තිකයින්ගේ සංගමය

**ඔබලාගේ සංගමය බිහිවූයේ කොහොමද?**

මම වරායට ආවේ 1999දී. එදා ඉඳලම මම දැකපු දෙයක් තමයි තාක්ෂණික ශ්‍රේණියේ ශිල්පීන්ට විශාල ගැටළු ප්‍රමාණයක් තිබීමත් ඒ සඳහා විසඳුම් ලබාදීමට ප්‍රධාන වෘත්තීය සංගම් දක්වන උනන්දුව අඩු කමත්. ඒ වෘත්තීය සංගම් වල දේශපාලන අරමුණු සමග අපේ අවශ්‍යතා ප්‍රමුඛ අවශ්‍යතා හැටියට අරගෙන කටයුතු කළේ නැහැ. අපේ අවශ්‍යතා ඉටු කර ගැනීමට අවශ්‍ය යම් සංවිධානයක අවශ්‍යතාවය පැන නැගුනේ ඔය අතරවාරයේ. අපේ තාක්ෂණික ශ්‍රේණියේ සේවකයින් කිහිප අවස්ථාවක හමුවෙලා අපි සාකච්ඡා කළා. ඒ අනුව තමයි 2006 අප්‍රේල් මාසයේදී ''තාක්ෂණික වෘත්තිකයින්ගේ සංගමය'' බිහි වුණේ. අද අපේ සංගමය තමයි වරාය අධිකාරියේ හත්වන තැනට තිබෙන වෘත්තීය සංගමය. අපේ සංගමයට දේශපාලන අරමුණු නැහැ. නමුත් සමහර සංගම් අපට චෝදනා කළා අපි එන්.ජී.ඕ වලින් යැපෙන එන්.ජී.ඕ. රූකඩ සංගමයක් කියලා. නමුත් අද අපේ සමස්ත සාමාජිකයෝ ම දන්නවා අපි ඉන්නා ස්ථාවරය. මීට පෙර එක් සංගමයක් තාක්ෂණික වෘත්තිකයින්ව දේශපාලන අතකොලුවක් කරගෙන හිටියට කිසිඳු සුගතියක් නොවී ම තමයි අපේ ගමනේ ආරම්භය.

**ඔබ කොහොමද වෘත්තිය සමිති නායකයෙක් වුණේ?**

මේ තමයි වෘත්තිය සමති ක්ෂේත්‍රයේ පළමු අත්දැකීම. වර්තමාන මෙම තනතුරට මාව පත් වුණේ නිතරගයෙන්. නමුත්, පාසල් අවධියේ ඉඳලම මට නායකත්වය පිළිබඳ අත්දැකීම් තිබුණා. මගේ පාසල ඕපනායක ගල්හිර විද්‍යාලය. මම එහි ශිෂ්‍ය නායකයෙකු වෙලා හිටියා. ජාතික තරුණ සේවා සභාවේ යෞවන සමාජ සම්මේලනයේ ප්‍රාදේශීය බල මණ්ඩලයේ සභාපති වෙලා හිටියා. ප්‍රාදේශීය මට්ටමේ නොයෙකුත් සමිති සමාගම් වල ප්‍රධාන තනතුරු උසුලලා තිබෙනවා. ඒ වගේම 1985 වන විට රත්නපුර දිස්ත්‍රික්කයේ හොඳම ''නිවේදකයා'' බවට මම පත් වෙලා හිටියා.

**සංගමයක් හැටියට ඔබලා ලබා තියෙන ජයග්‍රහණ මොනවාද?**

ප්‍රථමයෙන් අපිට හැකි වුණා තාක්ෂණික වෘත්තීන් හි නිරත සේවකයින්ට අභිමානයක් රැගෙන දෙන්න. ඒ යටතේ දැන් කිසිම තාක්ෂණික ශිල්පියෙක් ඇඟිලි අත්සන යොදන්නේ නැහැ. අපිට අධ්‍යක්ෂ (මානව සම්පත්) සමග සාකච්ඡා කොට එය ක්‍රියාවට නංවන්න හැකි වුණා. ඒ වගේම තමයි වර්තමාන ප්‍රගති යෝජනා පිළිබඳ නියාමන කමිටුව හරහා අපට විශාල ජයග්‍රහණ රැසක් අත් කර ගැනීමට හැකිවෙලා තිබෙනවා. ඒ යටතේ තාක්ෂණික ශ්‍රේණියේ අධි ශ්‍රේණියක් ඇති කිරීම, තනතුරු 89 තුළ යම් යම් තනතුරු වලට නොතිබූ විශේෂ ශ්‍රේණිය ඇති කිරීම, ශ්‍රේණි හා තනතුරු අතර වැටුප් විෂමතා වලට විසඳුම් ලබාදීම පියවරෙන් පියවර වැටුප් ගැලපීම, කම්කරු නොවන ශ්‍රේණියකට අන්තර්ග්‍රහණය කිරීම වැනි ජයග්‍රහණ ඉහත වාර්තාව එළිදැක්වීමත් සමග ලැබෙනවා. ඒ වගේම තාක්ෂණික ශ්‍රේණි සඳහා මෙතෙක් කාලයක් සමහර සංචාරක බංගලාවන් වෙන් කිරීමට හැකියාවක් තිබුණේ. නමුත් ඒ හිමිකම මේ වනවිට අපි ලබාගෙන තිබෙනවා.

> හම්බන්තොට පටන් අරන් තිබෙනවා. ඒ ගැන සතුටුයි. කොළඹ සම්බන්ධයෙනුත් යම් යම් යෝජනා ඇතිවෙමින් තිබීම සේවකයින් වශයෙන් අපිට සතුටුවෙන්නට පුළුවන්.

**ප්‍රගති යෝජනා පිළිබඳ නියාමන කමිටුව ඔබ දකින්නේ කොයි විදිහටද?**

මේක හොඳ ප්‍රවණතාවයක් අඩුපාඩු නැතුවා ම නොවෙයි. නමුත් සේවක ප්‍රශ්ණ සාකච්ඡා කිරීමට මෙය වේදිකාවක්. සාකච්ඡා මට්ටමේ පැවතුනත් අපි විශාල ජයග්‍රහණ සංඛ්‍යාවක් ලබාගෙන තිබෙනවා. අපි අපේ පූර්ණ සහයෝගය ලබා දීලා තිබෙනවා වගේම පාලනාධිකාරියත් ඔවුන්ගේ සහයෝගය ලබා දෙයි කියලා විශ්වාස කරනවා.

**වර්තමාන වරාය සංවර්ධනය ගැන කිව්වොත්....?**

මේක විශාල ආයතනයක් කොළඹ ගත්තොත් සංවර්ධනයට වඩා වැදගත් පවත්වාගෙන යාමට අවශ්‍ය ග්‍රැන්ට් දොඹකර පරිගණක පද්ධතිය තවම නැහැ. සංවර්ධනයේ පූර්ව අවශ්‍යතාවයක් තමයි පෙර අඩුපාඩු නොතිබීම. කොහොම නමුත් හම්බන්තොට පටන් අරන් තිබෙනවා. ඒ ගැන සතුටුයි. කොළඹ සම්බන්ධයෙනුත් යම් යම් යෝජනා ඇතිවෙමින් තිබීම සේවකයින් වශයෙන් අපිට සතුටුවෙන්නට පුළුවන්.

**ඔබලාගේ ඉදිරි සැලසුම් කොයි වගේද?**

අපේ වෘත්තියට බලපාන ගැටළු වලට තීරණාත්මක විසඳුම් අවශ්‍යයි. ඒවා ලබාගැනීමට ඇප කැප වෙනවා. වරාය දියුණුව වෙනුවෙන් අපි පෙනී සිටිනවා.




# පෝෂණය සහ ආහාර පිළිබඳ ආයුර්වේද සංකල්ප

වත්මනෙහි අපේ බෞද්ධ වන්දනාවට පාත්‍ර වී ඇති කළුතර දිස්ත්‍රික්කයේ අවසාන කෙළවර සහ අනෙක් අතින් සබරගමු පළාත ආරම්භ කෙරෙන පෙදෙසට අයත් පාහියංගල ගල්ලෙන අපේ ආදි මානවයා විසින් ආහාරයට ගන්නා ලදැයි සිතිය හැකි බෙල්ලන් පිළිබඳව පැහැදිලි සාක්ෂි දරය පුලුස්සා ආහාර කොටගත් වසර 37.000ක් ඉපැරණි මානවයා ගැන ඉතිහාසයේ සඳහන් වන අතර, කිතුල්ගල පෙදෙසෙහි ඇති බෙලි වනය නමැති විශාල ගල්ගෙය තුළ දැවැන්ත කුහරයක බෙල්ලන්ගේ කටු සමූහයක් දක්නට ලැබෙයි. එය ද ආදි මානවයා බෙල්ලන් ආහාරයට ගත් බවට වැදගත් සාක්ෂියකි.

රජවාසල කවටයෙකු වූ අන්දරේ සම්බන්ධයෙන් ආහාර පිළිබඳ කොතෙකුත් රස මුසු පුවත් අසන්නට ලැබෙයි. කුඹුරු යායක් අස්වැද්දීම සඳහා මහත් බාධකයක් වූ ගල්කුළක් ඉවත් කිරීම සඳහා පළමුව තමන් හීනටි හාලේ බත් සමග කළු කුකුළු මාළුත්, තිත්තයින් මැල්ලුමකුත් ආහාරය පිණිස ගත යුතු බව අන්දරේ පැවසී යැයි ඉතිහාසයේ සඳහන් වෙයි. මේ අනුව ලංකා ඉතිහාසයේ හීනටි හාලේ බත් සවිබල ඇති ආහාරයක් බව කියැවෙයි. එසේම කළු කුකුලු මාංශ ඉතා දුර්ලභ නමුත් පරිභෝජනය සඳහා ඇතැම් විට රාජභෝජනයට අඩංගුව තිබෙන්නට ඇතැයි සිතිය හැකිය. එසේම තිත්තයින් මැල්ලුම ද ජලාශ්‍රිත ආහාර භාවිතා කළ බවට සාක්ෂියකි. රජු ගේ කවටයා ලෙසින් රජවාසලට නිතර නිදහසේ යාම් ඊම් කිරීමට අවස්ථාව තිබූ එකම සාමාන්‍ය ගැමියා අන්දරේ වූවාට සැකයක් නැත. එහෙයින් ඔහු නිතරම රජවාසලට අභියෝග කළ බවට ඔහුගේ කියුම් කෙරුම් සාක්ෂි දරයි. එබැවින් මෙකල හීනටි හාලේ බත් මෙන්ම කළු කුකුළු මාංශ ද රාජභෝජන ලෙස පවතින්නට ඇත. අන්දරේ වක්‍ර මාර්ගයකින් රාජභෝජන ඉල්ලා සිටියා විය හැකිය. අනෙක් අතට ඔහු ඒ ආහාර ඇනවුම් කළේ මේසා විශාල කර්තව්‍යයක් සඳහා සිරුරට විශාල ශක්තියක් අවශ්‍ය බැවිනි. එබැවින් මේ සහල් වර්ගය සේම කළු කුකුළු මාංශ ද මහත් ශක්තියක් සිරුරට ගෙන දෙන ආහාරයක් බව පිළිගන්නට සිදු වෙයි. කළු කුකුළු මාංශ නමින් වර්ගයක් නැතැයි කෙනෙකුට තර්ක කළ හැකිය. එහෙත් මම ඒ තර්කය නොපිළිගනිමි. එයට හේතුව නම් මගේ ජීවිතයේදී මට එවන් කළු මස ඇති කුකුළෙකු ආහාරය සඳහා සූදානම් කිරීමේ දුර්ලභ අවස්ථාවක් ලැබී ඇති හෙයිනි.

එසේම ඉහතින් සඳහන් කළාක් මෙන් දුටුගැමුණු රජතුමාගේ යෝධයන් අද කාලේ මෙන් විටමින් හෝ උත්තේජක ශක්තියෙන් කටයුතු කළා නොවේ. ඔවුන් ගේ කාය ශක්තිය හුදෙක් කෑමෙන් බීමෙන් ලද ඒවා බව අවිවාදයෙන් පිළිගන්නට සිදු වේ. සිංහලේ අන්තිම රජු පිළිබඳ ඉතිහාසයේ කුමන කරුණු සඳහන් වන්නේ නමුදු ඔහු ගේ ආහාරයට නම් බත් කටවල් 32ක් සහ ව්‍යංජන 32ක් අඩංගු වූ බව ඉතිහාසයෙහි සඳහන් වෙයි. එහෙත් මේ ව්‍යංජන වර්ග 32 දෙතිස් අයුරකින් පිළියෙල කළේ ද යන්න පිළිබඳ ව පැහැදිලි සාක්ෂි මෙතෙක් ලැබී නැති අතර, දළදා මාලිගයේ සකස් වෙන ආහාර වට්ටෝරුව අනුව එය දෙතිස් ආහාර ක්‍රමයක් නොව හුදෙක් ද්‍රව්‍යමය වෙනසක් පමණක් බව පිළිගැනීමට සිදුවෙයි.

ශ්‍රී ලංකාවට ආහාර පිළිබඳ ශ්‍රේෂ්ඨ අතීතයක් ඇති වීමට ප්‍රධාන හේතුව ආයුර්වේදය විය හැකිය. රුවන්වැලි, ජේතවන ආදී මහා දාගැබ් ද, මින්නේරිය, පදවිය වැනි මහා ජලාශයන් ද වැනි යෝධ කර්මාන්ත කිරීමට ඥාණ ශක්තියක් හා කාය ශක්තියක් ලැබුණේ ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රයෙන් ආභාසය ලැබූ නිසාය. ආහාර පිසීම, අනුභවය ආදිය පිළිබඳ සෞඛ්‍ය සහ සදාචාර නීති ආයුර්වේදයෙන් ඉගැන්වෙයි.

ඒ අනුව ආහාර පිසින කුස්සිය හෙවත් මුළුතැන්ගෙය හෙවත් නිවසක මුල් තැන ගන්නා ස්ථානය මහාසන, හෙවත් රසවතී යනුවෙන් ආයුර්වේදයෙහි සඳහන් වෙයි.

1. ආහාර පිළියෙල කිරීම
2. අරක්කැමියා
3. අනුභව කරන්නාට රුචි කරවන ලෙස රස, ගන්ධ, ස්පර්ශ ආදියෙන් අනූනව ආහාර පිළියෙල කිරීම
4. පිසින ලද ආහාරය කෑම වේලාව එනතුරු පිවිතුරු ලෙස වසා තැන්පත් කර තැබීම
5. ආහාර පිසීමට සහ බෙදීමට ගත යුතු භාජන
6. ආහාර අනුභවයට සුදුසු ස්ථාන
7. අනුභව කරන්නාට කෑම පිළිගැන්විය යුතු ආකාරය
8. අනුභවයට වාඩි විය යුතු ආකාරය
9. පළමුව, දෙවනුව, තෙවනුව අනුභව කළ යුතු රස ආහාර

ආදී වශයෙන් අනුගමනය කළ යුතු සදාචාර උපදේශ පද්ධතියක් ආයුර්වේදයෙහි පෙන්වා දෙයි.

**අනුභවය පිළිබඳ සිරිත් විරිත්**

වාස්තු විද්‍යාව අනුව භූමිදෝෂ රහිත, මනහර, ආහාරවලට දූවිලි, කුණු රොඩු පතිත වීමට අවකාශ නැති, ජනයා රහිත නොහොත් ජනාකීර්ණ නොවූ, පිවිතුරු සමතලා තැනෙක්හි අනුභවය සඳහා වාඩිවෙන අසුන පනවා, සුවඳ මලින් සරසා ගත යුතුය. සුවපහසු අසුනක ඍජු ව තැන්පත්ව වාඩි විය යුතුය. ඊර්ෂ්‍යා, භය, ශෝක, ක්‍රෝධ, ද්වේශ ආදී කෙලෙස් සිතිවිලි වලින් නිදහස් විය යුතුය. ආහාරයටම සිත යොමු කළ යුතුය. සන්සුන් ව අනුභව කළ යුතුය. සිත්කලු, පිවිතුරු බඳුන් හි බහාලූ බත් ව්‍යංජන හා මැල්ලුම් වළඳන්නාහු ගේ ඉදිරිපසින් තැබිය යුතුය. බැදුම් සහ පලතුරු දකුණු පසින් තැබිය යුතුය. දියාරු ගතිය වැඩි සුප් වැනි බොන දේවල් වම් පසින් තැබිය යුතුය. පැඟිරි-ලුණු-ඇඹුල් මිශ්‍රිත පලතුරු යූෂ හා පුඩිං ජාති මැදින් තැබිය යුතුය. නැතහොත් සේවකයෙකු විසින් පිළිගැන්වීම ශිෂ්ඨ සම්මතයි. ද්‍රව පදාර්ථ බීමට ගන්නා භාජන විසිතුරු සිත්තමින් අලංකාර විය යුතුයි.

අනුභව කරන ආකාරය

පළමු ව මිහිරි දේ ද, දෙවනුව ඇඹුල්, ලුණු රස දේ ද, තෙවනුව නොහොත් අවසන්හි වෙනත් රස දේ ද, එසේත් නැතහොත් පළමුව දෙළුම් ආදී දේ ද ඉන්පසු බොන දෑ ද, අවසන්හි කන දෑ ද යන පිළිවෙලට ආහාර අනුභව කරන්නේය.

ආයුර්වේදයේ සඳහන් වන අන්දමට සියලු ප්‍රාණීන් ගේ උපත, බලය, වර්ණය හා ඕජස ආහාරය නිසාම සිදු වෙයි. දරුගැබක් පෝෂණයටත් මව අනුභව කරන ආහාර ම හේතු වෙයි. ආයුර්වේදයේ සඳහන් වන්නේ හිත-සම-පංච භෞතික ආහාර පිළිබඳවයි.

ඒ නමින් හඳුන්වන්නේ

1. පෝෂණයට
2. පැවැත්මට
3. සෞඛ්‍යයට

අදාළ අංග සම්පූර්ණ ආහාරයයි.

හිත ආහාර යනුවෙන් දැක්වෙන්නේ සිරුරේ ප්‍රකෘති තත්වය එසේම ආරක්ෂා කරන්නට සමත්වන, සිරුරේ විෂම බවක් ඇත්නම් එය සමනය කිරීමට හේතු වන ආහාරයයි.

ද්‍රව්‍ය වශයෙන් හිතකර වූ ආහාර එහි මෙසේ දැක්වෙයි: වී ආදී ශූක ධාන්‍ය මුං ආදී ශිම්බි ධාන්‍ය සහ ලවණ, මාංශ, ශාක, තෛල ශර්කරා මේ හිත ආහාර ගණයට අයත් වෙයි.

ශරීරයේ පැවැත්මට හේතු වන ද්‍රව්‍ය අතරෙන් බත ශ්‍රේෂ්ඨය. සිරුරට සැනසීම ලබාදෙන ද්‍රව්‍ය අතුරෙන් ජලය ශ්‍රේෂ්ඨ ය වෙහෙස දුරුකරන (ශ්‍රමහර) ද්‍රව්‍ය අතරෙන් සුරා ද, ජවනීය හෙවත් ජීවිතය පවත්වාලන ද්‍රව්‍ය අතුරෙන් කිර ද, සිරුර සන්තර්පණය කරන ද්‍රව්‍ය අතුරෙන් මස් ද, බලකාරක ද්‍රව්‍ය අතුරෙන් කුකුල් මස් ද, සෙම්පිත් වාපිත් සමනය කරන ද්‍රව්‍ය අතුරෙන් මී පැණි සහ ගිතෙල් ද අග්‍රගණ්‍ය ලෙස එහි දක්වා තිබේ. සංතුලිත හෙවත් හිතභෝජනය ඉන්ද්‍රිය සංවරයෙන් යුතුව වළඳන තැනැත්තේ නීරෝගීව රාත්‍රී තිස්හයදාහක් (සියවසක්) ජීවත් වෙයි.

**විශේෂ ස්තුතිය**
**ප්‍රවීන සූපවේදී පබිලිස් සිල්වා මහතා**

# ටෙලි නාට්‍ය හා රාත්‍රී භෝජනය

ගෙදර දොර වැඩ පසෙකලා, බත් වෙනුවට පාන් බුදින්නට සිතා ගෙන, රූපවාහිනිය ඉදිරියේ නාට්‍ය බැලීමට පවුල් සැදී පැහැදී සිටින අද සමාජයේ බොහෝ දෙනෙකුට අඩ පැයකින් විනාඩි දොළහක් තමන් නැරඹුවේ වෙළඳ දැන්වීම් බව නොදැනී ඇත්තේ කාගේ අවාසනාවට ද?

මෙම වෙළඳ දැන්වීම් හා ටෙලි නාට්‍ය බොහෝමයක් පවුලේ සැමට එකට සිට නැරඹීමට හැකි ද යන්න ප්‍රශ්නාර්ථයකි. අවසානයේ ඒවායින් ගැනීමට දෙයක් නොමැත. ද්වේශය, වෛරය, පළිගැනීම, පාතාල ක්‍රියාකාරකම්, අනියම් සබඳතා ආදිය නම් මේවායින් හොඳින් ඉගෙන ගත හැකි ය. බත් වෙනුවට පාන් කෑමත්, ගෙදර දොර වැඩ අතපසු කිරීමත්, ප්‍රවෘත්ති වෙනුවට නාට්‍ය බැලීමත් නිසා ඇති වන ගැටුම් නිසා පවුල් අවුල් කර ගැනීමත්, දරුවන්ගේ අධ්‍යාපනය වල පල්ලට යාමත් අද වලක්වාගැනීම අපහසු වී ඇත.

මිනිසාට රසාස්වාදය අවශ්‍ය බව සැබෑ ය. එහෙත්, තෝරාගත් උසස් රසවින්දනයක් සහිත වැඩසටහන් වලට සිත යොමු නොකර, සතියේ දින පහේ ම මනස විකෘති කරන, අග - මුල - මැද නැති ටෙලි නාට්‍ය නැරඹීමෙන් ජීවිතයට ලබා ගත හැකි රසාස්වාදය හෝ ජීවිතයට එක් කර ගත හැකි මානුෂික හෝ ආධ්‍යාත්මික ගුණාංග කුමක් ද යන්න සිතා බැලීමට දැන් කාලය පැමිණ තිබේ.

'කාලය රන් හා සමානයි' යනුවෙන් කියමනක් තිබේ. එවන් වටිනා ඔබේ කාලය, කා දමමින්, රූප පෙට්ටිය ඉදිරියේ කෙළවරක් නැති නාට්‍ය හා වෙළඳ දැන්වීම් වෙත දෙනෙත් අලවාගෙන සිටින ඔබට රාත්‍රී ආහාර වේලේ රසයවත් දැණුනා ද?

**නිශ්ශංක - විගණන**

## වරායේ ගිනි නිවන්නේ....

16 වන පිටුවෙන්

වැලැක්වීම ට පියවර ගැනීම
මෙය ද වරාය ගිනි නිවන හමුදාවෙන් ඉටු-කෙරෙන තවත් ප්‍රධාන කාර්යයක් වන අතර, සමුද්‍ර දූෂණය වැලැක්වීමේ අධිකාරිය හා එක්ව මේ සඳහා විශේෂ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.
දූනට වරාය හා ඒ අවට ඇති විය හැකි දූෂණයන් වැලැක්වීමට අවශ්‍ය උපකරණ ද වරාය ගිනි නිවන හමුදාව සතුව පවතී. මෑතක දී ගාල්ල වරාය ආශ්‍රිතව ඇතිවූ තෙල් කාන්දුව සැලකිල්ලට ගනිමින් හදිසි අවස්ථාවක දී ගාල්ල වරායේ ආරක්ෂාව සඳහා තෙල් වරාය තුළට පැතිරීම වැලැක්වීම ට අවශ්‍ය Oil Boom ප්‍රමාණය ද සපයා දීම ට වරාය පාළනාධිකාරිය අනුමැතිය ලබා දී ඇත.

**මේෂා ගිනි නිවන යාත්‍රාව**
ගිනි නිවීමට අදාල සියළු ම අංගෝපාංග යන්ගෙන් සමන්විත ගිනි නිවන යාත්‍රාවක් ද වරාය ගිනි නිවන හමුදාව සතු ය. මෙහි ඇති ගිනි නිවීමේ පහසුකම් අතර, හයිඩ්‍රොලික් මගින් ස්වයංක්‍රීයව මෙහෙයවිය හැකි දිගු කළ හැකි ටවරයක් ද, පෙන සානද්‍රනය ලීයර් 16000ක් ද වියළි රසායනික කුඩු කි.ග්‍රෑ 2000ක් ද ඇත.

### 02. ගිනි වැලැක්වීමේ කටයුතු

ගිනි ආරක්ෂණ හා නිරාපද කටයුතු

වරාය අධිකාරියේ ඇතිවිය හැකි ගිනි හා හදිසි අවස්ථාවන් වැලැක්වීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී.

මෙහි දී මූලික වශයෙන් අනතුරු හඳුනා-ගැනීම, තක්සේරු කිරීම හා අවම කිරීම ට ක්‍රියා කිරීම සිදු වේ. වරාය අධිකාරියේ ඇති සියළු ම ගොඩනැගිලි දළ සැලසුම් සකස් කර, ඒ මත අදාල ගිනි ආරක්ෂණ උපකරණ ස්ථානගත කිරීම පිළිබඳ ලකුණු කර, සෑම ගොඩනැ-ගිල්ලක් සඳහා ම විශේෂ අංකයක් ද එයට අදාල ලිපි ගොනුවක් ද සකස් කර ඇත.

දිනපතා එක් කණ්ඩායමක් එම ගොඩනැගිලි පරීක්ෂා කිරීම, අවශ්‍ය උපදෙස් ලබා දීම, ගිනි නිවන උපකරණ නැවත පිරවීම, ගිනි නිවන උපකරණ ස්ථානගත කිරීම ආදී කටයුතු සඳහා අනුයුක්ත කරණු ලැබේ. මෙම වැඩපිළිවෙළ මගින් වරාය තුළ ඇති සෑම ගොඩනැගිල්ලක් ම මැස 6කට වරක් පරීක්ෂාවට ලක් කෙරේ.

ගිනි ආරක්ෂව පිළිබඳව වරාය සේවකයන් දූනුවත් කිරීමේ වැඩපිළිවෙළ වරාය අධිකාරියේ සෑම සේවා ස්ථානයක් ම ආවරණය වන පරිදි හදිසි ගින්නක දී ගතයුතු ක්‍රියාමාර්ග හා ගිනි නිවන උපකරණ හඳුනාගැනීම හා භාවිතා කිරීම පිළිබඳ දූනුමක් ලබා දී ප්‍රායෝගිකව දූනුවත් කිරීම් ද සිදු කරනු ලබයි.

ගිනි නිවන හමුදාවක සාර්ථකත්වය රඳ පවතින ප්‍රධාන ම සාධකය නම් එම භට කණ්ඩායම් වලට ලබා දෙන ක්‍රමවත් පුහුණුවයි.

ඒ අනුව වරාය ගිනි නිවන හමුදා සේවකයන් හට ඕනෑම හදිසි අවස්ථාවක ට මුහුණ දීම ට අවශ්‍ය පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. මෙහි දී ලබා දෙන විශේෂ පුහුණු වීම් අතර, Confined Space Rescue/ High Angle Rescue/ Haz-Mat Response අදිය ද වේ.

මෑතක දී තවත් ඉදිරි පියවරක් තබමින් කොළඹ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව එක්ව ක්‍රියාත්මක කරන 110 හදිසි ගිලන් රථ සේවාව සඳහා පුහුණුවීම් හා උපකරණ ලබා දුන් ජාත්‍යන්තර වෛද්‍ය කණ්ඩායම මගින් හදිසි අවස්ථා වල දී පුද්ගලයින් බේරා ගැනීමට අදාල ක්‍රමවේදයන් පිළිබඳවත්, එවන් අවස්ථා වල දී අනතුරට පත්වූවන් ට තවදුරටත් හානි වීම වලක්වා රෝහලට රැගෙන යනතුරු ස්ථාපිත කිරිම පිලිබඳවත් විශේෂ පුහුණුවක් වරාය ගිනි නිවන හමුදාව වෙත ලබා දීමට එකඟ වී තිබේ.

මෙම වැඩසටහනෙ හි පළමු කණ්ඩායම පුහුණු කිරීම පසුගිය මාර්තු 10 සිට 14 දක්වා මහ-පොළ අභ්‍යාස ආයතනයේ දී ඉතා සාර්ථකව පැවැත්වුනු අතර, දෙවන කණ්ඩායම අප්‍රේල් 21 සිට 25 දක්වා පුහුණු කිරීමට විධි විධාන යොදා තිබේ.

මේ අනුව බලන කළ වරාය ගිනි නිවන හමුදාව තවදුරටත් ගිනි නිවීම් පමණක් සිදු කරන සාම්ප්‍රදායික ගිනි නිවන ඒකකයක් නොව ඉන් ඔබ්බට යන වරාය, කොළඹ නගරය හා පොදු මහජනතාව ට අමිල සේවයක් ඉටු කරන හදිසි සේවයක් "Emergency Service" වශයෙන් හැඳින්වීම නිවැරදි ය.

## 2008 මාර්තු .......

01 වන පිටුවෙන්

අධිකාරියේ අදාල කාල සීමාව සඳහා වන මෙහෙයුම් ධාරිතාව බහලු ඒකක 167,683ක් වන අතර එස්.ඒ.ජී.ටී. පර්යන්තයේ බහලු ඒකක 149,284ක් වෙයි. මීට පෙර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හා එස්.ඒ.ජී.ටී. පර්යන්තයේ ඉහළ ම බහලු ධාරිතාවයන් 2007 ඔක්තොම්බරයේ දී වාර්තා වූ අතර එම ප්‍රමාණයන් පිළිවෙළින් බහලු ඒකක 165,043 ක් හා 147,772ක් ද වෙයි.

කොළඹ වරාය සඳහා නව පරිගණක පද්ධතීන් හඳුන්වා දීම හා අමතර මෙහෙයුම් උපකරණ ස්ථාපනය කිරීමත් සමග කොළඹ වරාය මේ වන විට ලොව සුවිසල් නෞකා සේවාවන් හා සමාගම් හි දැඩි විශ්වාසය ද දිනා ගනිමින් කලාපීය සමුද්‍රික ප්‍රවාහනයේ කේන්ද්‍රස්ථ වරායයක් බවට පත් වෙමින් සිටී.

## ඔලුවිල් වරාය...

01 වන පිටුවෙන්

අම්පාර මඩකලපුව හා මොණරාගල යන දිස්ත්‍රික්ක ද අයත්වන ශ්‍රී ලංකාවේ අග්නිදිග කලාපය අනෙක් කලාපයන් හා සන්සන්දනාත්මක ඌන සංවර්ධන කලාපයක් ලෙස සැලකෙන අතර, මහා මාර්ග හා දුම්රිය මාර්ග පහසුකම් වැනි අත්‍යවශ්‍ය යටිතල පහසුකම් නොමැති වීම මෙහි සංවර්ධනයට එරෙහිව පවත්නා ප්‍රධාන බාධක වෙයි.

මේ සියලු කරුණු සැලකිල්ලට ගෙන කලාපයේ ආර්ථික සංවර්ධනයට සක්‍රිය ලෙස දායක වීම පිණිස ඔලුවිල් ප්‍රදේශයේ ඔලුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතිය දියත් කිරීමට ශ්‍රී ලංකා රජය විසින් සැලසුම් කොට තිබේ. ඔලුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වාණිජ වරායයක් සේ ම ධීවර යාත්‍රාවන්ට පහසුකම් සැලසෙන පරිද්දෙන් ද පහසුකම් ඉදිකෙරෙනු ඇත.

ඔලුවිල් වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ කලාපයේ අවශ්‍යතාවයන් සඳහා සුදුසු තත්ත්වයේ පහසුකම් සැපයීම සහ මුහුදු තීරයේ මගී ප්‍රවාහන පහසුකම් සැපයීම ද වේ. එය අනාගතයේ දී වඩා විශාල වරායයක් ලෙස ව්‍යාප්ත කිරීමට ද නියමිත ය. මේ අතර ඔලුවිල් වරාය මගින් වත්මන් සහ ඉදිරියේ සැලසුම් කර ඇති ධීවර කටයුතු සඳහා ද වෙරළ ආශ්‍රිත පහසුකම් සැලසෙනු ඇති අතර කලාපීය කර්මාන්තයන් හි සංවර්ධනයට අවශ්‍ය සේවා ද සැපයෙනු ඇත.

තව ද කලාපයේ සේවා නියුක්ති හා සේවා වියුක්ති පරතරය වෙනස් කළ හැකි තීරකයක් ලෙස 2010 වන විට සෘජු හා වක්‍ර ලෙසින් රැකියා අවස්ථා 1000ක් පමණ හා 2015 වන විට රැකියා අවස්ථා 10000ක් පමණ බිහි වේ. වරාය ආශ්‍රිතව සිමෙන්ති, පොහොර, සීනි ආදී කර්මාන්තයන් ඔලුවිල් ප්‍රදේශයට හඳුන්වාදීම, ප්‍රදේශයේ ධීවර කර්මාන්තයට නව ජීවයක් සැලසීම, සම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම් ව්‍යාප්ත කිරීම තුළින් ප්‍රදේශයේ වී ගොවිතැන, කිරි නිෂ්පාදනය ඇතුළු දේශීය නිෂ්පාදනයන් ට ඉහළ වෙළඳපලක් ලබා ගැනීම ආදී වාසි රැසක් ඔලුවිල් වරාය ඇරඹීමත් සමඟ ප්‍රදේශවාසීන්ට අත් වේ.

අදියර දෙකකින් සමන්විත ඔලුවිල් වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර තුළ මීටර් 475ක හා මීටර් 740ක දිගින් යුත් දියකඩනය ඉදිකිරීම, හෙක්ටයාර 16ක වපසරියකින් යුත් ජලතටාකයක් ඉදිකිරීම, වාණිජ වරාය ක්‍රියාකාරකම් හා ධීවර කටයුතු සඳහා හෙක්ටයාර 10ක ජල ප්‍රදේශයක් යොදා ගැනීම. ටොන් 5000ක් බරැති නෞකාවන් හසුරුවාලීමට හැකිවන පරිදි මීටර් 8ක ගැඹුරකින් ජල තටාකය ඉදිකිරීම, ධීවර පහසුකම් සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය, ධීවර යාත්‍රා වෙත අවශ්‍ය ජලය, ඉන්ධන ආදිය සම්පාදනය කිරීමට අපේක්ෂිත අතර, දෙවන අදියර තුළ ටොන් 16000ක බරකින් යුත් නෞකාවන් හසුරුවාලීමට හැකිවන පරිදි තටාකයේ ගැඹුර මීටර් 11 දක්වා වර්ධනය කිරීම නෞකා තටාකය,හෙක්ටයාර 24 දක්වා පුළුල් කිරීමට අපේක්ෂිත ය.

පසුගිය දා, විශේෂයෙන් ම වරාය හා ගුවන් සේවා ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගෙ උපදෙස් පරිදි ප්‍රදේශවාසී ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව පූර්ව දූනුමක් ලබා දීමේ අරමුණින් පාසල් සිසුන් ද ඉලක්ක කර ගනිමින් සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීමට කටයුතු යොදා තිබිණි.

2008.03.13 දින පැවැති මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ අවස්ථාවට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමණාකාර අධ්‍යක්ෂ ඩබ්ලිව්.ජී. සමරතුංග, අධ්‍යක්ෂ (තාක්ෂණ) ආර්.පී. අබයකෝන්, වරාය හා ගුවන් සේවා අමාත්‍යංශ අතිරේක ලේකම් රංජිත් ද සිල්වා සහ කොන්ත්‍රාත් සමාගමේ ව්‍යාපෘති කළමණාකරු පර් වින්තර් ලාසන් (Per Vinther Larson) යන මහත්වරුන් ද සහභාගී වූ හ.

## කැරම් ක්‍රීඩාවෙන්...

15 වන පිටුවෙන්

අමිතා - ඇත්තටම කාන්තා නියෝජනය හරිම අල්පයි. මම පමණයි මේ ක්‍රීඩාවට මේ වෙනතුරු නියැලී සිටින්නේ.

හෙට දවසේදීත් වරාය අධිකාරියෙන් කැරම් ශූර-ශූරියන් බිහිකිරීමට කිනම් ආකාරයේ කටයුතුද සිදු කළ යුත්තේ?

විරාජ් - අපිවත් වරායට බඳවා ගත්තේ වරාය අධිකාරිය වෙනුවෙන් ක්‍රීඩා කිරීම සඳහා. ඒ අයුරින් රැකියා විරහිත නවක දක්ෂ ක්‍රීඩකයන් වරාය අධිකාරියට බඳවාගෙන පුහුණු කිරීම් කටයුතු සර්ථකව ලබාදීමෙන් හෙට දවසේදීත් කැරම් ක්‍රීඩාවෙන් වරාය අධිකාරියට කීර්තියක් ගෙන ඒමට හැකිවේවි.

මවක්, ගෘහණියක්, බිරිඳක් ලෙසින් මෙ-න්ම ක්‍රීඩිකාවක් ලෙසින් කොහොමද ජීවිතය සමබරව ගෙන යන්නේ?

මගේ සැමියාගෙන් නොමද සහායක් ලැ-බනවා. මේ වන විට මගේ කැරම් ජීවිතයට අවු. 42ක් වෙනවා. ඉන් අවු 20ක් ජාතික ශූරතාවය දිනාගෙන තිබෙනවා. මගේ ක්‍රීඩා දිවියට මෙ-න්ම පවුලේ කටයුතු වලට ද මගේ මවගෙනුත් හොඳ සහායක් ශක්තියක් ලැබෙනවා.

කැරම් ක්‍රීඩාවේ නියැලීමේදී මුහුණ දෙන අභියෝග ගැටළු පිළිබඳව කථා කළොත්?

සෙනසුරාදා, ඉරිදා දිනයන්හි තමයි බො-හෝමයක් තරග පැවැත්වෙන්නේ. ඒ නිසා බොහෝ වේලාවට සති අන්තය ගතවෙන්නේ කැරම් බෝඩය හා ඉත්තන් සමග. ඒ තුළින් පවුලේ සාමාජිකයන් සමග එකට ගත කිරීමේ කාලය හරිම අඩුයි.

අමිතා - ජීවිතයෙන් භාගයක්ම මේ ක්‍රීඩාවට කැප කරලා තමයි මේ තරම් දුරක් ආවේ. විරාජ් කිව්වා වගේම පවුලේ කට්ටිය එක්ක ගත කරන කාලෙත් අපි ක්‍රීඩාවට කැප කරලා තිබෙනවා. ඒ වටපිටාව අවබෝධ කරගත් සැමියෙකු හා දරුවන් සිටීම මං ලැබූ භාග්‍යයක්.

කැරම් ක්‍රීඩාව තුළින් හෙට දවසේ ඔබේ අපේක්ෂාවන්

විරාජ් - උච්චතම අවස්ථාවක් උදාකරගෙන තියෙනවා. එය රැකගැනීමයි වැදගත් වන්නේ.

අමිතා - දිනාගත් අනුශූරතාවය රැකගනිමින් කාන්තා ලෝක ශූරතාවය දිනා ගැනීමට කටයුතු කරනවා.

විදෙස් රටකින් මේ ක්‍රීඩාව වෙනුවෙන් ආරාධනයක් ලැබුණොත් එරට වෙනුවෙන් ක්‍රීඩා කරීමට?

විරාජ් - විදෙස් ගත වූ අවස්ථා කිහිපයකදීම එවැනි ආරාධනා ලැබුණා. නමුත් මගේ නම් එහෙම බලාපොරොත්තුවක් නෑ කිසිම දවසක.

අමිතා - මමත් එහෙමයි. අපි ක්‍රීඩා කළ යුත්තේ අපේ රටට කීර්තියක් ගෙන දීමටයි.

## ආචාරශීලී....

10 වන පිටුවෙන්

හඳුන්වා දීමකදී කෙනෙකුගේ සම්පූර්ණ නම පාවිච්චි කරන්න. දෙදෙනාගේම නම් දෙ-වරක් කීමෙන් ඔවුනොවුන්ට නම් මතක තබා ගැනීමට ද හරියාකාරව නොඇහුණු නමක් යළි අසන්නට ද ඉඩ කඩ ලැබෙයි. නම කළින් සොයා ගන්නට නොහැකි වූයේ ද දෙදෙනා හඳුන්වා දීමට පෙර ඉක්මනින්ම මුළු නම අසා දූනගන්න.

වයසින් පරිණත තැනැත්තාට බාලයාව ද, කාන්තාවට පුරුෂයාව ද පූජ්‍ය පක්ෂයට ගිහි-යාව ද යනාදී වශයෙන් හැඳින්වීම කෙරෙයි. තත්වයන් හා නිලතල සැක සහිත අවස්ථා වල වයසට මුල් තැන දෙන්න. නිතරම බාල වයස් කරුවාව වැඩිමහල් පුද්ගලයාට හඳුන්වා දෙන්න.

ආමන්ත්‍රණයේ දී තමනට අනුමතය ලැබෙන තුරු කෙනෙකුගේ මුල් නමෙන් අමතන්න එපා. අද ලෝකයේ අපි මුල් නමෙන් කෙනෙකු හා කතාබහට ඉක්මන් වෙමු. එහෙත් අපි අතර ඉන්නා තවත් කෙනෙක් ඊට අකමැති වනු ඇත. පසුව ඇතිවන්නට හැකි මදි පාඩුකම් මග හරවා ගන්නට කෙනෙකුගේ මුල් නම ආමන්ත්‍රණය සඳහා යොදා ගන්නට අවසර ලැබෙන තෙක් ඉවසන්න.

පූජ්‍ය පක්ෂයට ඔවුන්ගේ නිල නාම සොයා අමතන්න. සාදු කියන්නේ ආශිර්වාදයකි. බෞද්ධ හිමිනමක් ඔබ ඇමතිය යුත්තේ ස්වාමීන් වහන්ස කියාය. හාමුදුරුවනේ, හන්තේ, මහාචාර්ය පණ්ඩිත යනාදී ගරු නාම ඇති සැටියෙන් ඔවුන් ඇමතීම සඳහා උපයෝ-ගී කර ගත යුතුයි. ෆාදර්, බ්‍රදර් යන නාම වලින් කතෝලික පූජකවරයන් හැඳින්වෙන අතර ඔවුන්ගේ තනතුරු අනුව අගගුරු ආදිය සොයා බලා ඒ අනුව ඇමතීම කළ යුතුයි. නොදන්නා කෙනෙකු එවන් පූජ්‍ය පක්ෂය වෙතින් ඔහු අමතන්නේ කෙසේද කියා විමසීම නමක්, තනතුරක් සඳහන් නොකර එවන් අයෙකු වෙත කරන ආමන්ත්‍රණයට වඩා යහපත්ය.

ගරු ජනාධිපතිතුමනි, ගරු ඇමතිතුමනි යනාදියත් ගරු තානාපතිවරයාණෙනි ලෙසත් කියා ඊට අනතුරුව ඔවුන්ගේ සම්පූර්ණ නම කීම සුදුසුය. ඇමෙරිකාවේ ජනාධිපතිවරයා හැඳින්වෙන්නේ ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපති සහ මුළු නම පසුව ඔහු හා කතා බහ කරද්දී ඔහුට මිස්ටර් ප්‍රසිඩන්ට් කියති. නුදුරු අනාගතයේදී අපි මිස් හෝ මිසිස් ප්‍රසිඩන්ට් කියන්න ට ද ඉඩ ඇත. ලාංකික නගරාධිපති මිස්ට, මිස්, හෝ මිසිස් මේයර් Mayor ලෙසින් හැඳින්වෙති. රටකින් රටකට වෙනස් ආමන්ත්‍රණ ගැන සොයා බලා කිව යුතුය.

මෙම පිළිවෙත් අමතක වූ අවස්ථාවක හමුවන අයගේ නම තනතුර කැමති ආකාරයකට ගෞරවයෙන් කියා හැඳින්වීම කිසිවක් නොකියා පැත්තකට ව උඩබලා සිටීමට වඩා වැදගත් ය.

# ලේනා දුන්නු කැකුළු දත



රමිතු බබා ගේ ගෙදර ට අදත් උදෙන් ම ඉර පායලා. කුරුල්ලන්ගේ කිචි බිචි සද්දෙ ගේ වටෙන් ම ඇහෙනවා.

''හා....... හා.... දැන් නැගිටින්න, අද ඉස්කෝලෙ යන්නේ නැද්ද?'' අම්මගෙ සද්දෙට රමිතු උඩ ගිහින් ඇහැරුණා. ඇඳෙන් බැස්ස රමිතු ජනේලය ළඟට ගියේ අදත් උදෙන් ම පේර ගහට ලේන්නු ඇවිත් ද බලන්න.

'අද එක ලේනයි ඉන්නේ.... අනෙක් අය තාම නිදි ඇති......' රමිතු බබා හිතුවා.

ඊට පස්සේ රමිතු ගියේ කණ්ණාඩිය ළඟට. එයාගෙ ගුරුතුමී දවසක් දා කියලා තියෙනවා උදේ නැගිට්ට ගමන් කණ්ණාඩිය ළඟට ගිහින් කණ්ණාඩියෙන් පේන බබා ට හිනා වෙන්න කියලා.

රමිතු හිනා වුණා - කණ්නාඩි බබත් හිනා වුණා.

හරිම වැඩක්... ඒ බබාගෙ කටේ තිබ්බ දතක් අඩුයි..... ඒ දත නැති නිසා කණ්නාඩි බබා හිනාවෙනකොට කට ඇතුලෙ ගල් ගුහාව-ක් වගේ කළුවරට පේනවා. රමිතුට හරි ම හිනා.

රමිතු නිකමට වගේ එයාගෙ දත් ටික අල්ලලා බැලුවා. එක තැනක හිඩසක්.

''අම්මා..... අම්මා...... මගේ දතක් වැටිලා.... මට නම් බෑ අද ඉස්කෝලෙ යන්න....

අනේ මගේ කිරි දත  
සුදුම සුදුයි කිරි දත  
කවුද ගත්තේ කිරි දත  
බඩ ඇතුලෙද කිරි දත

හරිම දුකෙන් හිටිය රමිතු බබා, අම්මගෙ බලකිරීම හින්ද ම ඉස්කෝලෙ ගියා.

''හායි....... හායි..... ඔයා අපිටත් කියන්නේ නැතුව ම පෙරහැරක් බලන්න ගියා ද? අලියෙක් පයින් ගැහුවා නේද ඔයාගෙ කටට.......''

''නෑ...... නෑ..... රමිතුට ඊයෙ අම්ම කන්න දීලා නෑ....... බඩගින්නට දත කාලා.....''

මේ වගේ එක එක විහිළු ඉවරයක් නෑ. රමිතු බබා ට හරිම දුකයි. එයාගෙ ඇස් දෙකේ කඳුළු පිරිලා.

රමිතුගෙ හොඳ ම යාළුවා කේෂර, රමිතු ට අනෙක් ළමයි විහිළු කරනවට කේෂර කැමති නෑ. මොක ද දන්නව ද, කේෂරගෙ ත් දතක් වැටිලා තිබුණ ටික කාලෙකට කළින්. ඒ දවස් වල මේ අය කේෂරටත් විහිළු කළා. ඉතින් කේෂර දන්නවා ඒ වෙලාවට ගොඩක් දුක හිතෙනවා කියලා.

''රමිතු ඔයා ගණන් ගන්න එපා, ඒ අය විහිළු කළා ට. අපේ අම්මා කිව්වා, හැම පොඩි ළමයෙක්ගෙ ම දත් වැටෙනවා කියලා, ඊට පස්සෙලු ලස්සන දත් එන්නෙ කියලා. මේ බලන්න මටත් ලස්සන දතක් ආවා, වැටුණු දත පොඩ්ඩක් කළු වෙලා තිබ්බෙණෙ. අලුතින් ආපු දත කිරි ම කිරි පාටයි..... රමිතු..... බලන්න මගේ දත ලස්සනයි නේ ද?''

''අනේ කේෂර ඔයාට කොහොම ද අලුත් දතක් ආවේ.......?''

''එක දවසක් මම පේර ගෙඩියක් කන කොට දත ගැලවිලා වැටුණා. ඊට පස්සේ මම දතත් අරගෙන ගිහින් අම්මට පෙන්නුවා, අම්මා කිව්වා  
ලේනෝ..... ලේනෝ  
මේ දත අරගෙන  
කැකුළු දතක්  
මට දියෝ...... කියලා කියන ගමන් වහලෙට දත විසි කරන්න කියලා. ඉතින් මම එහෙම කළා......''

''එදා හරිම වැඩක් වුණේ..... දත වහලෙට විසි කළා විතරයි ලේනෙක් ඇවිල්ලා දත අරගෙන ගියා. ඊට පස්සෙ තමයි මට මේ දත ලැබුණෙ.''

''අනේ...... අනේ..... කේෂර මගේ දත කොහෙද කියලා මම දන්නෙ නෑ නේ....''

''එහෙනම් ඉතින් හැමදා ම ඔයාට ඔහොම තමයි ඉන්න වෙන්නේ......'' කේෂර රමිතුට කිව්වා.

ඉස්කෝලෙ ඇරිලා ගෙදර ආවා රමිතු, ඉස්කෝලෙ දි වෙච්ච හැමදේ ම අම්ම ට කිව්වා.

''පුතා ඔයාගෙ දත හොයාගන්න බැරි වුණා ට කමක් නෑ. ලියුමක් ලියලා අපි ඒක වහළෙ උඩින් තියමු. එතකොට ඒක කියවලා ලේනා පුතාටත් ලස්සන දතක් ගෙනල්ල දෙයි.....''

''ඔය ඇත්ත ද අම්මේ......'' රමිතු සතුටින් උඩ පැන්නා......

පේර ගහේ ගෙඩි කෑවා ඔයා මගේ ටිං ටිං ටිං  
වහළෙ දිගේ දුව පැන්නා ඔයා මගේ ටිං ටිං ටිං  
අත්තෙන් අත්තට පනිමින් සද්දෙ කළා ටිං ටිං ටිං  
මං ඔයාව පැන්නුවෙ නෑ ඔයා මගේ ටිං ටිං ටිං

එදා උදේ මං දක්කා දතක් වැටිලා ටිං ටිං ටිං  
එදා ඉඳන් මං ඉන්නේ හරිම දුකින් ටිං ටිං ටිං  
සුරංගනාවී ගෙනිහින් මගෙ කිරි දත ටිං ටිං ටිං  
කැකුළු දතක් මටත් දෙන්න ඔයා මගේ ටිං ටිං ටිං


දවස් ගානක් ගෙවිලා ගියා, ලේනා තාමත් ලියුම කියවලා නැද්ද දන්නෙ නෑ.

''අම්මා.... අම්මා......, තාම මගේ දත ලැබුණෙ නෑ, ලේනට ලියුම හම්බ වුණේ නැද්ද දන්නෙ නෑ.''

''මට කියන්න අමතක වුණා නේ, ඊයෙ හවස පේර ගහේ ඉඳලා ලේනා මට කිව්වා රමිතු ගේ වැඩේ හරි කියලා.... කෝකටත් ඔයා කණ්නාඩිය ළඟට ගිහින් බලන්නකෝ.........'' අම්මා කිව්වා.

''ආනේ....... අලුත් දත ඇවිල්ලා..... සුදු ම සුදු යි'' රමිතු සතුටින් උඩ පැන්නා.


**ලියන්නේ - දේවිකා නැන්දා**




**නැව් කීයද බලා වරෙන්**  
නිම්සර බිනෝන් පෙරේරා  
ශා. පීතර විදුහල - කොළඹ



**මුහුදු වෙරළ**  
තරින් සන්දින තලේවෙල - 2 වසර  
ශා. මරියා විදුහල - වේයන්ගොඩ



**රන්වන් පාටයි සමනලයා**  
චතුරි සෙව්වන්දි අතපත්තු - 1 වසර  
අනුලා විදුහල



**ඇත් පැටවා**  
ශිෂාන් ට්‍රිනිටි කෝදාගොඩ - 3 වසර  
දකුණු ජාත්‍යන්තර පාසල - මීගමුව


## රූපවාහිනිය නිපදවීම

19 වන සියවසේ දී චංචල වන දර්ශන ඈත ප්‍රදේශයක සිට තවත් ප්‍රදේශයකට විද්‍යුත් කාන්දම් තරංග මගින් පෙන්වීම පිළිබඳ සාකච්ඡා කෙරිණ.

ක්‍රි.ව. 1924 දී රුසියානු - ඇමරිකානු ජාතික ව්ලැඩිමීර් කොස්මා විසින් ඉකොනෙස්කෝප් සොයා ගැනීම රූපවාහිනිය සොයා ගැනීම ට වැදගත් වි ය. අද රූපවාහිනි යන්ත්‍රය තුළ ඇති ටියුබය මෙම ඉකොනෙස්කොප් හි සෘජු වර්ධනයකි.

විවිධ අංශ මගින් නොයෙක් විද්‍යාඥයින් පර්යේෂණ හා විවිධ යන්ත්‍ර ඉදිරිපත් කළත් ප්‍රථම ප්‍රායෝගික රූපවාහිනිය නිපද වූයේ ස්කොට් ජාතික ඉංජිනේරු-වෙක් වන ජෝන් ලොගී බෙයාර්ඩ් (1888-1946) ය. 1923 දී ඔහු ඒ සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගති.

මහා බ්‍රිතාන්‍යයේ ප්‍රථම වරට ජනතාව



සඳහා එම රූපවාහිනියෙන් දර්ශන පෙන්වීම ක්‍රි.ව. 1926 දී සිදු කෙරුණි.

වර්ෂ 1928 දි කෙටි තරංග උපයෝගී කර ගෙන බෙයාර්ඩ් විසින් ප්‍රථම ජාත්‍යන්තර රූපවාහිනී විනාශයනයක් පවත්වන ලදී.

වර්ෂ 1930 දී බෙයාර්ඩ් ගේ වැඩි දියුණු කළ රූපවාහිනිය වාණිජ ලොවට පැමිණි පසු බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සංස්ථාවෙන් (බී.බී.සී.) රූපවාහිනි වැඩසටහන් විකාශය කරන ලදී. 1925 දී ප්‍රංශයේ අයිෆල් කුළුණ මුදුනේ රූපවාහිනී විකාශනාගාරයක් ඇරඹී ය. 40 දශකය අග භාගයත්, 50 දශකය මුල පමණ වන තෙක් ගෘහස්ථ රූපවාහිනිය ජනප්‍රිය නොවුණේ දෙවන ලෝක යුද්ධය නිසා යි.


ප්‍රථම වර්ණ රූපවාහිනිය වර්ෂ 1960 දි නිපදවුණ අතර, 1968 දී නියම වර්න සහිත රූපවාහිනිය ජපානයේ සෝනි ආයතනය මගින් නිපදවන ලදී. අද රූපවාහිනිය ලොව පුරා ක්ෂණිකව තොරතුරු ලබා දෙන මාධ්‍යයක් බව ට ද පත්ව ඇත.

## සිංහල අවුරුද්ද

එක පැත්තකින් රබන් හඬ. තවත් පැත්තකින් කොහාගේ කොහෝ... කොහෝ... හඬ. කැවුම් කොකිස් බැදෙන සුවඳින් මුළු ගමම නැහැවෙලා. එරබදු ගස් රතට රතේ මල් පිරිලා. හරිම ලස්සනයි. පුංචි අපිට සෙල්ලම් නිවාඩුවක් ඇවිල්ලා වගේ. අලුත් ඇදුම් ඇඳගෙන නෑගම් යන්නට, අවුරුදු උත්සව බලන්න යන්නට, ඔංචිලි, පංච, කැට, ගුඩු වගේ අපටම වෙන්වුණු කෙළි සෙල්ලම් කරන්නට, වැඩිහිටියන්ට ගරු කරන්න, නැකතට වැඩ කරන්නට, හැමෝම එක්ක සහයෝගයෙන් කටයුතු කරන්න සිංහල අවුරුද්ද අපට උගන්වනවා.

නොනගතය ලබනකොට ගෙදර අපි හැමෝම එකතුවෙලා පන්සල් යනවා. බුදුන් වැදල හැමදෙනාටම සුභ ප්‍රාර්ථනා කරනවා. ඊට පස්සේ අම්ම ගෙදර ඇවිත් නැකතට ගිනි මොලවල කිරි උතුරවලා කිරිබත් හදනවා. අයියයි මමයි කිරි උතුරන හැටි බලාගෙන ඉන්නෙ හරිම ආශාවෙන්. අවුරුදු නැකත උදා වූවාට පස්සෙ තාත්තා හැමෝටම කිරිබත් කවලා අවුරුද්දට සුභ පතනවා. ගණුදෙනු කරන මාමා ආවාට පස්සෙ අපිට බුලත් කොළ වල ඔතලා පඩුරු ලැබෙනවා. හැමදාම වැඩිපුර ලැබෙන්නෙ මට. හැමදාම අවුරුදු නම් මං හරි ආසයි.

**සංචිත මහගොඩගේ**



සත්වයන් අතර හීලෑ කර ගැනීමට අමාරුම සත්වයා පිරිම දරුවා ය. - ප්ලේටෝ

# කැරම් ක්‍රීඩාවෙන්
## ලොව එකළු කළ
# අපේ ශූරයෝ



ඔවුන් වරායට කීර්තිය ගෙන ආවේ ලෝකයෙන්ම පළමු වැනියන් හා දෙවැනියන් වෙමිනි. වරායේ කැරම් රැජිණ ලෙසින් අභිෂේක ලැබූ අමිතා වික්‍රමසිංහ හා ලෝක කැරම් ශූරතාවය දිනා ගැනීමට පණ පෙවූ විරාජ් ප්‍රනාන්දු නම් වූ ඔවුන් පිළිබඳ තීර්ථ ස්වකීය භක්ති ප්‍රණාමය පුදකරමින් ඔවුන් කෙළි බිම ජය දද නැංවූ අයුරු පිළිබඳ කළ විමසුමකි මේ....

<u>කැරම් ලෝක ශූරතාවය දිනා ගැනීමෙ සතුට ගැන මොකද හිතන්නේ..?</u>

**විරාජ්** - ඇත්තටම ශ්‍රී ලංකාවේ පළමු වතාවටයි ලෝක ශූරතාවය දිනාගැනීමට භාග්‍ය ලැබුවේ. මේක සමස්ත ශ්‍රී ලාංකිකයන්ට ම සතුටු විය හැකි අවස්ථාවක්. මීට පෙර අප ලෝක කැරම් අනුශූරතාවය දිනාගෙන තිබුණා. මෙවර පුහුණු වීම් වලදී පවා අපිට හොඳ අධිෂ්ඨානයක් තිබුණා, ලෝක ශූරතාවය දිනා ගැනීම පිළිබඳව. අපිට එහි නිසි ඵල නෙලා ගැනීමට හැකිවුණායි කියා කියන්න පිළිවන්.

**අමිතා** - ඇත්තටම ගොඩාක් සන්තෝෂයි. ශ්‍රී ලාංකික නියෝජනය තුළින් අනුශූරතාවය කරා ඒමට කාන්තා කැරම් කණ්ඩායමට හැකිවුණා. ඒ පිළිබඳව බොහෝම තෘප්තිමත්.

<u>කැරම් ක්‍රීඩාවට තවමත් ලංකාවේ පවතින්නේ ඇල්මැරුණු ස්වභාවයක්. කුමක්ද මෙයට හේතුව?</u>

**විරාජ්** - කැරම් ක්‍රීඩාව ලංකාවේ බොහෝ දෙනෙකු ක්‍රීඩා කරනවා. නමුත් බොහෝ දෙනෙකු ක්‍රීඩාවේ විනය නීති රීති පිළිබඳව දැනුවත් වීමකින් තොරව ඔවුන්ට රිසි ලෙසින්



ක්‍රීඩාව උපයෝජනය කරනවා. නමුත් කැරම් ක්‍රීඩාව සඳහා එයට ආවේණික නීති රීති රැසක් තිබෙනවා. ඒවා නිසි ලෙස ව්‍යාප්ත නොවීම තමයි මෙයට හේතුවෙලා තිබෙන්නේ. ඒ වගේම තරග සඳහා ඉදිරිපත් වීම තවම සැලකිය යුතු මට්ටමක නැහැ.

<u>කැරම් ක්‍රීඩාවට කාන්තා නියෝජනය බොහෝ අල්ප බවත් ක්‍රීඩාවක් ලෙස බොහෝ දෙනා මෙයට යොමු වී නැති බවත් පවසනවා.</u>

**අමිතා** - නැහැ. එහෙම කියන්න බැහැ. අද වන විට හොඳ කාන්තා නියෝජනයක් තිබෙනවා. කැරම් ලෝක අනුශූරතාවය දිනාගත් කාන්තා පිල නියෝජනය කළ කණ්ඩායමේ පාසැල් ශිෂ්‍යාවක් ද සිටිනවා. පාසැල් ක්‍රීඩිකාවන් කැරම් සඳහා විශේෂ උනන්දුවක් දක්වනවා. හෙට දවසේ තත්වය වඩාත් පැහැබර වේවි.

<u>ඔබලාගේ ක්‍රීඩා දිවියට වරායෙන් ලැබෙන සහයෝගය ගැන කථා කළොත්..</u>

**විරාජ්** - ඇත්තටම වරාය අධිකාරියෙන් අපිට හොඳ සහයෝගයක් ලැබෙනවා. පුහුණුවීම් සඳහා රාජකාරි නිවාඩු, විදේශ ගතවීමේදී ගමන් වියදම්, බලපත්‍ර ආදිය ලබාදෙනවා. ඒ ගැන කෘතඥ විය යුතුයි. නමුත් ලෝක ශූරතාවය දිනාගෙන ආවට පසු ක්‍රීඩා සමාජයෙන් මට ලක්ෂ 2ක මුදලක් ලැබුණා. ලෝක කැරම් ක්‍රීඩා කණ්ඩායමේ සෙසු සගයන්ට ලැබුණු මුදල් ත්‍යාග හා වරප්‍රසාද දෙස බලන කොට සෑහීමකට පත්වෙන්න බැහැ. නමුත් අනාගතයේ හෝ නිසි ඇගයීමක් ලැබෙයි කියා බලාපොරොත්තු වෙනවා.

**අමිතා** - විරාජ් කිව්ව වගේම පුහුණුවීම් සඳහා රාජකාරි නිවාඩු, විදේශගතවීමේදී ගමන් වියදම් බලපත්‍ර ආදිය ලබාදීම ගැන අපි බලාපොරොත්තු වෙනවා අපට විශේෂ වරප්‍රසාදයක් හිමිවෙයි කියා. ලෝක කුසලානයේ ජයග්‍රහණය වෙනුවෙන්.

<u>කැරම් ක්‍රීඩාවට යොමු වූ ආකාරය සිහිපත් කළොත්...</u>

**විරාජ්** - මං පාසැල් වියේ පටන්ම කැරම් ක්‍රීඩාවට ඇල්මක් දක්වූවා. මගේ සොයුරාගේ මග පෙන්වීම මට ලැබුණා. 1979 දී මම තරගයකට ඉදිරිපත් වුණේ එදා මං ජයග්‍රහණය කළා. ඒ ආපු ගමන තමයි මේ ජයග්‍රහණ මැදින් ගලා යන්නේ. මෙහිදී මගේ පුහුණුකරු රංජන් ප්‍රනාන්දු මහතා විශේෂයෙන් සිහිපත් කළ යුතුයි.

**අමිතා** - මගේ මවත් ජාතික කැරම් ශූරියක්. ඇගේ ආශිර්වාදය හා මග පෙන්වීම තමයි මාව මේ ලෙසින් ක්‍රීඩාවට යොමු කළේ.

<u>ඔබ දෙපල ආ මග දෙස ආපසු හැරී බැලුවොත් මොකද හිතෙන්නේ?</u>

**විරාජ්** - මට හරිම සන්තෝෂයි. ක්‍රීඩා කෞශල්‍යය පිළිබඳව. මොකද මම 79 සිට අද දක්වාම ජාතික මට්ටමේ රැඳී සිටීමට හැකිවීම ගැන.

**අමිතා** - ගොඩාක් සතුටුයි. ජනසතු සේවා තරගවලදී අප දෙදෙනාම කැරම් ශූරයා/ශූරිය ලෙසින් ජයග්‍රහණ රැසක් ලබා තවමත් අප අපේ කිරුළු පවත්වා ගෙන යනවා. මගේ සැමියා කරුණාරත්න ජයසිංහ මහතාගෙනුත් මට හොඳ සහායක් ලැබෙනවා. 1979 කැරම් ඉන්දීය ජාතික ශූරතාවය හිමිකර ගැනීමට 1991 කැරම් කේවල ලෝක ශූරතාවය තෙවන ස්ථානය, 1995 කණ්ඩායම් අනුශූරතාවය කේවල සිව්වන ස්ථානය, 99 ඉන්දියාවේ පැවති කැරම් ලෝක ශූරතාවයේදී කේවල සිව්වන ස්ථානය හා මෙවර ලෝක අනුශූරතාවයට (කණ්ඩායමේ) හිමිකම් කියන්නට හැකිවීම ක්‍රීඩාව සඳහා මගේ ඇති කැපවීම හා දක්ෂතාවය පෙන්නුම් කරන බැව් මට පසක් කර දී තිබෙනවා.

<u>වරායේ කැරම් ක්‍රීඩාවේ හෙට දවස ගැන කථා කළොත්...</u>

**විරාජ්** - ඇත්තටම කියන්න කණගාටුයි. අළුතෙන් ක්‍රීඩාවට යොමුවන පිරිස බොහෝ





හෙවින්ම ස්තුති වන්ත වෙනවා. නමුත් අපි ලෝක ශූරතාවය හා අනුශූරතාවයට දායක වූ වරායේ සේවයේ නියුතු ක්‍රීඩක ක්‍රීඩිකාවන් බව අමතක නොකළ යුතුයි. ශූරතාවයට ගැලපෙන පරිදි ඇගයීමක් ලැබුණේ නැහැ කියා සිතෙනවා.

<u>ඔබ දෙපලට සහ බිලියඩ් ශූර සිරිසෝම මහතාට උසස්වීම් ලබාදීමට සූදානම් බවට ක්‍රීඩා ආරංචි මාර්ග වලින් කසු කුසුවක් පැතිරිලා...</u>

**විරාජ්** - තවම ඒ ගැන හරියට දන්නෙ නැහැ. නමුත් ඒ බවට කසු කුසුවක් නම් පැතිරිලා තියෙනවා. අපි ඉතින්



අඩුයි. ක්‍රීඩා කිරීමේදී රාජකාරි නිවාඩු ලබාගැනීමට සිදුවීමත් එක්ක අතිකාල සේවාව සඳහා කාලය උපයෝජනයේ ගැටළු පවතිනවා. මේ නිසා අද බොහෝ දෙනෙක් ක්‍රීඩාවට යොමුවීමට අපහසුයි. අපි මේ තත්වයට ආවේ අවු. 22ක් කැපවීම් කරලා. අතිකාල පවා කැප කරලයි මේ තත්වයට ආවේ. වත්මන් පරපුරේ ඒ හැඟීම නැහැ කියලයි මට හිතෙන්නේ.

එලදායීතාවය හා මුසු වූ වරාය අධිකාරියේ මාසික පුවත් කවුළුව



ප්‍රධාන ගිනි නිවන නිළධාරී
**එස්.ඒ.ආර්. ජයතිලක**

ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සෑම වරායයක් ම තම මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ගිනි හා නිරාපද (Fire & Safety) කටයුතු ගැන විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

# වරායේ ගිනි නිවන්නේ මෙහෙමයි....

ශ්‍රී ලංකා වරාය අධිකාරිය වැනි ආයතනයකට තම මානව සම්පත, වරාය භාවිතා කරන්නන් හා අනෙකුත් සම්පත් ආරක්ෂා කර ගැනීම කොතරම් වැදගත්දැයි නොකිවමනා ය. එමෙන් ම ලෝකයේ ප්‍රමුඛ පෙළේ නැව් සමාගම් මෑතක සිට තමන් ට අයත් නෞකා සේන්දු වන වරායයන් වල ආරක්ෂාව පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වීඹට පටන් ගෙන ඇත. රක්ෂණ සමාගම් ද එසේ ම ය.

මෙසේ බලන කළ වරායයකට ගිනි නිවන හමුදාවක සේවය අත්‍යවශ්‍ය බව කිව හැකි ය. වර්ෂ 1945ට පෙර වරාය ගිනි ආරක්ෂාව පිළිබඳ කටයුතු කරන ලද්දේ Auxiliary Fire Service මගිනි. වරාය ගිනි නිවන හමුදාවේ ආරම්භය සනිටුහන් වන්නේ 1945 අගෝස්තු 01 දින යි. වරාය ගිනි නිවන හමුදාවේ පළමුවන අධිකාරී ලෙස පත්ව ඇත්තේ (Fire Suprintendent) ඒ.ඩබ්ලිව්. මුසාපර් මහතායි. එයින් පසු අධිකාරීවරුන් හතර දෙනෙක් සහ ප්‍රධාන ගිනි නිවන නිළධාරීවරුන් තිදෙනෙක් යටතේ පාලනය වී ඇති වරාය ගිනි නිවන හමුදාව වර්තමාන ප්‍රධාන ගිනි නිවන නිළධාරී එස්.ඒ.ආර්. ජයතිලක මහතා යටතේ පාළනය වේ. වරාය ගිනි නිවන හමුදාව නාවික කොට්ඨාශයට අයත් අංශයක් වන අතර, කොට්ඨාශ ප්‍රධානී ලෙස කපිතාන් ආර්.ඒ. ජයවික්‍රම මහතාත්, නියෝජ්‍ය ප්‍රධානී ලෙස කපිතාන් අතුල හේවාවිතාරණ මහතාත් කටයුතු කරයි.

වරාය ගිනි නිවන හමුදාවේ පර්මාර්ථය වී ඇත්තේ 'විය හැකි ව්‍යසනයන් වැළැක්වීම හා පාළනය කිරීම, සිදුවන ව්‍යසනයන්ගෙන් ඇතිවන හානිය අවම කර ගැනීම හා පරිසරය සුරැකීම තුළින් වඩාත් ආරක්ෂාකාරී වරයයක් බිහි කිරීම සඳහා උපරිම දායකත්ව දීම' යි.

වරායේ ගිනි නිවන හමුදාවේ සේවක සංඛ්‍යාව 169කින් සමන්විත විය යුතු වුවත්, දැනට සේවය කරන්නේ සේවක මහතුන් 117ක් පමණි.

වරාය ගිනි නිවන හමුදාව මගින් ඉටු කරන ප්‍රධාන සේවාවන් අතර,

01. ගිනි හා හදිසි ගිනි මැඩ පැවැත්වීම
02. ගිනි හා අනෙකුත් හදිසි අවස්ථා ඇති වීම වැළැක්වීමට පියවර ගැනීම
03. වරායේ විවිධ ස්ථාන වල සමීපස්ථ සේවා (ගෑස් නෞකා, තෙල් නෞකා, පැස්සුම් කටයුතු, අන්තරාදායක නැව් බඩු සඳහා)
04. මුහුදු පරිසරයට තෙල් ඇතුල්වීමෙන් ඇති වන පරිසර හානිය අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.
05. ජාතික ආපදාවක දී අනෙකුත් ගිනි නිවන සේවා හා ඒකාබද්ධව කටයුතු කිරීම.
06. ගාල්ල, ත්‍රිකුණාමලය, ඔලුවිල් හම්බන්තොට වැනි සංවර්ධනය වෙමින් පවතින වරයයන් වල ගිනි ආරක්ෂණ හා නිරාපාද කටයුතු පවත්වාගෙන යාම.

**01. ගිනි නිවීමේ උපකරණ**

ගිනි නිවීම හා හදිසි අවස්ථා පාළනය සඳහා උපයෝගී කරගන්නා නවීන අංගෝපාංග යන්ගෙන් සමන්විත ගිනි නිවන රථයක් සහ ජල බවුසරයක් වරාය ගිනි නිවන හමුදාව සතු ය.

රථ වාහන අනතුරු වල දී පුද්ගලයන් බේරා ගැනීම සඳහා උපයෝගී කර ගන්නා හයිඩ්‍රොලික් උපකරණ පද්ධතියට අයත් ස්ප්‍රේඩර්, කටර්, හයිඩ්‍රොලික් ජැක්, පවර් සෝ, චේන් හුක් වැනි විවිධ උපකරණ මගින් වාහන අනතුරක දී සිර වී සිටින පුද්ගලයන් තවදුරටත් හානි වීම වලක්වා ආරක්ෂිතව ඔවුන් ඉවත් කිරීම කල හැකි ය.

**<u>එයාර් බෑග් සිස්ටම්</u>**

මෙම උපකරණය සුලං පීඩනය මගින් ක්‍රියාත්මක කරන අතර යම් ද්‍රව්‍යයකට යටවී සිටින පුද්ගලයෙක් බේරා ගැනීම මේ මගින් කළ හැකි ය.

උදාහරණ වශයෙන් බිත්ති කඩා වැටීම්, කොන්ක්‍රීට් ස්ලැබ් කඩා වැටීම්, වාහන පෙරලීම් ආදියෙන් ආපදාවට ලක්වන පුද්ගලයන් ව බේරා ගැනීම කළ හැකි ය. මේ මගින් ටොන් 23ක බරක් වුව ද පහසුවෙන් එසවිය හැකි ය.

**<u>ලීක් සීලින් සිස්ටම්</u>**

හදිසි පිපිරුමක් මගින් තෙල් නලයක් හෝ රසායනික ද්‍රව්‍ය ගෙන යන ටැංකියක කාන්දුවක් ඇති වුවහොත් මෙම උපකරණ පද්ධතිය මගින් එම කාන්දුව සීල් කිරීමට කටයුතු කළ හැකි ය.

**<u>රසායනික ද්‍රව්‍ය කාන්දුවීම් වලට මුහුණ දීම</u>**

දැනට රසායනික ද්‍රව්‍ය වැඩි වශයෙන් ප්‍රවාහනය කෙරෙන්නේ නැව් මගිනි. ඒ නිසා වරාය වැඩි වැඩියෙන් රසායනික ද්‍රව්‍ය අනතුරකට මුහුණ දීමේ අවකාශ තිබේ. ඇති විය හැකි තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ගිනි නිවන හමුදා බටයින්ට පෙර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, ඒ සඳහා අවශ්‍ය උපකරණ ද ලබා දී තිබේ. මේ පිළිබඳ වැඩි දුර පුහුණු අවස්ථා ලබා දීම ට දැනට කටයුතු කරමින් පවතී.

තෙල් මගින් මුහුදු පරිසරය හානිවීම

13 වන පිටුවට...



















පන්නිපිටිය, පැලැන්වත්ත, මහවත්ත පාරේ, අංක 173/ඒ හි පිහිටි 'ක්‍රියේටිව් බ්‍රෂ්' මුද්‍රණාලය මගින් මුද්‍රණය කරවා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය මගින් ප්‍රසිද්ධ කරන ලදි.